අපගේ ව්‍යාපාර චර්යා ධර්ම සංග්‍රහය ("Code of Business Conduct").

TESCO

අන්තර්ගතය

පිටුව

Section 1: අපගේ ව්‍යාපාර චර්යා ධර්ම සංග්‍රහය ("COBC")

- කෙන් මර්ෆි සමූහයේ ප්‍රධාන විධායකගේ පණිවිඩය 3
- චර්යා සංග්‍රහයට අනුව ජීවත්වීම 5
- මට හඬ අවදි කළ හැක්කේ කෙසේද? 6
- සමූහය පුරා (Protector Line) සබඳතා 7

Section 2: චර්යා සංග්‍රහය මාර්ගෝපදේශය

අපගේ ගනුදෙනුකරුවන් රැක බලා ගැනීම

- පැහැදිලි මිල ගණන් සහ අලෙවිකරණය 12
- ආහාර සහ නිෂ්පාදන ප්‍රමිති 14
- පාරිභෝගිකයින් සහ සාමාජිකයන්ගේ දත්ත ආරක්ෂා කිරීම 16

එක්ව කටයුතු කිරීම

- සෞඛ්‍යය සහ ආරක්ෂාව 20
- සමාන අවස්ථා, අන්තර්ග්‍රහණය සහ විවිධත්වය 22
- ගෞරවය, ගරුත්වය සහ සාධාරණ ලෙස සැලකීම 24

පිටුව

සාධාරණ වෙළඳාම

- තරඟ නීති 28
- සම්බාධක සහ අපනයන පාලන 30
- මානව හිමිකම් සහ සදාචාර සම්පන්න වෙළඳාම 32
- සැපයුම්කරුවන් ආරක්ෂා කරන නීති 34
- වෙළඳ නාම සහ බුද්ධිමය දේපල 36

අපගේ කීර්තිය ආරක්ෂා කිරීම

- වංචාව 40
- අල්ලස් 42
- ත්‍යාග සහ විනෝදාශ්වාදය 44
- බැඳියා පිළිගැටුම් 46
- පුණ්‍යාධාර 48
- අභ්‍යන්තර ගනුදෙනු සහ වෙළඳපල අයථා භාවිතය 50
- දේශපාලන කටයුත්තක නිරත වීම 52
- නිවැරදි ගිණුම්කරණය සහ මුදල් විශුද්ධිකරණය 54
- අපගේ තොරතුරු ආරක්ෂිතව තබා ගැනීම 56
- බාහිර සන්නිවේදන සහ සමාජ මාධ්‍ය භාවිතා කිරීම 58

අපේ අගයන් 60

අපගේ නායකත්ව හැසිරීම් 61

කෙන් මර්ෆි සමූහයේ ප්‍රධාන විධායකගේ පණිවිඩය

අපගේ ව්‍යාපාර චර්යා ධර්ම සංග්‍රහය ("COBC") අපගේ ව්‍යාපාරය පවත්වාගෙන යන ආකාරයෙහි හදවත වන අතර එය නිර්මාණය කර ඇත්තේ අපට උදව් කිරීමට සහ අප ආරක්ෂා කිරීමට ය. අප විසින් අනුගමනය කළ යුතු රීති අප සැවොම වටහා ගැනීම වැදගත් වන අතර, අපගේ සාමාජිකයන් රැකබලා ගැනීම සඳහා අපෙන් අපේක්ෂා කරන හැසිරීම, ගනුදෙනුකරුවන් සහ අපගේ කීර්තිය ආරක්ෂා කිරීම වෙනුවෙන් විශාල කාර්යයක් ඉටු කරයි.

ඔබ ටෙස්කෝ වෙත නවකයෙකු වුවත් නැතිනම් අපගේ ව්‍යාපාරය සඳහා යම් කාලයක් සේවය කර ඇතත්, කරුණාකර අපගේ චර්යා සංග්‍රහය ය සහ එය ඔබට අදාළ වන ආකාරය තේරුම් ගැනීමට කාලය යොදවන්න.

අපගේ චර්යා සංග්‍රහයෙන් නීතිය සහ අපගේ ප්‍රතිපත්ති අනුගමනය කිරීමට වඩා වැඩි යමක් අදහස් කෙරේ. එය අපගේ හැසිරීම සහ තීරණ ගැනීම සඳහා මග පෙන්වීම සඳහා අපගේ සාරධර්ම සහ නායකත්ව හැසිරීම් භාවිතා කිරීම හා සම්බන්ධ වන අතර එවිට අපි එකිනෙකාට සහ ව්‍යාපාරයට සැමවිටම නිවැරදි දේ කරන්නෙමු.

ඔබේ හැසිරීම හෝ වෙනත් පුද්ගලයෙකුගේ හැසිරීම ඔබට කවදා හෝ ගැටළුවක් ඇත්නම්, ඔබ ඔබේ කළමනාකරුගෙන් පටන් ගෙන සෘජුවම කතා කර ඔබ විශ්වාස කරන කෙනෙකු සමග කතා කළ යුතුය. විකල්පයක් ලෙස, ඔබේ පිරිස් කළමනාකරණ සහකරු හෝ නීති කණ්ඩායමට කතා කරන්න. ඔබට ඔබගේ ගැටළුව නිර්ණාමිකව ඉදිරිපත් කිරීමට අවශ්‍ය නම්, ඔබට පූර්ණ විශ්වාසයකින් යුතුව (Protector Line) ඇමතිය හැකිය.

අපගේ ව්‍යාපාරය හා අප විසින් දෙන දායකත්වය පිළිබඳව අප සැවොම ආඩම්බර විය යුතු අතර අපගේ චර්යා සංග්‍රහය අනුව ජීවත් වීමෙන් අපට අනාගතය සඳහා වඩා ශක්තිමත් වෙළෙඳාමක් ගොඩනගා ගත හැකිය.

කෙන් මර්ෆි,
සමූහයේ ප්‍රධාන විධායක

TESCO
Fruit and Veg

චර්යා සංග්‍රහයට අනුව ජීවත්වීම

අපි සියලු සාමාජිකයන්ගේ බලාපොරොත්තු වන්නේ:

- චර්යා සංග්‍රහය සහ එයට පිවිසෙන අකාරය දැනගැනීම;
- 8-59 දක්වා පිටුවල අඩංගු චර්යා සංග්‍රහ මාර්ගෝපදේශය පිළිපැදිම. චර්යා සංග්‍රහ මාර්ගෝපදේශයමගින් කියවිය යුතු ප්‍රතිපත්ති සහ ඔබට ප්‍රශ්න ඇත්නම් කතා කළ යුත්තේ කා සමගද යන්න ඇතුළුව ඔබේ රැකියාවේදී ඔබට මුහුණ දීමට සිදුවිය හැකි ප්‍රධාන අවදානම් 21 කට අදාළව උපදෙස් සහ උපකාර ලබා දෙයි;
- චර්යා සංග්‍රහ පුහුණුව සම්පූර්ණ කරන්න, එවිට ඔබට සංකීර්ණ ගැටළු සම්බන්ධව කටයුතු කිරීම පහසු වනු ඇත;
- කුමක් කළ යුතු දැයි ඔබට විශ්වාස නැත්නම් උපකාර ඉල්ලන්න;
- ඔබ "කුමක්" කලත් ඔබ යමක් කරන "ආකාරය" සැමවිටම සලකා බලන්න (පිටුව 61 බලන්න); සහ
- චර්යා සංග්‍රහය කැඩී ඇතැයි හෝ අපගේ වටිනාකම් අඩපණ කර ඇතැයි ඔබට යම් අවස්ථාවක සිතෙන්නේ නම් හඬ අවදි කරන්න.

ඔබ අන් අයව කළමනාකරණය කරන්නේ නම්, අපි ඔබගෙන් බලාපොරොත්තු වන්නේ:

- කණ්ඩායම් සාමාජිකයින්ට ඔවුන්ගේ රාජකාරි සඳහා අවශ්‍ය කුසලතා සහ පුහුණුව ඇති බව තහවුරු කරගැනීම සහ ඔවුන්ව ආරක්ෂා කිරීම;
- ඵලදායී ලෙස අවදානම් කළමනාකරණය කිරීම සහ කිසිදාක නීතිවිරෝධී, සදාචාර විරෝධී හෝ සාමාජිකයන්, ගනුදෙනුකරුවන්, අපගේ වෙළඳ නාමය හෝ සමාජයේ අප සමග වැඩ කරන කොටස්කරුවන්ට හානියක් හෝ ආපදාවක් කළ හැකි ඒවා ඇතුළු අනවශ්‍ය අවදානම් නොගැනීම සහ එවැන්නක් ගන්නා ලෙස අන් අයට නොපැවසීම;
- චර්යා සංග්‍රහ ගැටළු සම්බන්ධයෙන් දෘශ්‍ය හා ස්ථාවර නායකත්වයක් සැපයීම;
- සාරධර්ම පෙරදැරි කරගත් හැසිරීමක් ප්‍රතිඵලය කිරීම සහ ඔබේ කණ්ඩායම් තුළ නිමග්න සහ අවංක සංස්කෘතියක් පෝෂණය කිරීම; සහ
- සදාචාර විරෝධී හැසිරීම්වලට නිදැල්ලේ පැවතීමට ඉඩ නොදීම සහ ඔබ වැරැදි වැඩක් හඳුනා ගන්නේ නම් හෝ අන් අය විසින් එවැන්නක් ඔබේ අවධානයට යොමු කරනු ලැබුවහොත් ඒ සම්බන්ධව ක්‍රියා මාර්ගයක්ගැනීම.

මට හඬ අවදි කළ හැක්කේ කෙසේද?

මම කතා කළ යුත්තේ කාටද?

- අප කරන සෑම දෙයක දී ම, ඔබගේ කළමනාකරු සමග සැමවිටම විවෘත සහ අවංක සම්බන්ධතාවයක් පවත්වා ගැනීම වැදගත් වේ.
- මෙයින් අදහස් වන්නේ ඔබගේ කළමනාකරු විසින් චර්යා සංග්‍රහය උල්ලංඝනය කර නොමැති බව ඔබ සිතන්නේ නම්, ඔබ පළමුව කතා කළ යුතු තැනැත්තා ඔහු හෝ ඇය බවයි.
- ඔබට ඔබේ කළමනාකරු සමග කතා කළ නොහැකි නම්, ඔබට ඔබේ පිරිස් කළමනාකරණ කණ්ඩායම, ඔබේ දේශීය නීති අධ්‍යක්ෂවරයා හෝ ඔබේ දේශීය ආරක්ෂක අධ්‍යක්ෂවරයා සමග කතා කළ හැකිය.
- විකල්පයක් ලෙස, ඔබේ කළමනාකරු ඔබේ ගැටළු විසඳා නොමැති නම්, ඔබේම ව්‍යාපාර කටයුත්ත තුළම ඔබට ඔබේ ගැටළුව ඉස්මතු කළ හැකිය.
- ඔබට ඔබගේ ගැටළුව සම්පූර්ණයෙන්ම රහසිගතව ඉදිරිපත් කිරීමට අවශ්‍ය නම්, ඔබට ඔබගේ දේශීය (Protector Line) ඇමතිය හැකිය.

මට තවත් දේ සොයාගත හැක්කේ කොතැනින්ද?

- විසිල් පිඹීමේ (whistle blowing) ප්‍රතිපත්තිය

අපගේ ආරක්ෂක පෙළ (Protector Line) පිළිබඳව

රැකියාවේදී සිදුවන වැරදි ක්‍රියා පිළිබඳ ඔබේ ගැටළු මතු කිරීමට (Protector Line) මගින් ඔබට ඉඩ සලසයි. ඔබට ඔබේ කළමනාකරු සමග හෝ පිරිස් කළමනාකරණ කණ්ඩායම සමග කතා කළ නොහැකි යැයි හැඟේ නම්, ඔබට (Protector Line) ඇමතීමෙන්:

- රැකියාවේ කටයුතු තුළ නීති විරෝධී විය හැකි යැයි ඔබ සිතන, චර්යා සංග්‍රහය උල්ලංඝනය කරන හෝ සමාගමේ ප්‍රතිපත්තියට පටහැනි යම් දෙයක් ඇත්නම් ඒ ගැන ඔබේ ගැටළුව ඉදිරිපත් කරන්න.
- සාමාජිකයන්ට, පාරිභෝගිකයන්ට හෝ සාමාන්‍ය සාමාජිකයන්ට අනතුරුදායක යැයි ඔබට සිතන ඕනෑම දෙයක් වාර්තා කරන්න.
- මෙම දේවල් පිළිබඳ තොරතුරු හිතාමතාම සඟවා ඇති බවට ඔබට ඇති ගැටළු ඕනෑම එකක් ඉදිරිපත් කරන්න.

(Protector Line) සම්පූර්ණයෙන්ම රහස්‍ය වන අතර එය ටෙස්කෝ සඳහා වන ස්වාධීන සමාගමක් විසින් ක්‍රියාත්මක කෙරේ. ඔබ ඇමතුමක් ලබා දෙන විට ඔබේ නම ලබා දිය යුතු නැති නමුත්, ඔබ එය ලබා දුනහොත්, විමර්ශනයක් සිදුවන විට එහි ප්‍රතිඵල පිළිබඳව ඔබව යාවත්කාලීන කිරීමට (Protector Line) කණ්ඩායමට හැකි වනු ඇති අතර අවශ්‍ය නම් අමතර තොරතුරු ලබාගැනීම සඳහා ඔබව සම්බන්ධ කර ගැනීමට ද හැකිවනු ඇත.

වෙළෙඳාමක් ලෙස අපි පැමිණිලිවල රහස්‍යභාවය ආරක්ෂා කරන 1998 එක්සත් රාජධානියේ ජන බැඳියා අනාවරණ පනතට (UK Public Interest Disclosure Act 1998) (සහ විදේශීයව පවතින ඊට සමාන නීතිවලට) සහය දෙමු. මෙයින් අදහස් කරන්නේ ඔබ සද්භාවයෙන් යුතුව කටයුතු කරන තාක් කල් සහ ඔබේ ගැටළු අව්‍යාජ නම්, ගැටළුවක් මතු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස - ඔබට වැරදිමක් සිදුවී තිබුණ ද ඔබව ගොදුරක් බවට පත්වීමෙන් නීත්‍යානුකූලව ආරක්ෂා කෙරෙන අතර, ඔබගේ රැකියාව අහිමිවීම ඇතුළුව කිසිදු ආකාරයක පලිගැනීමේ අවදානමකට ලක් නොවනු ඇත.

සමූහය පුරා (Protector Line) සබඳතා

රට	විද්‍යුත් තැපැල් ලිපිනය	දුරකථන අංකය
එක්සත් රාජධානිය	protectorline@expolink.co.uk	0800 374199
අයර්ලන්තය	tescoireland@expolink.co.uk	1800 567014
පෝලන්තය	bezpiecznaliniatesco@tesco.pl	0800 255 290
චෙක් ජනරජය	linka_ochrany@tesco-europe.com	800 114 477
ස්ලෝවැකියාව	etickalinka@tesco-europe.com	0800 188404
හංගේරියාව	hu_security@hu.tesco-europe.com	0680 33 00 22
ඉන්දියාව)ස්ටාර් බසාර්(	ethics.counsellor@trenthyper-tata.com	00 91 22 4974 2274
ටෙස්කෝ බැංගලූරු	protectorline.tescobengaluru@expolink.co.uk	00 0800 440 1286
තායිලන්තය	lotusprotectorline@oto.samartcorp.com	1800 019099
මැලේසියාව	protectorline@tipoffs.com.sg	1800 806524
හොං කොං*	tescois@expolink.co.uk	0800 930770
ටෙස්කෝ බැංකුව	tescobank@expolink.co.uk	0800 374199
බූකර්	booker@expolink.co.uk	0800 374199
ඩන්හම්බි	speakup@dunnhumby.com	රටේ දුරකථන අංක සඳහා iSite

*සටහන: මධ්‍යස්ථාන සහ මධ්‍යස්ථාන-නොවන පිහිටීම් සඳහා තනි දුරකථන අංක ඇත

TESCO

චර්යා සංග්‍රහය මාර්ගෝපදේශය

පහත පිටු මගින් ඔබගේ රාජකාරියේ දී ඔබට මුහුණ දීමට සිදුවිය හැකි ප්‍රධාන අවදානම් 21 සමග කටයුතු කිරීමට ඔබට උපදෙස් සහ උපකාර ලබා දෙයි. එකිනෙක කොටසේ ප්‍රශ්න සහ පිළිතුරු, අදාළ ප්‍රතිපත්ති සහ උපකාර සඳහා විමසිය යුතු කණ්ඩායම පිළිබඳ ලැයිස්තුවක් ඇතුළත් වේ.

අවදානම් කොටස් හතරකට බෙදා ඇත.

අපගේ ගනුදෙනුකරුවන්ගේ රැක බලා ගැනීම පිටුව 10

එක්ව කටයුතු කිරීම පිටුව 18

සාධාරණ වෙළඳාම පිටුව 26

අපගේ කීර්තිය ආරක්ෂා කිරීම පිටුව 38

1. අපගේ ගනුදෙනුකරුවන් රැක බලා ගැනීම

“අපගේ පාරිභෝගිකයන් වෙනුවෙන් අප තරම් වෙහෙසවෙන කිසිවෙකුත් නොමැත” අපගේ හරය අපගේ සාර්ථකත්වයේ මූලික හරය වන අතර අපට අපගේ පාරිභෝගිකයන් වටහා ගැනීමට සහ සෑම දිනකම ඔවුන් වෙනුවෙන් අවශ්‍ය දේ ලබාදීමට අපව උනන්දු කරවයි.

චර්යා සංග්‍රහයේ මෙම කොටස පාරිභෝගිකයින්ට පැහැදිලි මිල පණිවුඩ ලබා දීම සහ ඔවුන්ගේ දත්ත ආරක්ෂා කිරීමට අදාළ ගැටළු ආවරණය කරයි.

පැහැදිලි මිල ගණන් සහ අලෙවිකරණය පිටුව 12

ආහාර සහ නිෂ්පාදන ප්‍රමිති පිටුව 14

පාරිභෝගිකයින් සහ සාමාජිකයන්ගේ දත්ත ආරක්ෂා කිරීම පිටුව 16

පැහැදිලි මිල ගණන් සහ අලෙවිකරණය

එය ගැටළුවක් වන්නේ ඇයි?

වෙළඳ ප්‍රචාරණය සහ අලෙවිකරණය අපි අපගේ ගනුදෙනුකරුවන් අමතන වඩාත්ම ප්‍රබල ක්‍රම අතර පවතී. අපගේ නිෂ්පාදන සහ මිල ගණන් පිළිබඳ පැහැදිලි සන්නිවේදන ඔවුනට වැදගත් බව පාරිභෝගිකයින් අපට පවසති. රූපවාහිනිය හෝ මුද්‍රිත වෙළඳ දැන්වීම්, සමාජ කාඩ්පත් තැපැල් කිරීම, මාර්ගගත පණිවුඩ මගින් හෝ විකුණන වේලාවේ දී, අපගේ පණිවුඩ ඔවුන් අපගෙන් මිලදී ගන්නා තැන, ආකාරය සහ හේතුව යන අපගේ ගනුදෙනුකරුවන්ගේ තීරණ වලට බලපෑම් කරයි.

අපගේ පණිවුඩ වැරදුනහොත්, අපි ගනුදෙනුකරුවන් වියවුලට පත් කරන අතර නියාමන බලධාරීන්ගේ සහ මාධ්‍යයේ අවධානයට ලක්විය හැකිය. අප ක්‍රියාත්මක වන බොහෝ වෙළඳපලවල වෙළඳ ප්‍රචාරණය සහ මිලකරණ ප්‍රමිති නියාමනය වන අතර අපි ගනුදෙනුකරුවන් නොමග යවන බවට කරුණු ඉස්මතු වුවහොත්, අපට දඩ වලට මුහුණ දීමට සිදුවිය හැකි අතර පාරිභෝගික විශ්වාසය නැති විය හැකිය. එබැවින් අපගේ නිෂ්පාදන ගැන අප පවසන සෑම දෙයක්ම සත්‍ය විය යුතු අතරද, අපි කදිම මිලක් ලබා දෙන බව පැවසුවහොත් එය එසේම විය යුතුය. අපගේ පණිවුඩ නිවැරදිව ලැබීම ගනුදෙනුකරුවන් අප කෙරෙහි තබා ඇති විශ්වාසයට සෘජුවම බලපායි.

ඒ වෙනුවෙන් මා කළ යුත්තේ කුමක්ද?

- ඔබ කිසියම් අලෙවිකරණ කටයුත්තකට සම්බන්ධ නම්, සියලු පණිවුඩ අවංක, නිවැරදි හා සාධාරණ බව තහවුරු කරගන්න. බොහෝ විට වෙළඳ දැන්වීම්කරණයේ දී අපි පවසන දේ අප විසින් සනාථ කිරීමට අවශ්‍ය වේ.
- ප්‍රවර්ධනන සහ මිල ගණන් සරලව තබා ගන්න: සංකීර්ණ මිල ප්‍රවර්ධන සහ නිතර මිල වෙනස් කිරීම් වලින් වළකින්න.
- සියලුම පණිවුඩ වගකීම් සහගත බවට තහවුරු කරගන්න; කිසිදු පාරිභෝගිකයෙකු අපගේ වෙළඳ දැන්වීම් වලින් අමනාප නොවිය යුතුය. මධ්‍යසාර පිළිබඳ ප්‍රචාරණයේදී මෙය විශේෂයෙන් වැදගත් වේ.
- ඔබේ වෙළඳ ප්‍රචාරණය ඔබේ නිෂ්පාදනවලට ගැලපෙන බවට ස්ථිර කරගන්න - සියලු පින්තූර තහවුරු කරගන්න එවිට ඒවා අව්‍යාජ බවත් අප විකුණන නිෂ්පාදන පිළිබිඹු කරන බවත් ඔබට තහවුරු වේ.
- සැපයුම්කරුවෙකු හෝ තරඟකරුවෙකු වැනි කිසිඳු තෙවන පාර්ශවයක් ගැන කිසි විටෙකත් අසත්‍ය අලෙවිකරණ ප්‍රකාශ නොකරන්න.

ප්‍රශ්න සහ පිළිතුරු

Q මම විලී වයින් ප්‍රවර්ධන කටයුත්තක් සැලසුම් කරමින් සිටින අතර පෝස්ටර් සඳහා මිදි වතුවල පින්තූරයක් භාවිතා කරමි. අප කිසි විටෙකත් භාවිතා නොකළ ආර්ජන්ටිනාවේ මිදි වත්තක කදිම ඡායාරූපයක් ඡායාරූප පුස්තකාලයේ තිබේ. මගේ ප්‍රවර්ධන කටයුත්තට මට එය භාවිතා කළ හැකිද?

A **නැත. ඔබ ප්‍රචාරණය කරන රූප ඔබේ නිෂ්පාදනය නිවැරදිව පිළිබිඹු කළ යුතුය. ඔබ විසින් ඔබ ප්‍රවර්ධනය කරන වයින් නිපදවන විලී රටේ මිදි වත්තක ඡායාරූපයක් ලබා ගැනීමට අවශ්‍ය වනු ඇත.**

Q වෙබ් පාදක වෙළඳ දැන්වීම්කරණය සඳහා අදාළ වන නීති මොනවාද?

A **වෙනත් ඕනෑම වෙළඳ දැන්වීම්කරණ කටයුත්තක සමාන වේ. පණිවුඩ නිවැරදි, පැහැදිලි විය යුතු අතර නොමග යවන සුළු ඒවා නොවිය යුතුය.**

Q සමහර නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට පෙර ඒවායේ මිල ඉහළ යන බව මට නිරීක්ෂණය වී ඇත. මෙයට අවසර තිබේද?

A **බොහෝ වෙළඳපලවල ප්‍රවර්ධනය යටතේ නිෂ්පාදන විකුණන සෑම විටම අනුගමනය කළ යුතු දැඩි නීති තිබේ. මෙම නීති ඔබේ වෙළඳපොළ තුළ අදාළ වන ආකාරය පිළිබඳව ඔබේ දේශීය නීති හෝ වෙළඳ නීති කණ්ඩායම්වලට ඔබට උපදෙස් දිය හැකිය.**

Q මගේ දරුවාගේ ප්‍රාථමික පාසල අසල එක්ස්ප්‍රස් වෙළඳසැලක් ඇති අතර ඔවුන් නව ප්‍රචණ්ඩ සටන් කලා X-Box ක්‍රීඩාවක් දියත් කිරීම පිළිබඳ දැන්වීමට පෝස්ටරයක් ප්‍රදර්ශනය ය කර ඇත. නිසැකවම, කුඩා දරුවන් විශාල ප්‍රමාණයක් දකිනු ඇති බැවින් ප්‍රචණ්ඩත්වය ප්‍රචාරණය කිරීම වැරදි නොවන්නේද?

A **අපට කිසි විටෙකත් වෙළඳ දැන්වීම් වරදක් විය හැකි හෝ ළමයින්ට හානිකර යැයි සිතිය හැකි තැනක තැබීමට අවශ්‍ය නොවනු ඇත. ඔබ හඬ අවදි කර ඔබේ කළමනාකරු, වෙළඳ නීති හෝ නීති කණ්ඩායම් සමග ඔබේ ගැටළුව කතා කළ යුතුය.**

මට තවත් දේ සොයාගත හැක්කේ කොතැනින්ද?

- එක්සත් රාජධානියේ නෛතික පාරිභෝගික කණ්ඩායම හෝ දේශීය නීති කණ්ඩායම
- දේශීය අලෙවි නීති කණ්ඩායම (එක්සත් රාජධානියෙන් පිටත)

ආහාර සහ නිෂ්පාදන ප්‍රමිති

එය ගැටළුවක් වන්නේ ඇයි?

අප විසින් උසස්ම තත්ත්වයෙන් නිෂ්පාදිත භාණ්ඩ පමණක් විකිණීම අපගේ ගනුදෙනුකරුවන් අපේක්ෂා කරන අතර අපගේ නිෂ්පාදන සියල්ලම ආරක්ෂිත බව සහතික කිරීම සහ අදාළ වන සියලු නීති හා රෙගුලාසි වලට අනුකූලවීම තහවුරු කිරීමට ඔවුන් අපෙ කෙරෙහි විශ්වාසය තබයි. අප බෙදාහැරීම භාර ගත් මොහොතේ සිට අපගේ ගනුදෙනුකරුවන් ඒවා මිලදී ගන්නා වේලාව දක්වා අපගේ සියලු නිෂ්පාදනවල ආරක්ෂාව සහ ගුණාත්මක භාවය සහතික කිරීමට අපි කැපවී සිටිමු.

අපගේ ගොවීන් හා සැපයුම්කරුවන් සමග වඩා හොඳ සබඳතා ගොඩනගා ගැනීමට සහ අපි සපයන සියලුම නිෂ්පාදන ආරක්ෂිත, නීත්‍යානුකූල සහ අපගේ නිශ්චිත ගුණාත්මක ප්‍රමිතීන්ට අනුකූල වන බව සහතික කිරීමට අපි අපගේ සැපයුම් දාමය සරල කර ඇත්තෙමු.

අපට අපගේ ගබඩා සහ බෙදාහැරීමේ මධ්‍යස්ථාන තුළ හොඳින් ස්ථාපිත හා පුළුල් ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතියක් ඇත. අපි සෑම දිනකම අපගේ ප්‍රමිතීන් පවත්වා ගෙන යන බවට තහවුරු කරගැනීම සඳහා අපගේ ආහාරවල ගුණාත්වය සහ ආරක්ෂාව නිරීක්ෂණය කර පරීක්ෂා කරමු. එම පරීක්ෂාවලට අපගේ නිෂ්පාදනවල උෂ්ණත්වය, පුද්ගලික සනීපාරක්ෂාව, අපගේ ගබඩා සහ උපකරණවල පිරිසිදුභාවය, ආහාර අපවිත්‍ර වීමෙන් ආරක්ෂා කිරීම සහ අපගේ ආහාර නිෂ්පාදනවල චක්‍රීයකරණය කළමනාකරණය කිරීම ඇතුළත් වේ.

ඒ වෙනුවෙන් මා කළ යුත්තේ කුමක්ද?

- අපගේ සැපයුම්කරුවන් අපගේ නිෂ්පාදන ආරක්ෂාව සහ ගුණාත්ව ප්‍රමිතීන් සපුරාලන බව සහ නිෂ්පාදන ආරක්ෂාව, ගුණාත්මකභාවය සහ නීත්‍යානුකූලභාවය පවත්වා ගැනීම පිළිබඳ අපගේ ප්‍රතිපත්තිවලට අනුකූලවන බව තහවුරු කරගන්න.
- අපගේ සැපයුම් දාමයේ වංචාසහගත අවස්ථා හෝ සැක ඇත්නම් වාර්තා කරන්න.
- අපගේ කීර්ති නාමය ආරක්ෂා කරගන්න සහ අපගේ නිෂ්පාදන ආරක්ෂිත සහ වගකීමෙන් යුතුව ලබා ගත හැකි බවට වන අපගේ ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය ආරක්ෂා කරගන්න.
- අප මිලදී ගන්නේ කාගෙන්දැයි දැනගෙන අපි අලෙවිකරණ සෑම සහ සියලුම නිෂ්පාදනයක්ම සැලකිලිමත්ව ඇගයීමට ලක් කරන්න එවිට අපට අපගේ සැපයුම් දාමය තුළ අපගේ නිෂ්පාදන සම්පූර්ණයෙන්ම ලුහුබැඳීමට හැකි බවට අපට සහතික විය හැකිය.
- ඔබ ගබඩා හෝ බෙදාහැරීමේ සාමාජිකයකු නම්, ඔබ සියලු ආහාර සුරක්ෂිතතා සහ සනීපාරක්ෂක පුහුණුව සහ නැවුම්කරණ පුහුණුව සම්පූර්ණ කර ඇති බවට තහවුරු කරගෙන සියලු නිෂ්පාදන නිවැරදි උෂ්ණත්වවල රඳවා තබාගෙන අපවිත්‍ර නොවී ආරක්ෂා වන බවට වග බලාගන්න. ඔබ දුර්වල ගුණාත්මකභාවයක් හෝ අනාරක්ෂිත නිෂ්පාදන දුටුවහොත්, ඒවා අලෙවියෙන් ඉවත් කරන බවට තහවුරු කරගන්න.

ප්‍රශ්න සහ පිළිතුරු

Q සැපයුම්කරුවෙකු ටෙස්කෝ නිෂ්පාදන සඳහා ලාභදායී, දුර්වල ගුණාත්මකභාවයෙන් යුතු විකල්ප අමුද්‍රව්‍ය ආදේශ කිරීම කිරීමට ඉඩ ඇති බවට මට ගැටළුවක් ඇත. මා කළ යුත්තේ කුමක්ද?

A **ඔබ විසින් ඔබේ කළමනාකරු, නිෂ්පාදන තාක්ෂණික කළමනාකරු, ඔබේ නිෂ්පාදන නියාමන අනුකූලතා කණ්ඩායම හෝ දේශීය වෙළඳ නීති කණ්ඩායම (එක්සත් රාජධානියෙන් පිටත) වෙත ඔබගේ ගැටළුව වහාම ඉදිරිපත් කළ යුතුය. ගැටළුව සොයාගත නොහැකි එකක් බවට පත්වුවද, ඔබ හඬ අවදි කිරීම වැදගත් වේ.**

Q මම නව සන්නාම නිෂ්පාදනයක් සඳහා නව සැපයුම්කරුවෙකු ලැයිස්තුගත කිරීමට අපේක්ෂාවෙන් සිටිමි. අපගේ සැපයුම්කරුවන් අපට සැපයුම් ලබාදීමට පෙර නිෂ්පාදනවල ගුණාත්මකභාවය, ආරක්ෂාව සහ නීත්‍යානුකූලභාවය සඳහා සපුරාලිය යුතු ප්‍රමිති මොනවාද?

A **අපි අපගේ සැපයුම්කරුවන් ටෙස්කෝ සන්නාම සඳහා නිෂ්පාදන කරන විට ඔවුන් ක්‍රියා කිරීමට අවශ්‍ය අවශ්‍යතා සඳහන් කරන ටෙස්කෝ නිෂ්පාදන සහ සම්පත් ලබාගැනීමේ ප්‍රමිති පැහැදිලිව නිර්ණය කර ඇත්තෙමු. මෙම ප්‍රමිති සපුරා ඇත්දැයි තහවුරු කර ගැනීම සඳහා නිෂ්පාදනය කිරීමට පෙර අපි අදාළ පරිශ්‍ර වෙත ගොස් අනුමත කරමු. වැඩිදුර තොරතුරු සඳහා ඔබේ දේශීය නිෂ්පාදන නියාමන අනුකූලතාව හෝ තාක්ෂණික කණ්ඩායම සමග කතා කරන්න.**

Q මට නිෂ්පාදනවල ගුණාත්මකභාවය, ආරක්ෂාව සහ නීත්‍යානුකූලභාවය කළමනාකරණය කිරීමට අපට ඇති ක්‍රියාදාම ගැන තවත් දැනගත හැක්කේ කොතැනින්ද?

A **ටෙස්කෝ නිෂ්පාදන ගුණාත්ව රීති යනු අපගේ නිෂ්පාදන සාදන මූලධර්ම සඳහා මූලික මාර්ගෝපදේශයකි. මෙය නිෂ්පාදන නියාමන අනුකූලතා කණ්ඩායම හෝ ඔබේ තාක්ෂණික කළමනාකරු මගින් ලබා ගත හැකිය.**

Q මම නව රාජකාරි පිළිවෙලක් සකස් කරමින් සිටින අතර එමගින් අපි ගබඩාව තුළ නිෂ්පාදනයක් හසුරුවන ආකාරය වෙනස් කරයි. මා ඇමතිය යුත්තේ කවුරුන්ද?

A **ඔබට ආහාර සුරක්ෂිතතාව හෝ ගුණාත්මකභාවය පිළිබඳ ගබඩා ක්‍රියා පිළිවෙතක් වෙනස් කිරීමට අවශ්‍ය නම්, ඔබ පළමු අවස්ථාවේ දීම නිෂ්පාදන නියාමන අනුකූලතා කණ්ඩායම (එක්සත් රාජධානියෙන් පිටත තාක්ෂණික සහ/ හෝ ගබඩා මෙහෙයුම්) ඇමතිය යුතුය. වෙනස්කම් ඕනෑම එකක් නිවැරදිව පුහුණු කිරීම සහ ගබඩා සාමාජිකයන්ට සන්නිවේදනය කිරීම සහතික කිරීම සඳහා හොඳම ක්‍රමය පිළිබඳව ඔවුන්ට උපදෙස් දිය හැකිය.**

මට තවත් දේ සොයාගත හැක්කේ කොතැනින්ද?

- නිෂ්පාදන නියාමන අනුකූලතා කණ්ඩායම
- දේශීය නිෂ්පාදන තාක්ෂණික කණ්ඩායම
- දේශීය අලෙවි නීති කණ්ඩායම (එක්සත් රාජධානියෙන් පිටත)

පාරිභෝගිකයින් සහ සාමාජිකයන්ගේ දත්ත ආරක්ෂා කිරීම

එය ගැටළුවක් වන්නේ ඇයි?

දත්ත අපගේ ව්‍යාපාරයේ හදවතයි. අපි අපගේ පාරිභෝගිකයන් හා සම්බන්ධ වන පවත්වන සෑම අවස්ථාවකම දත්ත රැස් කිරීම, සැකසීම සහ භාවිතා කිරීම සිදු කරමු. උදාහරණ වශයෙන්, සාප්පු යාමේ පුරුදු පිළිබඳ දත්ත මගින් පාරිභෝගිකයන්ට ඔවුන් මිලදී ගැනීමට කැමති නිෂ්පාදන සඳහා වාසිදායක ගනුදෙනු ලබා දීමට අපට ඉඩ දෙයි. අතිරේකව, සෑම විටම අපි පාරිභෝගිකයින්ගේ දත්ත භාවිතා කරන ආකාරය පිළිබඳ ඔවුන්ට තේරීම් ලබාදී ඇති බවට අපි සහතික වන අතර අප මෙය කරන ආකාරය පිළිබඳව අපි ඔවුන් සමග විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරන්නෙමු. අපි ව්‍යාපාරික අරමුණු සඳහා අපගේ සාමාජිකයන් පිළිබඳ තොරතුරු ද තබාගෙන භාවිතා කරමු.

අපගේ පාරිභෝගිකයන් සහ සාමාජිකයන් අපි ඔවුන්ගේ දත්තවලට වගකීමෙන් හා නීත්‍යානුකූලව සලකන බවට විශ්වාස කරයි. අප මෙය සිදු කරන බවට වග බලා ගැනීමට, අපට ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි ඇති අතර සියලු සාමාජිකයන් විසින් ඒවා තේරුම් ගෙන අනුගමනය කරන බව තහවුරු කිරීම ඔවුන්ගේ වගකීමකි.

එබැවින් අපි දත්ත භාවිතා කරන සෑම අවස්ථාවකම අපි මෙම මූලධර්ම පිළිපැදිය යුතුය:

ආරක්ෂිත: අපි අපගේ පාරිභෝගිකයන්ගේ සහ සාමාජිකයන්ගේ දත්ත ආරක්ෂිතව තබා ගන්නෙමු.

සුදුසු: අපි පාරිභෝගිකයන්ගෙන් සහ සාමාජිකයන්ගේ දත්ත රැස් කළ අරමුණු සඳහා හැර වෙන කිසිවක් සඳහා එම දත්ත භාවිතා නොකරමු.

විවෘත: අප සතුව ඇති දත්ත මොනවාද යන්න සහ අප එය භාවිතා කිරීමට හේතුව පිළිබඳව අපි විවෘත, අවංක සහ පාරදෘශ්‍ය තත්වය පවත්වා ගනිමු.

රඳවා ගැනීම: අපි දත්ත භාවිතා කිරීමට හේතුව සහ අපට එය කොපමණ කාලයක් තබා ගත හැකිද යන්න අපි වටහා ගනිමු.

ඒ වෙනුවෙන් මා කළ යුත්තේ කුමක්ද?

- අපගේ ප්‍රතිපත්ති හා ක්‍රියා පිළිවෙත් සහ ඉහත සඳහන් මූලධර්ම මෙන්ම ඔබේ පුහුණුවද පිළිපදින්න – මේ ආකාරයෙන් ඔබ ඔබේ බැඳියාවන් තේරුම් ගනු ඇත. අදාළ සියලුම ලේඛන රහස්‍යතා ද්වාරයේ ගබඩා කර ඇත.
- නිෂ්පාදනයක් හෝ සේවාවක් සංවර්ධනය කිරීමේදී “රහස්‍යතා අයිතිවාසිකම්” සලකන්න. ඔබට ගැටළු කිසිවක් ඇත්නම්, ඔබේ දේශීය රහස්‍යතා කණ්ඩායම අමතන්න.
- ටෙස්කෝ සතුව ඇති දත්ත සහ ටෙස්කෝ එයින් කරනු ඇති දෙය පිළිබඳව පාරිභෝගිකයින් සහ සාමාජිකයින්ට පැහැදිලිව දැන ගැනීමට ඉඩ සලසන්න.
- රහස්‍යතා සහය ද්වාරය (හෝ ඔබේ ව්‍යාපාර ඒකකයේ ද්වාරයක් නොමැති නම් දේශීය රහස්‍යතා කණ්ඩායමට) දත්ත සම්බන්ධ සියලු සිදුවීම් වහාම වාර්තා කරන්න.

ප්‍රශ්න සහ පිළිතුරු

Q පාරිභෝගික දත්ත යනු මොනවාද?

A **අපගේ ගනුදෙනුකරුවන් හෝ ටෙස්කෝ තුළ සිදු කෙරෙන ඔවුන්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධ ඕනෑම දත්තයක්. මෙයට නම්, ලිපිනයන් සහ සබඳතා විස්තර, ගනුදෙනු දත්ත, ඉන්වොයිසිය, ජංගම දුරකථන වාර්තා, ජංගම යෙදුම් දත්ත, බැංකු දත්ත, සමාජ කාඩ්පත් දත්ත සහ පාරිභෝගිකයා විසින් ටෙස්කෝ වෙත යවා ඇති ලිපි හුවමාරු ඇතුළත් විය හැකිය.**

Q රථගාලේ දී පාරිභෝගිකයෙකුට හදිසි අනතුරක් සිදුවී ඇති අතර එම තැනැත්තාට CCTV දර්ශන නැරඹීමට අවශ්‍යය. මට එය ඔවුන්ට පෙන්විය හැකිද?

A **නැත. CCTV දර්ශන නැරඹිය යුත්තේ එය නැරඹීමට අවසරලත් පුද්ගලයින් පමණක් වන අතර එය කිසි විටෙකත් පෙන්වීම, ප්‍රසිද්ධ කිරීම හෝ පිටපත් කිරීම නොකළ යුතුය. පාරිභෝගිකයාට එම දර්ශනවල පිටපතක් ඉල්ලීමට හැකිය. මෙය සිදු කිරීම සඳහා ඔබ CCTV ප්‍රවේශය සහ අනාවරණ සඳහා වන ඉල්ලීම් පිළිබඳව වන මාර්ගෝපදේශය අනුගමනය කළ යුතුය.**

Q අපගේ කණ්ඩායමේ උපන් දින ලැයිස්තුවක් නිර්මාණය කිරීමට මට අපගේ වැටුප් ලැයිස්තුව වෙත පිවිසිය හැකිද?

A **නැත. ඔබට එසේ කිරීමට අවසර දී ඇත්නම් සහ ඔවුන්ගේ වැටුප්වලට හෝ ඔවුන්ගේ නම සහ ලිපිනය වැනි පුද්ගලික විස්තරවලට වෙනස්කම් සිදු කිරීම වැනි රාජකාරිමය කරුණකට අදාළවන්නේ නම් හැර ඔබට වැටුප් ලැයිස්තු දත්ත වෙත පිවිසීමට අවසර නැත. ඔබට මෙම තොරතුරු නැවත ලබා දෙන ලෙස ඔබේ කණ්ඩායමෙන් ඉල්ලීම වඩා හොඳ විසඳුමක් වනු ඇත.**

Q මම මගේ ව්‍යාපාරික ප්‍රදේශයේ නව අලෙවිකරණ ව්‍යාපාරයක වැඩ කරමින් සිටිමි. මට දැනටමත් සිය විද්‍යුත් තැපැල් ලිපිනය ලබා දී ඇති ගනුදෙනුකරුවන් සම්බන්ධ කර ගත හැකිද?

A **අපට අපගේ ගනුදෙනුකරුවන්ගේ පුද්ගලික දත්ත එය ලබා දුන් හේතුව සඳහා පමණක් භාවිතා කළ හැකිය. අපට පාරිභෝගිකයන් ඇමතීමට එම තොරතුරු භාවිතා කිරීමට නම් ඔවුන් සිය විස්තර ලබා දෙන අවස්ථාවේදී අපෙන් අලෙවිකරණ සන්නිවේදන ලැබීමට එකඟ වී තිබිය යුතුය. අපි පාරිභෝගිකයාගේ අලෙවිකරණ අභිරුචි ද සලකා බැලිය යුතුය: ඔවුන් අපෙන් අලෙවිකරණ ඇමතීම් ලැබීමෙන් ඉවත් වී ඇත්නම්, එවිට අපි ඔවුන්ගේ තේරීම්වලට ගරු කළ යුතුය. මග පෙන්වීම ලැබීම සඳහා ඔබට ඔබේ දේශීය රහස්‍යතා කණ්ඩායම ඇමතීමට හැකිය.**

මට තවත් දේ සොයාගත හැක්කේ කොතැනින්ද?

- සමූහයේ නෛතික රහස්‍යතා කණ්ඩායම හෝ දේශීය රහස්‍යතා කණ්ඩායම
- දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තිය
- රහස්‍යතා සහය ද්වාරය

2. එක්ව කටයුතු කිරීම

අපගේ සාර්ථකත්වය අපේ ජනතාව මත රඳා පවතී. ටෙස්කෝ අගය "සෑම කෙනෙකුම සැලකුම් ලැබීමට කැමති ආකාරයට ඔවුන්ට සලකන්න" යන්න අපගේ කණ්ඩායම් වලින් අපි උපරිම ප්‍රයෝජන ලබා ගන්නා බව සහ සිය අපේක්ෂාවන් ඉටු කර ගැනීමට සාමාජිකයන්ට උපකාර කරන බව තහවුරු කරයි.

චර්යා සංග්‍රහයේ මෙම කොටස සාමාජිකයන්ට අදාළ ප්‍රධාන ගැටළු ආවරණය කරයි.

සෞඛ්‍යය සහ ආරක්ෂාව පිටුව 20

සමාන අවස්ථාව, අන්තර්ග්‍රහණය සහ විවිධත්වය පිටුව 22

ගෞරවය, ගරුත්වය සහ සාධාරණ ලෙස සැලකීම පිටුව 24

සෞඛ්‍යය සහ ආරක්ෂාව

එය ගැටළුවක් වන්නේ ඇයි?

ටෙස්කෝ හි අපි අපගේ සාමාජිකයන්, පාරිභෝගිකයන් සහ අපගේ ව්‍යාපාර වලින් බලපෑමට ලක්වන ඕනෑම අයෙකුගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් වෙමු. සෑම කෙනෙකුම සෑම දිනකම ආරක්ෂිතව නිවසට යාම අපට අවශ්‍ය බැවින් එය අපි ව්‍යාපාරයේ යෙදෙන ආකාරයට මූලික වේ.

ආරක්ෂිතව වැඩ කිරීමෙන්, අපගේ අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමෙන් සහ රැකවරණය පිළිබඳ සංස්කෘතියක් නිර්මාණය කිරීමෙන්, අපට අපගේ සාමාජිකයන්ට සහ ගනුදෙනුකරුවන්ට සිදුවන ආබාධ හේතුවෙන් ඇති වන පීඩාව සහ සමහර විට ඇතිවන දිගු කාලීන බලපෑම අවම කර ගත හැකිය. එමෙන්ම අපට රැකියාව අවසන්ව ආපසු නොපැමිණීම සහ විමර්ශනය, වෛද්‍ය ප්‍රතිකාර හා වන්දි ගෙවීම යන වියදම් හේතුවෙන් ව්‍යාපාරයට සිදුවන බාධාව අවම කර ගැනීමට ද හැකිය. අපි රැකබලා ගැනීම පිළිබඳව වන අපගේ රාජකාරිය සිදු කිරීමට අපොහොසත් වුවහොත් අපගේ ගනුදෙනුකරුවන් සහ සාමාජිකයන් අප කෙරෙහි ඇති වටිනා විශ්වාසයට හානි කර වන පරිදි එය අපට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට තුඩු දිය හැකිය.

සෑම කෙනෙකුම සිය ආරක්ෂාව බැරෑරුම් ලෙස සලකන බව සහතික කිරීමට අපි කැපවී සිටින අතර අපගේ පිරිසට අපගේ පොරොන්දුව වන්නේ:

- සැමවිටම නීත්‍යානුකූල වන්න.
- අනතුරු වලට හේතු තේරුම් ගන්න එවිට අපට ඒවා යළිත් ඇතිවීම වළක්වා ගත හැකිය.
- අපගේ ක්‍රියාකාරකම්වල බළපෑමට ලක්වන කිසිවකුට වුවත් සිදුවන හානිය අඩු කිරීමට සැමවිටම උත්සාහ කරන්න.

ඒ වෙනුවෙන් මා කළ යුත්තේ කුමක්ද?

- සැමවිටම ඔබේ රාජකාරියට අදාළ වන පුහුණුව සහ ආරක්‍ෂක උපදෙස් අනුගමනය කරන්න.
- ඔබ කළමනාකරුවෙකු නම්, ආරක්ෂිත හැසිරීම් පිළිබඳ අන් අයට ආදර්ශයක් වෙමින්, කිසිදා තමන්ව හානියකට ලක්වන දෙයක් කිරීමට සාමාජිකයන්ගේ ඉල්ලීමෙන් වළකින්න.
- අවදානම් අවබෝධ කරගෙන ඇති බවට සහතික කරගෙන ඒවායින් සිදුවිය හැකි හානිය අවම කර ගැනීම සඳහා නිසි සැලසුම් තබාගන්න.
- ආරක්ෂාව සෑම කෙනෙකුගේම වගකීමකි – ඔබ යමක් අනාරක්ෂිත බව හෝ හදිසි අනතුරකට හේතු විය හැකි යැයි සිතන්නේ නම්, එය පාලනය කිරීමට පියවර ගෙන වහාම එය වාර්තාකරන්න.
- සාමාජිකයකු තමන්ට හෝ අන් අයට හානියක් වන අයුරින් වැඩ කරන ආකාරය ඔබ දුටුවහොත්, ඉදිරි පියවරක් ලෙස ඔවුන්ට ආරක්ෂිතව වැඩ කරන ආකාරය මතක් කර දෙන්න.
- ඔබට කිසිවක් ආරක්ෂිතව කිරීමට නිසි දැනුමක් හෝ පුහුණුවක් නොමැති නම් කිසි විටෙකත් එය සිදු කිරීමට එකඟ නොවන්න.

ප්‍රශ්න සහ පිළිතුරු

Q මම ටෙස්කෝ වෙත සම්බන්ධවූවා පමණක් වන අතර සුරක්ෂිතතා පුහුණුව සම්පූර්ණකිරීමට ටික කාලයක් ගත වන අතර එය "සාමාන්‍ය බුද්ධිය" සම්බන්ධ දෙයක් පමණක් බව සාමාජිකයන් මට පැවසූහ. ඇත්තෙන්ම මට පුහුණුව අවශ්‍ය ද?

A **ඔව්. සියලුම නව සාමාජිකයන් තම සේවා ස්ථානයට අත්‍යාවශ්‍ය (Protector Line) පියවර හුරුපුරුදු කරගත යුතු අතර හදිසි අවස්ථාවකදී කළ යුත්තේ කුමක්දැයි දැන සිටිය යුතුය. සියලුම සේවා ස්ථාන එක සමාන නොවන අතර අප සියලු දෙනාටම ඇති අත්දැකීම විවිධ මට්ටම්වල ඒවාය. අපගේ ආරක්ෂක පුහුණුව මගින් අප සැමවොම ආරක්ෂිතව සිටීමට එකට වැඩ කිරීමට වගබලා ගනිමු.**

Q මම නව උපකරණ කොටසක ආරක්ෂාව ගැන ගැටළුවකට පත්ව සිටිමි. මා කළ යුත්තේ කුමක්ද?

A **ඒ ගැන උපදෙස් හෝ පුහුණුවක් ලබා දී නොමැති නම් එය භාවිතා නොකළ යුතුය. සැපයුම්කරු අවදානම් තක්සේරුවක් සපයා නිවැරදි පාලන සැලසුම් කර තිබිය යුතු අතර එසේ කර ඇති දැයි ඔබ පරීක්ෂා කළ යුතුය. උපදෙස් තිබෙන නමුත් ඔබ තවමත් සැලකිලිමත් වන්නේ නම්, ඔබේ දේශීය සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ විශේෂඥයා හෝ පිරිස් ආරක්ෂණ කණ්ඩායම අමතන්න - ඔබට ඔබේ දේශීය සෞඛ්‍යය සහ ආරක්ෂණ දැන්වීම් පුවරුව තුළ ඔවුන්ගේ විස්තර සොයාගත හැකිය.**

අපගේ සාමාජිකයන් සහ අපගේ ව්‍යාපාරය ආරක්ෂා කිරීම

Q අපගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව පිළිබඳ විශේෂඥයින් කවුද?

A **සෑම ව්‍යාපාරික ඒකකයකම තාක්ෂණික ප්‍රශ්න සම්බන්ධව කටයුතු කිරීමට සහ අවදානම ඇගයීමේ ක්‍රියාවලිය කළමනාකරණය කිරීමට හැකි සෞඛ්‍යය සහ ආරක්ෂාව (පිරිස් ආරක්ෂණ කළමනාකරු) පිළිබඳ විශේෂඥයින් සේවය කරයි. මෙම සාමාජිකයන් සියල්ලන්ටම ඔවුන් තම ක්ෂේත්‍රයේ දක්ෂයින් බවට පත්කරන ආරක්ෂක සුදුසුකම් සහ සැලකිය යුතු පළපුරුද්දක් ඇත. ඔවුන්ගේ විස්තර සාමාජිකයන් හෝ (Protector Line) දැන්වීම් පුවරුවේ ලැයිස්තුගත කර තිබිය යුතුය.**

Q මට ආරක්ෂක කරුණක් රහසිගතව වාර්තා කළ හැක්කේ කෙසේද?

A **පළමු අවස්ථාවේදී, ඔබේ කළමනාකරු හෝ පුද්ගල කණ්ඩායම සමග කතා කරන්න. සාමාජිකයන්ට ආරක්ෂක කරුණු වාර්තා කිරීමට (Protector Line) ද ඇත. එය සම්පූර්ණයෙන්ම රහසෲව භාවිතා කළ හැකි අතර සෑම වාර්තාවක්ම ස්වාධීනව විමර්ශනය කෙරේ.**

Q රාජකාරියේ යෙදී සිටියදී මට අනතුරක් සිදුවී ඇති අතර, මා කුමක් කළ යුතුද?

A **රාජකාරියේ දී සිදුවන සියලුම අනතුරු වහාම ඔබේ කළමණාකරු වෙත වාර්තා කළ යුතු අතර එවිට ඔවුන්ට සහය සැපයීමට සහ දේශීය තුවාල වාර්තා කිරීමේ අවශ්‍යතා අනුගමනය කිරීමට හැකිය. හදිසි අනතුරු වාර්තා කිරීම මගින්, වැඩ කිරීමට ආරක්ෂිත ස්ථානයක් නිර්මාණය කරනු වස් අපගේ සාමාජිකයන් අපගේ ව්‍යාපාරයේ විවිධ ක්ෂේත්‍රවල දී මුහුණ දෙන අවදානම් වඩා හොඳින් තේරුම් ගැනීමට අපට ඉඩ සලසයි.**

මට තවත් දේ සොයාගත හැක්කේ කොතැනින්ද?

- සෞඛ්‍යය සහ ආරක්ෂණ දැන්වීම් පුවරු
- මහජන ආරක්ෂණ කළමනාකරු හෝ දේශීය සෞඛ්‍යය සහ ආරක්ෂාව පිළිබඳ විශේෂඥයා
- මහජන ආරක්ෂණ ප්‍රතිපත්තිය

සමාන අවස්ථාව, අන්තර්ග්‍රහණය සහ විවිධත්වය

එය ගැටළුවක් වන්නේ ඇයි?

සෑම කෙනෙකුම සාදරයෙන් පිළිගන්නා ගෝලීයව විවිධාකාර හා ඒවා ඇතුළත් සංස්කෘතියක් නිර්මාණය කිරීමට අපි උත්සාහ කරමු. අපගේ සාමාජිකයන් සමාජයේ විවිධාංගී ස්වභාවය පිළිබිඹු කරන අතර අපි අපගේ ව්‍යාපාර වර්ධනයට උපකාර කිරීමේදී එක් එක් පුද්ගලයාගේ දායකත්වය අගය කරමු.

වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ආබාධිතභාවය, ලිංගික දිශානතිය, ස්ත්‍රී පුරුෂ භාවය වෙනස්වීම, ජාතිය, කුලය, ආගම, දේශපාලන විශ්වාසය, විවාහය/ සිවිල් හවුල්කාරිත්ව තත්වයය හෝ ගර්භණීභාවය මාතෘත්වය නොසලකා අපි සියලු දෙනාටම සාධාරණව, සමානව හා වෙනස්කමකින් තොරව සැලකිය යුතුය. අපගේ ගබඩාවල, බෙදාහැරීමේ මධ්‍යස්ථානවල සහ කාර්යාලවල දී සාමාජිකයන් බඳවා ගැනීමේදී, සංවර්ධනය කිරීමේදී සහ ප්‍රවර්ධනය කිරීමේදී, අපි පැහැදිලිව නිර්වචනය කර ඇති සහ සාධාරණ නිර්ණායක භාවිතා කරමින් රැකියා සම්බන්ධ කුසලතා, ජයග්‍රහණ සහ කාර්යසාධනය ය මත පමණක් රැකියා තීරණ ලබාගනිමු. මේවා සාමාජිකයන්ට පිළිනොගැනෙන බවක් සහ බැහැර කෙරෙන බවක් දැනෙන්නට හැරීම, අපගේ කීර්ති නාමයට හානිවීම සහ ව්‍යාපාරයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හේතු විය හැකි බැවින් අපි වෙනස්කොට සැලකීමේ පුරුදු හෝ හැසිරීම් කිසිවක් පිළිනොගනිමු.

අපි නම්‍යශීලී ආකාරයෙන් වැඩ කිරීම, අර්ධ-කාලීන තනතුරු සහ රැකියා හුවමාරු කරගැනීමේ අවස්ථා වැනි සිය අවස්ථාවන්ට ගැළපෙන ආකාරයකින් වැඩ කිරීමට ද අපි සාමාජිකයන්ට අවස්ථා ලබා දෙමු. අපගේ සාමාජිකයන්ගේ සහ ව්‍යාපාරයේ සදා වෙනස්වන අවශ්‍යතාවන්ට සරිලන පරිදි අපි අපගේ සේවා පිළිවෙත් සහ ගිවිසුම් අඛණ්ඩව සමාලෝචනය කරමු.

ඒ වෙනුවෙන් මා කළ යුත්තේ කුමක්ද?

- ඔබේ සාමාජිකයන්ට සහ පුළුල් ව්‍යාපාරයට සහය වීම සඳහා අවංකව හා සද්භාවයෙන් යුතුව කටයුතු කරන්න.
- සමාජීය හෝ සංස්කෘතික වෙනස්කම් කිසිවක් නොසලකා සියලු සාමාජිකයන්, පාරිභෝගිකයන්, සැපයුම්කරුවන් හෝ වෙනත් පාර්ශ්වයන්ට ගරු කරන්න.
- විවෘතභාවය හා සහයෝගීතාවය සහිත පරිසරයක් සහතික කිරීම සඳහා ඔබේ කණ්ඩායම තුළ ආදර්ශ ආකෘති ඇතුළත් හැසිරීම මගින් අපගේ සාමාජිකයන්ගේ විවිධත්වය, දැනුම සහ අත්දැකීම මගින් අපට උකහා ගත හැකි වේ.
- ටෙස්කෝ වැඩ කිරීමට කදිම ස්ථානයක් බවට පත් කිරීම සඳහා අප සියල්ලන්ටම එක්ව කටයුතු කළ හැකි වන පරිදි අදාළ ක්‍රම හරහා ඔබේ අදහස් සහ ගැටළු ප්‍රකාශ කරන්න.
- නව සාමාජිකයන් බඳවා ගැනීමේදී සහ කුසලතා සහ ව්‍යාපාරික කරුණු මත පමණක් පදනම්ව දැනට සිටින සාමාජිකයන් ප්‍රවර්ධනය කිරීමේදී හෝ සංවර්ධනය කිරීමේදී නිවැරදි රැකියා තීරණ ගන්න.

මට තවත් දේ සොයාගත හැක්කේ කොතැනින්ද?

- මහජන කණ්ඩායම
- සමාන අවස්ථා සහ විවිධත්ව ප්‍රතිපත්තිය

ප්‍රශ්න සහ පිළිතුරු

Q මම කළමනාකරුවෙකු වන අතර සාමාජිකයන් දෙදෙනෙකු අතරින් උසස්වීම පිළිබඳ තීරණයක් ගැනීමට සිදුවී ඇත. එක් සාමාජිකයකුගේ වයස අවුරුදු 55 ක් වන අතර විශ්‍රාම යන වයස ආසන්නයේ සිටින අතර අනෙක් පුද්ගලයාගේ වයස අවුරුදු 30 ක් පමණ වේ, වඩා තරුණ සාමාජියා අප වෙනුවෙන් තවත් වසර ගණනාවක් වැඩ කළ හැකි බැවින් මා ඔහුව
උසස් කළ යුතුද?

A **නැත. අපි රැකියා තීරණ ගන්නේ රැකියාව සම්බන්ධ කුසලතා, ජයග්‍රහණ සහ කාර්ය සාධනය මත පදනම්ව පමණකි. අපි කිසි විටෙකත් වයස හෝ වෙනත් රැකියාව හා සම්බන්ධ නොවන ලක්ෂණ පදනම් කරගෙන තීරණ නොගනිමු.**

Q මගේ කළමනාකරු විසින් පුහුණු අවස්ථා සඳහා සාමාජිකයන් ඉදිරිපත් කර නැත. මා සිතන ආකාරයට මෙයට හේතුව ඔවුන් ගැබ්ගෙන තිබීම විය හැකිය, එය නිවැරදි ද?

A **නැත. සියලුම සාමාජිකයන් සඳහා සාධාරණව පුහුණු අවස්ථා සඳහා ලද හැකිව තිබිය යුතුය. ඔබට ගැටළුවක් ඇති අතර ඔබට ඔබේ කළමනාකරු වෙත මෙම කරුණ සෘජුවම ඉදිරිපත් කළ නොහැකි යැයි ඔබට හැඟේ නම්, ඔබට වෙනත් කළමණාකරුවෙකුට හෝ ඔබේ අධ්‍යක්ෂවරයාට කතා කිරීමට හෝ ඔබේ පිරිස් කණ්ඩායම හෝ (Protector Line) ඇමතීමට හැකිය.**

Q ආබාධිතව සිටින සම්මුඛ පරීක්ෂණ අපේක්ෂකයෙකු, ඔවුන්ගේ සම්මුඛ පරීක්ෂණය තමාට පිවිසිය හැකි ස්ථානයක් අසල පවත්වන ලෙස ඉල්ලා තිබේ. මම එම වෙනස සිදුකළ යුතුද?

A **ඔව්, ආබාධ සහිත අපේක්ෂකයන්ට අවාසි සහගත නොවන බව සහතික කිරීම සඳහා සාධාරණ ලෙස කළහැකි තාක් දුරට සාධාරණ ලෙස වෙනස්කරදීම් මගින් සහාය විය යුතුය.**

Q මගේ කළමනාකරු සඳුදා දිනවල දී අපගේ කණ්ඩායමේ රැස්වීම් පවත්වයි, එවිට ඇයට අප සමග ඇතුල් වී සතිය සැලසුම් කළ හැකිය. අපගේ සාමාජිකයන් දෙදෙනෙකු අර්ධකාලීනව රැකියාව කරන අතර සඳුදා දිනවල රැකියාව නොකරයි. එමගින් ඔවුන්ව බැහැර කෙරෙන බැවින් මෙම ක්‍රියාව අසාධාරණ යැයි මම සිතමි. මම මගේ කළමනාකරුට කතා කළ යුතුද?

A **ඔව්, ඔබේ ගැටළු ඔබේ කළමනාකරුට ඉදිරිපත් කරන්න. හැකියාවක් තිබේ නම්, ඔබේ කළමනාකරු සියලු සාමාජිකයන්ට සහභාගී විය හැකි වන පරිදි කණ්ඩායම් රැස්වීම් සංවිධානය කළ යුතුය.**

ගෞරවය, ගරුත්වය සහ සාධාරණ ලෙස සැලකීම

එය ගැටළුවක් වන්නේ ඇයි?

වෙළෙඳාමක් ලෙස ටෙස්කෝ හට අපගේ සියලු සාමාජිකයන්ගේ යහපැවැත්ම, ආරක්ෂාව සහ ගෞරවය අතිශයින් වැදගත් ය. අපගේ ගනුදෙනුකරුවන්, වෙනත් සාමාජිකයන්, සැපයුම්කරුවන් හෝ වෙනත් අයෙකු සම්බන්ධයෙන් වුවත් අපගේ ව්‍යාපාරයේ ඕනෑම ක්ෂේත්‍රයක පිළිගත නොහැකි හැසිරීම අපි ඉවසන්නේ නැත. සාමාජිකයන්ට වැඩ කිරීමට ආරක්ෂිත හා විවෘත පරිසරයක් ටෙස්කෝ විසින් ලබා දෙන බවට වග බලා ගැනීමේ වගකීම අප සියලු දෙනා සතුව පවතී.

එක් සංස්කෘතියක පිළිගත හැකි නමුත් වෙනත් සංස්කෘතියක පිළිගත නොහැකි ක්‍රියා හෝ හැසිරීම් සඳහා අපි සංවේදී විය යුතුවෙමු. මෙම හැසිරීම් වලින් සමහරක් අප ක්‍රියාත්මක වන වෙනත් රටවල දී නීති විරෝධී වීමට පවා ඉඩ ඇත. ටෙස්කෝ තුළ කරදර සහ හිරිහැර කිරීම පිළිගත නොහැකිය. මෙම ක්‍රියාවන් අපගේ අගයන්ට පටහැනි වන අතර, රාජකාරියේ යෙදීමේ දී සිය යුතුකම් ඉටු කිරීමට සාමාජියාට ඇති හැකියාව කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකිය. පිළිගත නොහැකි හැසිරීමකට සම්බන්ධ වූ බවට තහවුරු වූ සාමාජිකයන් සේවයෙන් පහ කිරීම ඇතුළු විනය ක්‍රියාමාර්ග සහ නීතිමය ක්‍රියාමාර්ග පවා විය හැකි එවැනි බරපතල ප්‍රතිවිපාකවලට මුහුණ දිය හැකිය.

ඒ වෙනුවෙන් මා කළ යුත්තේ කුමක්ද?

- ඔබ සැලකුම් ලැබීමට කැමති පරිද්දෙන් සියලු දෙනාටම සලකමින්, පිළිගැනෙන හා ගෞරවනීය සේවා පරිසරයක් නිර්මාණය කරන්න.
- නුසුදුසු විහිළු හෝ අදහස් දැක්වීම ඇතුළුව එදිරිවාදී හෝ බියගන්වන සේවා පරිසරයක් නිර්මාණය කිරීමක් ලෙස කණ්ඩායමේ කිසිවෙකු විසින් සැලකීමට ඉඩ ඇති හැසිරීමක නිරත නොවන්න.
- නින්දා සහගත, අපහාසාත්මක, හිරිහැරකාරී හෝ වෙනත් ආකාරයකින් අහිතකර බවට සැලකිය හැකි ද්වේෂ සහගත කටකතා හෝ ඕපාදූප පැතිරවීමෙන් වළකින්න.
- මත්ද්‍රව්‍ය හෝ මධ්‍යසාරවල බලපෑමෙන් තොරව ආරක්ෂිත ආකාරයකින් වැඩ කිරීමෙන් ඔබේ කාර්ය සාධනය පිළිබඳ වගකීම ගන්න. මත්ද්‍රව්‍ය හෝ මධ්‍යසාර භාවිතා කර එහි බලපෑම යටතේ වැඩ කිරීම ඔබට සහ අනෙක් අයට අනතුරුදායක බව සහ, ආරක්ෂක අවදානම් ඇති කරන බවත් එය නොඉවසනු ඇති බව සහ නීති විරෝධී විය හැකි බව ඔබ වටහා ගනී.
- ඔබ වැඩ කරන ස්ථානයෙන් පිටත අවස්ථාවලට සහභාගී වන විට ඔබ සේවා ස්ථානයේ දී හැසිරෙන ආකාරයට හැසිරෙන්න. සමාගම විසින් සංවිධානය කරන අවස්ථා අතර නත්තල් සාද, කණ්ඩායම් ඉසවු සහ සමාජ සංචාර වැනි සමාජයීය ඉසවු ඇතුළත් වේ.

ප්‍රශ්න සහ පිළිතුරු

Q මගේ කළමනාකරු අපගේ කණ්ඩායමේ සාමාජිකයන් ඉතා තැතිගන්වන සහ බොහෝ විට පරිභව කරන අයෙක් විය හැකිය. ඔහු පරිපූර්ණවාදියෙකු බව අපි දනිමු, නමුත් එය අපගේ රැකියාව ප්‍රීතිමත් නොවන හා දුෂ්කර එකක් කරයි. මම හඬ අවදි කළහොත් ඔහු වඩා අයහපත් විය හැකි යැයි මම සිතමි. මා කළ යුත්තේ කුමක්ද?

A **කවුරුන් විසින් කළත් පරිභව කරන හෝ හිරිහැර කිරීමේ හැසිරීම කිසි විටෙකත් අනුමත කළ නොහැකිය. අපගේ සංස්කෘතිය ගෞරවය හා අන්තර්ග්‍රහණය සහිත එකක් වන අතර එවැනි ක්‍රියා කිසිවක් ඇතොත් වෙනත් කළමනාකරුවෙකුට, පිරිස් කළමනාකරණ කණ්ඩායමට හෝ (Protector Line) හරහා වාර්තා කළ යුතුය. යහපත් චේතනාවෙන් ගැටළු ඉදිරිපත් කරන සාමාජිකයන්ට අපි සැමවිටම සහය දෙන්නෙමු.**

Q මගේ මිතුරෙක් මට රළු විහිළු සහිත විද්‍යුත් පණිවිඩයක් එවූ අතර ඒවා ඉතා හාස්‍යජනක බව මම සිතමි? මට මගේ කණ්ඩායමේ සාමාජිකයන්ට එය විද්‍යුත් තැපෑලෙන් යැවිය හැකිද?

A **නැත. අපි සියලු සාමාජිකයන්ට ගරුත්වයෙන් හා ගෞරවයෙන් සලකන අතර ඔබ විහිළුවක් ලෙස සලකන දේ අන් අය විසින් නිග්‍රහ කිරීමක් හෝ අපහාස කිරීමක් ලෙස සැලකිය හැකිය. ඔබේ ක්‍රියා වරදකාරී, අපවාදාත්මක හෝ අන් අය බියගන්වන ඒවා විය හැකිදැයි නිතරම ඔබගෙන්ම විමසන්න. ඔබ වැඩ කරන අතරතුර නුසුදුසු දේවල් කිසිවක් බැලීම ද මෙයට ඇතුළත් වේ.**

Q සාමාජිකයකුට නිවසේ යම් අමාරු කාලයක් උද්ගතවී තිබෙන බව මම දනිමි. මෑතක සිට, ඔවුන් ඉතා ප්‍රමාද වී සේවයේ යෙදෙන අතර සමහර විට ඔවුන් මත් වී සිටින බවක් පෙනෙන්නට තිබේ. ඔවුන් තවමත් ඔවුන්ගේ රාජකාරිය කරගෙන යන නිසා මම යමක් පැවසිය යුතුදැයි මට විශ්වාස නැත. මම කතා කළ යුතු ද?

A **ඔව්. ඔවුන් තමන්ට හෝ අන් අයට අනතුරුදායක විය හැකි හැසිරීම්වල නිරත වන බව ඔබ විශ්වාස කරන්නේ නම්, ඔබේ සාමාජියාගේ යහපත සඳහා ඔබ සැමවිටම ඔබගේ ගැටළු ඉදිරිපත් කළ යුතුය. මෙයට ඖෂධ හෝ මධ්‍යසාර භාවිතය ඇතුළත් වේ. ඔබට ඔවුන් සමඟ ඍජුවම කථා කළ නොහැකි නම්, ඔබේ පිරිස් කණ්ඩායම හෝ කළමනාකරු සමග කතා කරන්න.**

Q පිරිමි කළමණාකරුවෙකු කාන්තා සාමාජිකයකු සමග නුසුදුසු ලෙස හැසිරීම ගැන මම කනස්සල්ලට පත්ව සිටිමි. ඔවුන් කතා කරන විට ඔහු ඇයට ඉතා සමීපව සිටින අතර ඔහු ඇයට whatsapp හරහා පුද්ගලික පණිවුඩ යවන බව මම දනිමි. මා කළ යුත්තේ කුමක්ද?

A **ඔබ මුල් අවස්ථාවේ දී ඔබේ ගැටළු පිළිබඳව කළමනාකරු දැනුවත් කළ යුතුය. ඔබට ඔබේ ගැටළු කළමනාකරු වෙත ඉදිරිපත් කිරීමට අපහසු බව දැනේ නම්, ඔබට ඔබේ පිරිස් කණ්ඩායම ඇමතීමට හෝ (Protector Line) හරහා මෙය ඉදිරිපත් කිරීමට හැකිය. හිරිහැර කිරීම සම්බන්ධ සියලු කරුණු බරපතල ලෙස සැලකෙන අතර විමර්ශනය කෙරෙනු ඇත.**

මට තවත් දේ සොයාගත හැක්කේ කොතැනින්ද?

- පිරිස් කළමනාකරණ කණ්ඩායම
- කරදර සහ හිරිහැර පිළිබඳ ප්‍රතිපත්තිය

3. සාධාරණ වෙළඳාම

සැපයුම්කරුවන් සමග ඇති අපගේ ශක්තිමත් සබඳතා අවදානමට ලක් නොකර අපගේ ගනුදෙනුකරුවන් සඳහා පළමුවැන්නා වීමට අපගේ අගයන් අපට උපකාරී වේ.

චර්යා සංග්‍රහයේ මෙම කොටස අපගේ වෙළඳසැල්වල විකුණන නිෂ්පාදන අපි මිලට ගන්නා ආකාරය පිළිබඳව තීරණාත්මක වන කරුණු ආවරණය කරයි.

තරඟ නීති	පිටුව 28
සම්බාධක සහ අපනයන පාලන	පිටුව 30
මානව හිමිකම් සහ සදාචාර සම්පන්න වෙළඳාම	පිටුව 32
සැපයුම්කරුවන් ආරක්ෂා කරන නීති	පිටුව 34
වෙළඳ නාම සහ බුද්ධිමය දේපල	පිටුව 36

තරඟ නීති

එය ගැටළුවක් වන්නේ ඇයි?

අපගේ පාරිභෝගිකයන් අපි සැම වෙළඳපලකම සාධාරණව හා ස්වාධීනව තරඟ කරනු ඇතැයි අපේක්ෂා කරයි. සාධාරණ තරඟකාරීත්වය අඩු මිල ගණන්, වඩා පුළුල් තේරීමක් සහ වඩා හොඳ නිෂ්පාදන ගෙන එයි. අපගේ පාරිභෝගිකයන්ට හොඳම මිලදී ගැනීමේ අත්දැකීමක් ලබා දීමට අපි අපගේ තරඟකරුවන් සමග දැඩිව තරඟ කරන්නෙමු.

තරඟකාරීත්වය ආරක්ෂා කිරීම සඳහා අපගේ සියලුම වෙළඳපලවල නීති සම්පාදනය පවතින අතර නීතිය කඩ කරන සමාගම් සහ පුද්ගලයන්ට සැලකිය යුතු දඩුවම් ලැබේ. විමර්ශන ව්‍යාපාරයට බාධාකාරී හා මිල අධික වන අතර පාරිභෝගිකයන් අප කෙරෙහි තබන විශ්වාසයට හානි කළ හැකිය.

ඒ වෙනුවෙන් මා කළ යුත්තේ කුමක්ද?

තරඟකරුවන් හා සම්බන්ධවීම

- සැමවිටම ස්වාධීනව ක්‍රියා කරන්න. කිසි විටෙකත් තරඟකරුවන් සමග අප අතර තරඟය අඩු කිරීමට එකඟ නොවන්න. මිල ගණන් ස්ථිර කිරීමට හෝ අප ක්‍රියාත්මක වන්නේ හෝ නොවන්නේ කොතැනද යන්නට එකඟවීමට ඔබට නොහැක.
- ඔබ තරඟකරුවන්ගෙන් රහස්‍ය, වාණිජමය වශයෙන් සංවේදී තොරතුරු ඉල්ලීම, ලැබීම හෝ ඔවුන් සමග හුවමාරුව නොකළ යුතුය. තීරණ ගැනීමට උපකාර කිරීමට ඔබට දත්ත ගබඩාවෙ ඇති තොරතුරු භාවිතා කළ හැකිය.

සැපයුම්කරුවන් හා සම්බන්ධවීම

- ඔබ සැපයුම්කරුවෙකුගෙන් තරඟකරුවෙකු පිළිබඳ රහස්‍ය, වාණිජමය වශයෙන් සංවේදී තොරතුරු ඉල්ලීම හෝ ලැබීම නොකළ යුතුය.
- අපගේ සැපයුම්කරුවන්ගේ රහස්‍ය තොරතුරු රහසිගතව තබා ගන්න සහ එය ඔවුන්ගේ තරඟකරුවන් සමග හුවමාරු කිරීමෙන් වළකින්න.
- අපට තීරණ ගැනීමට උපකාර කිරීමට දත්ත ගබඩාවෙ තොරතුරු ලබාදෙන ලෙස ඔබට සැපයුම්කරුවන්ගෙන් ඉල්ලීමට හැකිය.

සිල්ලර මිල ගණන් නියම කිරීම

- සැමවිටම ස්වාධීනව සිල්ලර මිල ගණන්
- තීරණය කරන්න.
- සැපයුම්කරුවන් සමග මිල සාකච්ඡා කිරීම්වල දී සැම විටම පිරිවැය මිල ගණන් කෙරෙහි අවධානය යොමු කරන්න. සැපයුම්කරුවන්ට අප වෙත නිර්දේශිත මිල ගණන් ලබා දිය හැකි නමුත් ස්ථාවර හෝ අවම මිල ගණන් ලබා දිය නොහැක.

පසුගමන ක්‍රියාවලිය

- ඔබට තොරතුරු ලැබුනොත් හෝ තරඟකරුවන් හෝ සැපයුම්කරුවන් සමග ගැටළු ඇති කරවන වෙනත් සබඳතා තිබේ නම්, ඔබ පසුගමන ක්‍රියාවලිය අනුගමනය කළ යුතුය. ඔබ සක්‍රියව සහභාගී වී නොතිබුණත් නැතහොත් වැරදීමකින් තොරතුරු ලබාගෙන තිබුණ ද, හුදෙක් තොරතුරු නොසලකා හැරීම පමණක් ප්‍රමාණවත් නොවේ.

ලේඛන නිර්මාණය

- අපගේ ව්‍යාපාරය, අපගේ පාරිභෝගිකයන්, සැපයුම්කරුවන් හෝ තරඟකරුවන් පිළිබඳ ලිවීමේදී සැලකිලිමත් වන්න. විමර්ශනයකදී නියාමකයින් විසින් විද්‍යුත් තැපැල්, පණිවුඩ, කමිටු පත්‍රිකා සහ දේපල වාර්තා ඇතුළු බොහෝ අභ්‍යන්තර ලියකියවිලි බැලීමට හැකි බව මතක තබා ගන්න.

මට තවත් දේ සොයාගත හැක්කේ කොතැනින්ද?

- සමූහයේ නෛතික තරඟ නීති කණ්ඩායම හෝ දේශීය නෛතික කණ්ඩායම
- තරඟ ප්‍රතිපත්තිය සහ මාර්ගෝපදේශය
- පසුගමන ක්‍රියාවලිය සඳහා මග පෙන්වීම

ප්‍රශ්න සහ පිළිතුරු

Q වෙළඳ සංගම් රැස්වීමකට සහභාගි වන ලෙස මගෙන් ඉල්ලා ඇත. මට සහභාගී විය හැකිද?

A **ඔව්, මෙම රැස්වීම් ඒවාටම ගැටළු සහගත නොවන ඒවා වන අතර ඒවා වෘත්තීය-තරඟකාරී විය හැකිය. කෙසේ වෙතත්, සාමාන්‍ය තරඟ කිරීමේ නීති අදාළ වන අතර - ඔබ තරඟකරුවෙකු සමග වාණිජමය වශයෙන් සංවේදී තොරතුරු සාකච්ඡා කිරීම, අනාවරණය කිරීම හෝ හුවමාරු නොකරන බවට වග බලා ගන්න. "තරඟකරුවන් සමග රැස්වීම් පැවැත්වීම" මාර්ගෝපදේශ බලන්න.**

Q මට රැස්වීමක් සඳහා එක් සැපයුම්කරුවෙකුට වැඩි ගණනකට ආරාධනා කළ හැකිද?

A **වරින් වර, සැපයුම්කරුවන්ට ඒකාබද්ධ රැස්වීමකට, නිදසුනක් වශයෙන්, අපගේ ව්‍යාපාරයේ ප්‍රධාන වෙනස්කම් පිළිබඳව සැපයුම්කරුවන් දැනුවත් කිරීම හෝ සැපයුම්දාම ගැටළු සම්බන්ධයෙන් යහපත් පරිචයන් සාකච්ඡා කිරීම සඳහා ආරාධනා කිරීම සංවේදී විය හැකිය. කෙසේ වෙතත්, බොහෝ විට තරඟකරුවන් වන සැපයුම්කරුවන් සම්බන්ධ වන නිසා මෙම රැස්වීම් සංවේදී විය හැකිය. "ඒකාබද්ධ සැපයුම්කරුවන්ගේ රැස්වීම්" මාර්ගෝපදේශය පරිශීලනය කරන්න සහ රැස්වීම් අතරතුර නුසුදුසු ක්‍රියාකාරකම් සිදු නොවන බවට වග බලා ගන්න.**

Q මට මිතුරෙකුගෙන් තරඟකරුවෙකු පිළිබඳ වාණිජමය වශයෙන් සංවේදී තොරතුරු ලැබී ඇත. මට එය නොසලකා හැරිය හැකිද?

A **නැත, අවිධිමත් ආකාරයකින් ලැබුණත් එම තොරතුරු නොසලකා හැරීම ප්‍රමාණවත් නොවේ. ඔබ එම තොරතුරු දෘශ්‍යමය ලෙස නොසලකා හැරීම සහ ඔබ මෙම තොරතුරු භාවිතා කර නොමැති බව පෙන්වීමට විගණන මාර්ගයක් ඇති බව සහතික කිරීම සඳහා නිර්මාණය කර ඇති පසුගමන ක්‍රියාවලිය අනුගමනය කළ යුතුය.**

සම්බාධක සහ අපනයන පාලන

එය ගැටළුවක් වන්නේ ඇයි?

වරින් වර, රජයන් ඇතැම් රටවලින් මිලදී ගැනීම හෝ ඒවායේ සංචාරය කිරීම සඳහා සීමා පනවයි. අපට සමහර නම් කළ පුද්ගලයින් සමග වෙළඳාම් කිරීම ද තහනම් විය හැකිය. අපි ලොව පුරා ව්‍යාපාර කරන විට මෙම සීමා පිළිබඳව සැමවිටම දැනුවත්ව සිටිය යුතුය. ඇතැම් රටවල්, සමාගම් හෝ පුද්ගලයන් සමග ව්‍යාපාර කරන විට සම්බාධක හෝ සීමා පිළිබඳව අප දැනුවත්ව සිටීම ගෝලීයකරණය වූ වර්තමාන ලෝකයේ, රජයන් පමණක් නොව, අපගේ පාරිභෝගිකයන් ද අපගෙන් අපේක්ෂා කරයි.

අපි වෙළඳ සීමා කඩ කළහොත්, මෙය අපගේ වෙළඳ නාමය කෙරෙහි පාරිභෝගිකයන් තුළ ඇති විශ්වාසයට හානි කළ හැකි අතර ව්‍යාපාරයට සහ සාමාජිකයන්ට සැලකිය යුතු මූල්‍යමය දඩ සහ සිරගත කිරීම් පවා විඳින්නට සිදු විය හැකිය.

ඒ වෙනුවෙන් මා කළ යුත්තේ කුමක්ද?

ඔබ ජාත්‍යන්තරව භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීම, ප්‍රවාහනය කිරීම හෝ විකිණීම හා සම්බන්ධ නම්, මේවා සම්බන්ධයෙන් සැලකිලිමත් වන්න:

- කිසියම් රටකින් මිලදී ගැනීම හෝ එරටට විකිණීම සුදුසු ද යන්න සලකා බලන්න.
- සම්බාධක හෝ සංචාරක සීමාවන්ට යටත් රටවල් වලින් මිලදී ගැනීමෙන් හෝ සංචාරය කිරීමෙන් වැළකීම.
- UN හෝ අනෙක් සම්බාධක මුර-ලැයිස්තුවල සිටින පුද්ගලයින් හෝ සමාගම් සමග වැඩ නොකිරීම.
- ඔබේ ක්‍රියාකාරකම් සඳහා යම් සීමා හෝ සම්බාධක අදාළවේද යන්න ඔබට අපැහැදිලි නම් නීති උපදෙස් ඉල්ලන්න.
- ඔබේ නව සැපයුම්කරුවන් සමග වෙළෙඳාමක් ආරම්භ කිරීමට පෙර ඔවුන්ව නිසි ලෙස පරීක්ෂා කර අනුමත කර ඇති බවට වග බලාගන්න. අවංකත්වයේ නිසි-සම්ප්‍රජන්‍යතාව සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීම මෙයින් අදහස් වේ.
- යමෙකු වෙළඳ සීමාවන් උල්ලංඝනය කරන බව ඔබ විශ්වාස කරන්නේ නම් හඩ අවදි කරන්න: සැක සහිත සියලු උල්ලංඝනයන් ඔබේ දේශීය නීති අධ්‍යක්ෂවරයාට හෝ (Protector Line) භාවිතා කිරීමෙන් වාර්තා කළ යුතුය.

මට තවත් දේ සොයාගත හැක්කේ කොතැනින්ද?

- සමූහයේ නෛතික ව්‍යාපාර අවංකත්ව කණ්ඩායම හෝ දේශීය නෛතික කණ්ඩායම
- වගකිවයුතු මූලාශ්‍රකරණ කණ්ඩායම හෝ දේශීය තත්ව කණ්ඩායම

ප්‍රශ්න සහ පිළිතුරු

Q මම සැපයුම් ලබාගැනීමට නව වෙළඳපලවල් සොයන ගැනුම්කරුවෙක්මි. මට භාවිතා කිරීම ආරම්භ කිරීමට අවශ්‍ය විශිෂ්ට සැපයුම්කරුවෙකු මා හට හමු විය. ව්‍යාපාරය නොව සමාගමේ හිමිකරු සම්බාධක වලට ලක්වී ඇති රටක සිටීම හැටළුවක් වන්නේ ද?

A **ඔව්. සම්බාධක නීති බොහෝ විට ඉතා පුළුල් වන අතර ගැටළුවට ලක්ව ඇති රටට වඩා වැඩියෙන් සම්බාධකය යටතේ ඇති රටේ සියලු ජාතීන් හෝ පුද්ගලයන් ද ඇතුළත් වේ. ඔබ ව්‍යාපාර කරන්නේ කවුරුන් සමගදැයි සැමවිටම දැනගෙන, ක්‍රියා කිරීමට පෙර ඔබේ අධ්‍යක්ෂවරයාගෙන් උපදෙස් ලබාගන්න.**

Q අපට ව්‍යාපාර කළ නොහැකි රටවල් තිබේද?

A **පළමු අවස්ථාවේදී, ඔබේ නෛතික කණ්ඩායම සමග කතා කරන්න. දේශපාලනික හා රාජ්‍ය තාන්ත්‍රික සංවර්ධන යනු සම්බාධනයට ලක්වූ රටවල් සහ පුද්ගලයින්ගේ ලැයිස්තුව කලින් කලට වෙනස් වනු ඇති බව වන අතර ඔබට විශ්වාස නැතිනම් පරීක්ෂා කිරීම වැදගත්ය. අප රටක් තුළ පළමු වරට ව්‍යාපාර කරන විට මෙය විශේෂයෙන් වැදගත් වේ.**

Q මම ටෙස්කෝ නිෂ්පාදන පළමු වරට අලුත් රටක අලෙවි කිරීම සඳහා තොග ගනුදෙනුවක් ආරම්භ කිරීමට කැමැත්තෙමි. ව්‍යාපාරය හොඳ මට්ටමක පවතින බව පෙනෙන තාක් කල් මම වෙනත් කිසිවක් සලකා බැලිය යුතුද?

A **ඔව්. විශේෂිත වෙළඳ සීමාවන්, සම්බාධක හෝ අප එම රටට අලෙවි නොකිරීමට වෙනත් හේතු තිබේද යන්න ඔබ ආයතනික කටයුතු සහ නීති අංශය සමග සාකච්ඡා කළ යුතුය. පාරිභෝගිකයා සමග නිසි-සම්ප්‍රජන්‍යතාව පැවැත්වීම සඳහා නීති අංශය ද ඔබට සහය වනු ඇත, එවිට ඔවුන් සමග වෙළඳ සම්බන්ධතාවයක් ආරම්භ කිරීමට පෙර ඔබ ඔවුන් ගැන ප්‍රමාණවත් දෙයක් දැන ගනී.**

මානව හිමිකම් සහ සදාචාර සම්පන්න වෙළඳාම

එය ගැටළුවක් වන්නේ ඇයි?

අපි ගෝලීය සමාගමක් වන අතර දිනපතා ලොව පුරා මිලියන ගණනක් වූ ජනතාවක් සමග අන්තර් ක්‍රියා කරන්නෙමු. අපට අපගේ සාමාජිකයන්, අපගේ පාරිභෝගිකයන්, සැපයුම් දාමය පුරාම වැඩ කරන්නන් සහ අප ක්‍රියාත්මක වන ප්‍රජාවල මානව හිමිකම්වලට ගරු කිරීම වගකීමක් තිබේ.

අපි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ප්‍රඥප්තිය (UN's Declaration of Human Rights) සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූලික සම්මුති (Core Conventions of the International Labour Organisation) වලට පූර්ණ සහය ලබාදෙමු. කිසියම් ලෙසකින් පුද්ගලයෙකුගේ මානව හිමිකම් කඩ කිරීම වැරදිය. "සැම කෙනෙකුම සැලකුම් ලැබීමට කැමති ආකාරයට සැලකීම" සහ "සැම කුඩා උපකාරයක්ම විශාල වෙනසක් කරයි" යන අපගේ සාරධර්ම මගින් මගපෙන්වීම ලබන අපි අයිතිවාසිකම්වලට ගරු කරන බවත් ඕනෑම උල්ලංඝනයකට පිළියම් යෙදෙන බවත් සහතික කිරීමට කටයුතු කරන්නෙමු. මේ සඳහා, අපි අපගේ සැපයුම්කරුවන්ට ETI මූලික චර්යා සංග්‍රහයට අනුකූලව කටයුතු කිරීමට සහ ඔවුන්ගේ සැපයුම් දාමවල නිසි-සම්ප්‍රජන්‍යතාවය භාරගැනීමට, මානව හිමිකම් පිළිබඳ අපගේ ප්‍රමිති සපුරාලීමට ඔවුන්ට උපකාර කිරීමට සහය වෙමු.

අපගේ සැපයුම් දාමයේ සහ අපගේම මෙහෙයුම් වලදී, මෙයින් අදහස් කරන්නේ සේවකයන්ට ශිෂ්ඨ ලෙස සැලකීම සහතික කිරීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝන කිසිවක් ඇතොත් ඒ සඳහා පිළියම් යෙදෙන බවයි. අපගේම ව්‍යාපාරික ක්‍රියා කලාපයන් කම්කරු ප්‍රමිති ගැටළු වලට හේතුව නොවන බවට ද අප සැලකිලිමත් විය යුතුය. අප දන්නා සහ විශ්වාස කරන සැපයුම්කරුවන් සමග දිගුකාලීන සබඳතා වර්ධනය ය කර ගැනීමෙන් වැඩිදියුණු කිරීම් සඳහා ආයෝජනය කිරීමට ඔවුන්ට පහසු කරනු ඇති අතර එමගින් අපට තවත් එක්සත් බවක් ළඟා කර ගත හැකිය.

සාමාජිකයන් සඳහා, දේශපාලන කටයුතුවලදී තනිව හෝ වෘත්තීය සමිති සාමාජිකත්වය තුළින් සාමූහිකව සිවිල් සමාජයට පූර්ණ ලෙස සහභාගී විය හැකි බව සහතික කිරීම මෙයට ඇතුළත් වේ.

ඒ වෙනුවෙන් මා කළ යුත්තේ කුමක්ද?

- සැපයුම්කරුවන්ගේ වටිනාකම් මෙන්ම මිල හා ගුණාත්මකභාවය මත පදනම්ව සැපයුම්කරුවන් තෝරාගෙන ශක්තිමත් සහ විශ්වාසී හවුල්කාරිත්වයක් ගොඩනගා ගන්න.
- TQC (අපගේ නිෂ්පාදන තත්ත්ව වේදිකාව) පිළිබඳ මානව හිමිකම් ප්‍රතිපත්තිය සහ නිතර අසන ප්‍රශ්න ඔබට හුරුපුරුදු බවට වග බලාගෙන, මෙය ඔබේ සැපයුම්කරුවන් සමග හුවමාරු කරගන්න.
- සිදු කළ සැපයුම් බැඳීම් සැමවිටම ඉටු කරන්න. අවසාන මොහොතේ වෙනස්කම් කරන ලෙස ඉල්ලා සිටීම හවුල්කරුවන් නියමිත දිනට සරිලන පරිදි කොන් කැපීමට හේතු විය හැකි බව ඔබ තේරුම්ගනී. මෙය සේවා තත්ව සහ නිෂ්පාදනවල ගුණාත්මකභාවය යන දෙකටම හානි කළ හැකිය.
- ගැටළු හඳුනාගත් විට, පැහැදිලි වැඩිදියුණු කිරීමේ සැලැස්මක් ලබාදීමට හවුල්කරුවන් සමග කටයුතු කරන්න.
- නිවැරදිව යැයි නොපෙනෙන දෙයක්, අවදානමට ලක්විය හැකි හෝ පසුබෑ ජනතාව හෝ වෙනස් කොට සැලකීමක් සිදුවනු ඔබ දුටුවහොත් හඬ අවදි කරන්න. අපි සැම විටම චෝදනා බැරෑරුම් ලෙස සලකා ඒ අනුව විමර්ශනය කරන්නෙමු.

මට තවත් දේ සොයාගත හැක්කේ කොතැනින්ද?

- Responsible Sourcing කණ්ඩායම හෝ දේශීය තත්ව කණ්ඩායම

ප්‍රශ්න සහ පිළිතුරු

Q මම සැපයුම්කරුවකුගේ සේවාස්ථානයකට ගිය අතර කම්කරුවන් අතර වාතාවරණය අපහසුදායක ලෙස දැනුණි. මම ඒ ගැන කළ යුත්තේ කුමක්ද?

A **Responsible Sourcing කණ්ඩායමට ඔබේ ගැටළු වාර්තා කරන්න. ඔබට ලබා දිය හැකි තොරතුරු කිසිවක් ඇතොත් ප්‍රයෝජනවත් වනු ඇත. ශ්‍රම බලකායේ ප්‍රධාන ගැටළු පිළිබඳව සැපයුම් කළමණාකරුවන්ගෙන් - සහ සේවකයන්ගෙන් ද විමසන්න. එය ටෙස්කෝ සඳහා මෙය කෙතරම් වැදගත්දැයි පෙන්වීමට උපකාරී වේ.**

Q අපගේ සේවා ස්ථානවල හෝ සැපයුම් දාමයේ අයිතිවාසිකම් උල්ලංඝනයක් සිදුවුවහොත් අප කුමක් කළ යුතුද?

A **අපි අප විසින් හඳුනා ගන්නා ඕනෑම ගැටළුවකට පිළියම් යෙදීමට සැමවිටම උත්සාහ කරමු. ගැටළුවට ටෙස්කෝ සාමාජිකයන් සම්බන්ධ නම්, ඔබේ දේශීය පිරිස් කණ්ඩායම අමතන්න හෝ (Protector Line) අමතන්න. ගැටළුව ඇත්තේ අපගේ සැපයුම් දාමයේ නම්, Responsible Sourcing හෝ ඔබේ දේශීය තත්ව කණ්ඩායම අමතන්න.**

Q සැපයුම් දාමවල වහල් සේවය පැවතිය හැකි බව මට මාධ්‍ය සහ මිතුරන් හරහා ඇසී ඇත. මෙම අවදානම විසඳීම සඳහා අප කුමක් කරන්නේද?

A **අපි කිසිඳු ආකාරයක වහල් සේවය හෝ බලහත්කාර ශ්‍රමය නොඉවසමු. මේවා සහ වෙනත් අවදානම් කළමනාකරණය කිරීම සඳහා අපගේ සැපයුම්කරුවන් සමග කටයුතු කරන ලොව පුරා විසිරී සිටින පූර්ණ කාලීන ශ්‍රම ප්‍රමිති විශේෂඥ කණ්ඩායමක් අප සතුව සිටී.**

Q අපි ගබඩාවේ විකුණන භාණ්ඩවලට පමණක් මානව හිමිකම් පිළිබඳ අපගේ ප්‍රතිපත්ති අදාළ වන්නේද?

A **නැත. ඉදිකිරීම් සමාගම්, කම්කරු නියෝජිතායතන සහ ප්‍රවාහන සමාගම් වැනි නැවත විකිණීම සඳහා නොවන භාණ්ඩ සහ සේවා සපයන සියලුම සැපයුම්කරුවන් අපගේ සදාචාරාත්මක වෙළඳ අවශ්‍යතා සපුරාලනු ඇතැයි අපි අපේක්ෂා කරමු.**

Q මම වෘත්තීය සමිතියකට බැඳීමට කැමතියි, නමුත් එය සාකච්ඡා ලබාදීම සඳහා ටෙස්කෝ විසින් හඳුනාගෙන ඇති එක නොවේ. මට සම්බන්ධ විය හැකිද?

A **ඔබ කැමති වෘත්තීය සමිතියකට බැඳීමට ඔබට නිදහස තිබේ. එකකට බැඳී නොසිටීමට ද ඔබට නිදහස තිබේ.**

සැපයුම්කරුවන් ආරක්ෂා කරන නීති

එය ගැටළුවක් වන්නේ ඇයි?

සැපයුම්කරුවන්ට සාධාරණව සැලකීම අපගේ සාර්ථකත්වයේ ප්‍රධාන දෙයක් වේ. අපගේ ගනුදෙනුකරුවන් සඳහා හොඳම දේ ලබා දීම සඳහා සැපයුම්කරුවන් සමග දීර්ඝ කාලීන, සහයෝගී සහ තිරසාර සබඳතා වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. එය අපගේ විශාල පියවර 6 න් එකක් වන"අපි විශ්වාසදායක හවුල්කාරිත්වයක් ගොඩනගමු" යන්න වේ.

බොහෝ රටවල් සුපිරි වෙළඳසැල් සහ ඒවායේ සැපයුම්කරුවන් අතර සැපයුම් සබඳතා නියාමනය කිරීමට නීති සම්පාදනයක් හඳුන්වා දී ඇත. උදාහරණයක් ලෙස, එක්සත් රාජධානියේ සිල්ලර භාණ්ඩ සැපයුම් භාවිත සංග්‍රහය (GSCOP) ටෙස්කෝ සහ එහි සිල්ලර භාණ්ඩ සැපයුම්කරුවන් අතර සම්බන්ධතාවය පාලනය කරයි. චෙක් ජනරජයේ, සැලකිය යුතු වෙළඳපල බලය පනත සිල්ලර වෙළඳුන් සහ සැපයුම්කරුවන්ගේ සම්බන්ධතා නියාමනය කරයි. උල්ලංඝනය කිරීම් පිළිබඳ පරීක්ෂණ මිල අධික හා කාලය වැය කළ හැකිය. සැලකිය යුතු දඩ මුදලක් ගෙවීමට සිදුවිය හැකි අතර පාරිභෝගික විශ්වාසයට හානි විය හැකිය.

එවැනි නීති නොපවතින තැන්වලදී පවා අප විසින් අපගේ සැපයුම්කරුවන්ට සාධාරණව හා අපගේ වටිනාකම්වලට අනුකූලව සැලකීම අත්‍යවශ්‍ය වේ. මෙය අපගේ සැපයුම්කරුවන් සමග දිගුකාලීන සබඳතා පෝෂණය කිරීමේ ප්‍රධාන කොටසක් වන අතර අපගේ සැපයුම්කාර (Protector Line) භාවිතා කර පූර්ණ විශ්වාසයෙන් යුතුව ගැටළු මතු කිරීමට අපගේ සියලුම සැපයුම්කරුවන්ට හැකි වේ.

ඒ වෙනුවෙන් මා කළ යුත්තේ කුමක්ද?

- සැපයුම්කරුවන් ආරක්ෂා කිරීම සඳහා නිර්මාණය කර ඇති ඔබේ වෙළඳපල තුළ පවතින නීති සහ භාවිත සංග්‍රහය තේරුම් ගෙන ඒවා අනුගමනය කරන්න.
- ඔබ සැපයුම්කරුවන් සඳහා කරන කැපවීම් වලට අනුව කටයුතු කරන්න - සැපයුම්කරුගේ ගිවිසුම් අතීතානුයෝගීව වෙනස් නොකරන්න.
- සියළුම සැපයුම්කරුවන්ගේ ගිවිසුම් ලිඛිතව සටහන් කරගෙන පිටපතක් තබා ගන්න.
- සැපයුම් විධිවිධානවල කිසියම් යෝජිත වෙනස්කම් ඇතොත් ඒ පිළිබඳව සාධාරණ කාලයක්ලබාදී තීරණ සමාලෝචනය කිරීමට සැපයුම්කරුවන්ට අවස්ථාවක් ලබාදෙන්න.
- සැපයුම්කරුවන් සමග සහයෝගයෙන් වැඩ කර ප්‍රතිපෝෂණයට සවන් දෙන්න. නිදසුනක් ලෙස සද්භාවයෙන් යුතුව සහ සැපයුම්කරුවන් සමග සාකච්ඡා කර පුරෝකථන සූදානම් කරන්න.
- නියමිත වේලාවට සහ එකඟ වූ ගෙවීම් නියමයන්ට අනුකූලව සැපයුම්කරුවන්ට ගෙවන්න.
- සැපයුම්කරුවෙකු පැමිණිලි කළහොත්, අත්‍යාවශ්‍ය නම් ඔබේ දේශීය නීති කණ්ඩායමේ සහය ඇතිව එය පිළිගෙන ඉක්මනින් විසඳන්න.
- සැපයුම්කරුවන් සමග සන්නිවේදනය කිරීමේදී කල්පනාකාරී හා සංවේදී වන්න: ලිඛිත සන්නිවේදන පහසුවෙන් වැරදි ලෙස අර්ථ දැක්වීමට හැකිය.

ප්‍රශ්න සහ පිළිතුරු

Q මට ප්‍රවර්ධනයක් සඳහා අරමුදල් සපයන ලෙස සැපයුම්කරුවෙකුගෙන් ඉල්ලිය හැකිද?

A **බොහෝ වෙළඳපලවල මෙයට අවසර දී ඇති නමුත් ඔවුන්ට දිය හැකි දායකත්වයේ ප්‍රමාණය පිළිබඳ සීමා පවතින අතර සැපයුම්කරුවන්ට කිසි විටෙකත් ප්‍රවර්ධනයකට සහභාගී වීමට බල නොකළ යුතුය.**

Q මම සාමාන්‍ය වෙළඳාමේ සේවය කරමි. මගේ වෙළඳපොලේ, නීති සම්පාදනය අදාළ වන්නේ සිල්ලර භාණ්ඩ සඳහා පමණි. මම නීති පද්ධතියත් අනුගමනය කළ යුතුද?

A **නීති පද්ධතිය පිළිබඳ ඔබට සැකයක් ඇත්නම්, ඔබේ දේශීය නීති කණ්ඩායමට කතා කරන්න. අපගේ සාමාන්‍ය ප්‍රවේශය වන්නේ රීති විශේෂිත නිෂ්පාදන සඳහා පමණක් අදාළ වුවද එම නීති පද්ධතිවල හරය පිළිපැදීමයි.**

Q GSCOP යටතේ ලැයිස්තුවෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය කුමක්ද?

A **සම්බන්ධතාවයක් අවසන් කිරීමට ඔබට සැමවිටම අව්‍යාජ වාණිජමය හේතුවක් තිබීම GSCOP හට අවශ්‍ය වේ. ඔබ සැපයුම්කරුට ලිඛිත දැනුම් දීමක් ලබාදිය යුතු අතර, ජ්‍යෙෂ්ඨ ගැණුම්කරුවෙකු මගින් තීරණය සමාලෝචනය කරවා ගැනීමට හෝ චර්යා සංග්‍රහ අනුකූලතා නිලධාරියා වෙත ඉදිරිපත් කළ හැක්කේ කෙසේද යන්න පැහැදිලි කළ යුතුය.**

Q මම පෝලන්තයේ සහ චෙක් ජනරජයේ අලෙවි කිරීමට පලතුරු මිලදී ගන්නා අතර මගේ "ආරවුල් විසඳීමේ නිලධාරියා" සමඟ කතා කිරීමට ඔවුන්ට අයිතියක් ඇති බව මගේ සැපයුම්කරු කියා සිටී. මෙය නිවැරදි ද?

A **ඔව්, ටෙස්කෝ යනු යුරෝපා සංගම් සැපයුම්දාම මූලාරම්භයට (EU Supply Chain Initiative) අත්සන් කළ ආයතනයක් වන අතර එය සැපයුම් දාමයේ සාධාරණත්වය පාලනය කරන අනිවාර්ය ක්‍රියා සංග්‍රහයකි. අපගේ ආරවුල් විසඳීමේ සම්බන්ධතාවය - සාමාන්‍යයෙන් මේ නීති අධ්‍යක්ෂකවරයාය, හට කථා කිරීමට ඔබේ සැපයුම්කරුට අයිතිය තිබේ.**

Q මගේ තරඟකරුවන් අපට වඩා ලාභදායී ලෙස නිෂ්පාදන අලෙවි කරයි. මට ශේෂය පියවා ගැනීමට කුමක් කළ හැකිද?

A **ඔබට ගනුදෙනුකරුවන්ට දිය හැකි හොඳම ගනුදෙනුව ලබා ගැනීම සඳහා ඔබ සැමවිටම සැපයුම්කරුවන් සමඟ සාකච්ඡා කළ යුතුය. සැපයුම්කරුගේ පිරිවැය මිල පිළිගත හැකිද යන්න පිළිබඳව ඔබට සාකච්ඡා කළ හැකි නමුත් සැපයුම්කරුවන් සමඟ සාකච්ඡා කිරීමේදී ඔවුන් පීඩාවට පත් නොකිරීමට වගබලා ගන්න සහ පවතින සැපයුම් ගිවිසුම්වලට අතීතයට බලපාන පරිදි වෙනස්කම් කිරීමෙන් වළකින්න.**

මට තවත් දේ සොයාගත හැක්කේ කොතැනින්ද?

- එක්සත් රාජධානියේ නෛතික නිෂ්පාදන කණ්ඩායම හෝ දේශීය නීති කණ්ඩායම

වෙළඳ නාම සහ බුද්ධිමය දේපල

එය ගැටළුවක් වන්නේ ඇයි?

ආකර්ෂණීය වෙළඳ නාම, නිෂ්පාදන සහ සේවා නිර්මාණය කිරීම හා පවත්වා ගැනීම පිළිබඳ ආඩම්බර සම්ප්‍රදායක් ටෙස්කෝ හි අප සතුව ඇත. F&F ඇඟළුම්වල සිට අපගේ හොඳම ආහාර පරාසය දක්වා අපගේ වෙළඳ නාම සහ නවෝත්පාදනයන් මගින් අපට ජනතාව පිරී පවතින වෙළඳපලක තරඟකාරී ස්ථානයක් ලබා දෙයි.

අපි පේටන්ට් බලපත්‍ර, සැලසුම් සහ ප්‍රකාශන හිමිකම්වල සිට, වෙළඳ ලකුණු සහ වෙළඳ රහස් දක්වාවන අපගේ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සැමවිටම සැලකිලිමත් විය යුතුය. අපගේ දේවල් ආරක්ෂා කිරීම අපගේ එකඟතාව නැතිව අන් අය විසින් එය පිටපත් කිරීම හෝ විකිණීම සිදු නොකරන බවට වග බලා ගනී.

අපි ටෙස්කෝ සඳහා නව නිෂ්පාදන සැලසුම්, වෙළඳ නාම හෝ නවෝත්පාදන නිර්මාණය කිරීමේ යෙදී සිටින්නේ නම්, අපි සැමවිටම වෙළඳ නාම සැලසුම් කිරීමේ ප්‍රමිති අනුගමනය කළ යුතුය. අපි අන් අයගේ IP අයිතීන්ට ගරු කරමු. යමෙකුගේ අදහස සොරකම් කිරීම ටෙස්කෝ මත අයහපත් ලෙස පිළිබිඹු කරමින් ගනුදෙනුකරුවන්ගේ විශ්වාසයට හානි කරන අතර අපට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රතිඵලය කිරීමට ඉඩ ඇත.

ඒ වෙනුවෙන් මා කළ යුත්තේ කුමක්ද?

- සැම විටම අපගේ පාරිභෝගිකයන් සඳහා මුල් නිර්මාණ සහ නිෂ්පාදන නිර්මාණය කිරීමට හෝ මූලෝත්පාදනය කිරීමට උත්සාහ කරන්න.
- වෙනත් පුද්ගලයින්ගේ අදහස් පිටපත් කිරීම, භාවිතා කිරීම හෝ ඉන් Hard copy ලබාගැනීම නොකරන්න.
- යෝජිත නිෂ්පාදන නමක්, සැලසුමක් හෝ නවෝත්පාදනයක් පිළිබඳව ඔබට කිසියම් සැකයක් ඇත්නම්, සැම විටම ටෙස්කෝ සන්නාම සැලසුම් ප්‍රමිති අනුගමනය කර නීති අංශයට කතා කරන්න.
- ඔබ නව අදහස් සංවර්ධනය කරන විට, ඒවා රහසිගතව තබාගෙන ඒවා ආරක්ෂා කරන ආකාරය පිළිබඳව නීති අංශය සමග කතා කරන්න.
- අපගේ වෙළඳ නාම හෝ වෙනත් බුද්ධිමය දේපළ භාවිතා කිරීමට තෙවන පාර්ශ්වයන්ට ඉඩ දීමට පෙර නීති අංශයෙන් උපදෙස් ලබා ගන්න.
- වෙනත් වෙළෙඳාමක් අපගේ අදහස් පිටපත් කරගෙන ඇති බව හෝ අපගේ IP අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බව ඔබ දැනගතහොත් ඔබේ ගැටළු ඉදිරිපත් කරන්න.
- ඔබ "අළු භාණ්ඩ" (සමහර විට "සමාන්තර භාණ්ඩ" ලෙස හැඳින්වේ) ආනයනය කිරීමට බලාපොරොත්තු වන්නේ නම් සැලකිලිමත් වන්න. එම භාණ්ඩ ප්‍රදේශය ව්‍යාජ නොවන බවත් තෙවනපාර්ශ්වයන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය නොවන බවත් සහතික කිරීම සඳහා විශේෂ නීති ක්‍රියාත්මක කර ඇත.

ප්‍රශ්න සහ පිළිතුරු

Q මම ගැහැණු ළමයින් සඳහා නව ටී-ෂර්ට් එකක් නිර්මාණය කරමි. මම වෙනත් කෙනෙකුගේ බුද්ධිමය දේපළ උල්ලංඝනයක් නොකරන බව මම සහතික කරගන්නේ කෙසේද?

A **ඔබේ වෙළඳපල සහ දැනටමත් එහි ඇති නිෂ්පාදන සහ මෝස්තර මොනවාදැයි දැනගන්න. පවතින අදහස් වලින් යමක් උපුටා ගැනීමට ඔබට නිදහස ඇත, නමුත් වෙනත් නිෂ්පාදනයක් පිටපත් නොකරන්න. ඔබගේ නව නිෂ්පාදනය භාවිතා කිරීම සුදුසුදැයි තහවුරු කිරීම සඳහා නීති කණ්ඩායම ඔබ සමග ඒ ගැන සාකච්ඡා කිරීමට කැමතිවනු ඇත.**

Q මම අපගේ බෙදාහැරීමේ මධ්‍යස්ථානවල ඵලදායිතාවය වැඩි දියුණු කළ හැකි නව තාක්ෂණයක්සංවර්ධනය ය කිරීම සඳහා තෙවන පාර්ශවයක් සමග වැඩ කිරීමට සැලසුම් කරමි. මා ගත යුතු පියවර මොනවාද?

A **ඔබ සැමවිටම තෙවන පාර්ශවය සමග නව තාක්ෂණයේ ඕනෑම IP එකක් හිමි වන්නේ කාටදැයි නියම කරන ගිවිසුමක් ඇති කර ගත යුතුය. නව තාක්ෂණය පේටන්ට් බලපත්‍රයකින් හෝ වෙනත් ආකාරයක බුද්ධිමය දේපල අයිතියකින් ආරක්ෂා කළ හැකිදැයි උපදෙස් දීමට ඔබේ නීති කණ්ඩායමට හැකිය.**

Q මගේ දේශීය වෙළඳ භූමියට පිටතින් මිලදී ගත් සහ ආනයනය කළ සන්නාමගත භාණ්ඩ (සමාන්තර භාණ්ඩ) විකිණීම ආරම්භ කිරීමට මම කැමැත්තෙමි. මා කළ යුත්තේ කුමක්ද?

A **ඔබ වෙළඳ නාමයේ හිමිකරුගේ අයිතිවාසිකම් උල්ලංඝනය නොකරන තාක් කල් මෙය හරි විය හැකිය. උදාහරණයක් ලෙස, අපට සමහර නීති රීතිවලට යටත්ව යුරෝපා සංගමය තුළ සමාන්තර භාණ්ඩ ගනුදෙනු කළ හැකිය. නීති රීති රටින් රටට වෙනස් වන අතර අවශ්‍ය නම් විශේෂඥ උපදෙස් ලබාදීමට නීති කණ්ඩායමට හැකිය.**

Q අපි වෙළඳපල කිහිපයක විකිණීමට අදහස් කරන බේකරි භාණ්ඩ නිෂ්පාදන ක් සඳහා නව වෙළඳ නාමයක් නිර්මාණය කරමින් සිටිමු. අපි වෙළඳ නාමයක් තෝරාගැනීමට යා යුත්තේ කෙසේද?

A **ටෙස්කෝ සන්නාම සැලසුම් ප්‍රමිති අනුගමනය කර ඔබේ නම සර්වසම හා සමාන භාණ්ඩ සඳහා භාවිතා වන වෙළඳ නාම වලට වඩා වෙනස් බවට වග බලාගන්න. ඔබ ඔබට සහාය වීමට අන්තර්ජාල සෙවීම් ද කළ යුතු අතර ඔබේ වෙළඳපල දැනුම භාවිතා කළ යුතුය. නමට නීතිමය ගැටළු තිබිය හැකි බැවින් ඉක්මනින් එක් වෙළඳ නාමයකට පමණක් බැඳී නොසිටින්න.**

මට තවත් දේ සොයාගත හැක්කේ කොතැනින්ද?

- එක්සත් රාජධානියේ නෛතික පාරිභෝගික කණ්ඩායම හෝ දේශීය නීති කණ්ඩායම
- ටෙස්කෝ සන්නාම සැලසුම් ප්‍රමිති

4. අපගේ කීර්තිය ආරක්ෂා කිරීම

නිවැරදි දේ කිරීමෙන් අපගේ ක්‍රියා මගින් අපි අපව හෝ ව්‍යාපාරය අවදානමට ලක් නොකරන බවත් ගෝලීය වෙළෙඳාමක් ලෙස අප මුහුණ දෙන අවදානම් පිළිබඳව අප දැනුවත් බවත් සහතික කරයි.

අප සහ අපගේ සමාගම වැරදි දේ කිරීමෙන් ආරක්ෂා කර ගත හැකි වැදගත් ක්ෂේත්‍ර ගණනාවක් චර්යා සංග්‍රහයේ මෙම කොටස මගින් ආවරණය කරයි.

වංචාව	පිටුව 40
අල්ලස්	පිටුව 42
ත්‍යාග සහ විනෝදාශ්වාදය	පිටුව 44
බැඳියා පිළිගැටුම්	පිටුව 46
පුණ්‍යාධාර	පිටුව 48
අභ්‍යන්තර ගනුදෙනු සහ වෙළඳපල අයථා භාවිතය	පිටුව 50
දේශපාලන කටයුත්තක නිරත වීම	පිටුව 52
නිවැරදි ගිණුම්කරණය සහ මුදල් විශුද්ධිකරණය	පිටුව 54
අපගේ තොරතුරු ආරක්ෂිතව තබා ගැනීම	පිටුව 56
බාහිර සන්නිවේදන සහ සමාජ මාධ්‍ය භාවිතා කිරීම	පිටුව 58

වංචාව

එය ගැටළුවක් වන්නේ ඇයි?

වංචාව අපගේ ව්‍යාපාරයට හානි කරන බරපතල අපරාධයක් වන අතර එය අපගේ පිරිවැය සහ ලාභ කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකිය. රැවටීම, වංචා කිරීම, බොරු කීම සහ වැදගත් කරුණු සැඟවීම වැනි විවිධාකාර වංචාකාරී හැසිරීම් හරහා සොරකම විස්තර කිරීමට වංචාව යන පදය බහුලව භාවිතා වේ. බදු පැහැර හැරීම තවත් ආකාරයක වංචාවකි; අප හෝ අප සමග වැඩ කරන වෙනත් අය දැනුවත්ව බදු පැහැර හැරීමට පහසුකම් සලසා ඇති බව සොයාගතහොත් ටෙස්කෝට එරෙහිව නඩු පවරා අසීමිත දඩවලට යටත් විය හැකිය.

සබැඳි ගනුදෙනු අතරතුර, සම්මාදම් වලදී, අපගේ බෙදා හැරීමේ පද්ධතිය හරහා භාණ්ඩ ප්‍රවාහනය කිරීමේදී හෝ කාර්යාලයේදී ඇතුළුව අපගේ ගනුදෙනුවල බොහොමයක් විවිධ කොටස් වල වංචාව සිදුවිය හැකිය.

ටෙස්කෝ වංචාවේ ගොදුර වන අතර, එබැවින් එය කවුරුන් සිදු කළත් ව්‍යාපාරය වංචා සහගත ක්‍රියාවෙන් ආරක්ෂා කිරීමට අප සියලු දෙනාටම වගකීමක් ඇත. සැමවිටම අවංකව කටයුතු කිරීම සඳහා අපි අපගේ සාමාජිකයන් කෙරෙහි සැලකිය යුතු විශ්වාසයක් තබන අතර, එබැවින් අපගේ ව්‍යාපාරයට එරෙහිව වංචාවක් සිදු වූ විට අපි නිරතුරුව විමර්ශනය කර ක්‍රියාමාර්ග ගන්නෙමු.

ඒ වෙනුවෙන් මා කළ යුත්තේ කුමක්ද?

- ප්‍රධාන රීතිය සරලය. සොරකම හෝ වෙනත් වංචනික ක්‍රියාවක් සිදුවන බවට ඔබට සැක සිතේ නම්, ඔබ හඬ අවදි කළ යුතුය. එය ඔබේ කළමනාකරුට, පුද්ගල හෝ ආරක්ෂක කණ්ඩායම් වෙත වාර්තා කරන්න හෝ ඔබේ දේශීය (Protector Line) අමතන්න.
- බදු පැහැර හැරීම ඇතුළුව වංචනික ක්‍රියාකාරකම් සඳහා ප්‍රසිද්ධ සමාගම් සමග ව්‍යාපාර නොකරන්න. ඔබ නව තෙවන පාර්ශව සමග වැඩ කිරීමට පෙර සැම විටම නිසි සම්ප්‍රජන්‍යතාව සිදු කරන්න.
- වංචාව සඳහා "Red Falgs" තිබේදැයි සොයා බලා ඔබ ඒවා හඳුනා ගන්නේ නම් ඒ සඳහා පියවර ගන්න. "Red Falgs" වලට ජීවන රටාවේ හදිසි වෙනස්කම්, එනම් අධික ලෙස මෝටර් රථ හෝ වෙනත් ඉහළ වටිනාකම් සහිත භාණ්ඩ මිලදී ගැනීම ඇතුළත් වේ.
- සැම විටම අපගේ සංචාර හා වියදම් ප්‍රතිපත්ති අනුගමනය කරන්න.

ප්‍රශ්න සහ පිළිතුරු

Q මගේ බෙදාහැරීමේ මධ්‍යස්ථානයේ සාමාජිකයකු පමණ ඉක්මවා බෙදාහැරි තොග eBay හි විකුණමින් සිටී. ඔහු පවසන්නේ එය පුණ්‍ය කටයුතු සඳහා වන අතර ඒ බවට DC කළමනාකරු සමග එකඟ වූ නමුත් මුදල් යන්නේ කොතැනටදැයි මම නොදනිමි. මා කළ යුත්තේ කුමක්ද?

A **ඔබේ ගැටළුව සොයාගත නොහැකි වුවද, ඔබ හඬ අවදි කිරීම වැදගත් වේ. ඔබට ඔබේ කළමණාකරු හෝ DC කළමණාකරු සමග කතා කිරීම පහසු නැතිනම්, ඔබට (Protector Line) අමතා ඔබේ ගැටළු ඉදිරිපත් කළ හැකිය. ඔබ අමතන විට ඔබේ නම සඳහන් කිරීම අවශ්‍ය නොවනු ඇත.**

Q සාමාජිකයකු මෑතක දී රැකියාව සඳහා ගමන් කරමින් සිටි අතර මිතුරන් කිහිප දෙනෙකු රාත්‍රී ආහාරය සඳහා පිටතට ගෙන ගොස් ආහාර වේල් වියදමක් ලෙස ප්‍රතිපූරණය සඳහා ඉදිරිපත් කළේය? ඇයට බොහෝ විට වෙනත් වියදම් ඉදිරිපත් කිරීමට අමතක වන බැවින් සෑම දෙයක්ම අවසානයේදී "සමතුලිත" වන අතර මම ද එයම කළ යුතු බව ඇය පවසයි. මෙය පිළිගත හැකිද?

A **නැත. ඇය මෙම වියදම් ඉදිරිපත් කිරීමෙන් වංචා කරයි. පුද්ගලික වියදම් මගින් ඔබ වැඩ කරන අතරතුර දරන ලද ගාස්තු පිළිබිඹු විය යුතුය.**

Q මා සමග වැඩ කරන සාමාජිකයකු සැපයුම්කරුවෙකුගේ ඉන්වොයිසිය ඉදිරිපත් කර ඇති අතර එම මුදල ඊට අදාළ ලේඛන සමග නොගැළපේ. වෙනස වෙනත් ගිවිසුමක් යටතේ එකඟ වූ ඒවා බවත්, ඒවා මෙම සැපයුම්කරු වෙනුවෙන් "සැමවිටම මේ ආකාරයට කරන" ඒවා බවත්, මට ඒවාට ගැලපෙන පරිදි ලේඛන සංශෝධනය කළ හැකි බවත් ඔහු පවසයි. මා කළ යුත්තේ කුමක්ද?

A **ඔබ ලේඛන සංශෝධනය කිරීම ප්‍රතික්ෂේප කළ යුතු අතර නිවැරදි ලේඛන ලබාදෙන ලෙස සාමාජියාගෙන් ඉල්ලිය යුතුය. නොගැළපෙන ඉන්වොයිසිය සහ ලේඛන වංචාව හෝ වංචනික ක්‍රියාකාරකම් සඳහා "Red Falgs" වන අතර නිවැරදි වාර්තා සහ ඉන්වොයිසිය තබා ගැනීමෙන් අපි එම අවදානම් අඩු කරන්නෙමු. ඔබට තවමත් කුමක් කළ යුතු දැයි විශ්වාස නැත්නම් ඔබේ කළමනාකරු වෙත ඔබේ ගැටළුව යොමු කරන්න.**

Q නව සැපයුම්කරුවෙකු මට ඉතා හොඳ මිලකට නිෂ්පාදන ඉදිරිපත් කර ඇත. මම ඔවුන්ගේ සමාගම ගැන වැඩි යමක් නොදනිමි, මා ඉදිරි කටයුතු කළ යුත්තේ කෙසේද?

A **සියලුම නව සැපයුම්කරුවන් අපගේ අවංකත්ව නිසි-සම්ප්‍රජන්‍යතා ක්‍රියාවලිය දැනගත යුතුය. ඉතා හොඳ යැයි පෙනෙන මිල ගණන් බොහෝ විට විය සත්‍ය විය හැක්කේ සැපයුම්කරු සිය නිෂ්පාදන සඳහා වැට හෝ තීරු බදු නිවැරදිව ගෙවන්නේ නැති පමණක් විය හැකිය. අපි නිසි පරීක්ෂාවන් සිදු කර ඇති බව අපට පෙන්විය නොහැකි නම්, අය නොකළ බදු, ඇතිවිය හැකි පොලී සහ දඩ ගෙවන ලෙස බලධාරීන් විසින් ටෙස්කෝ වෙතින් ඉල්ලීමට හැකිය. ඊට අමතරව අපට අපරාධ නඩු සඳහා මුහුණදීමට ද සිදුවිය හැකිය.**

මට තවත් දේ සොයාගත හැක්කේ කොතැනින්ද?

- සමූහයේ සුරක්ෂිතතා, ආරක්ෂා සහ ප්‍රත්‍යාස්ථිති කණ්ඩායම හෝ දේශීය ආරක්ෂක කණ්ඩායම
- දේශීය බදු කණ්ඩායම
- සංචාර හා වියදම් ප්‍රතිපත්තිය

අල්ලස්

එය ගැටළුවක් වන්නේ ඇයි?

ගබඩා පවත්වාගෙන යන සහ ලොව පුරා සැපයුම්කරුවන්ගෙන් මිලදී ගන්නා වෙළෙඳාමක් ලෙස, අපි අල්ලස් හා සම්බන්ධ අවදානම් පිළිබඳව සැලකිලිමත් විය යුතුය. අප ව්‍යාපාර කරන ඕනෑම තැනක සාධාරණ හා සදාචාරාත්මක ලෙස කටයුතු කිරීම පිළිබඳව පවත්නා අපගේ කීර්තිය ගැන අපි ආඩම්බර වෙමු.

අපගේ අල්ලස විරෝධී ප්‍රවේශය සහ ලොව පුරා දූෂණය අවම කිරීම සඳහා වූ අපගේ කැපවීම සෑම අයෙක්ම තේරුම් ගැනීම වැදගත්ය. අප ක්‍රියාත්මක වන සියලුම රටවල අල්ලස නීති විරෝධී වේ. එය වෙළඳපල සහ ප්‍රජාවන්ට හානි කරන අතර වැරදි අය අතට සම්පත් මාරු කරයි.

වෙළෙඳාමක් ලෙස අප සමග වැඩ කරන සියලුම දෙනා එම නොඉවසන ප්‍රවේශය යොදාගැනීම අපි අපේක්ෂා කරන්නෙමු. එක්සත් රාජධානියට ලෝකයේ පවතින දැඩි අල්ලස් නීති අතරින් කිහිපයක් ඇති අතර ඒවා නියෝජිතයින් සහ කොන්ත්‍රාත්කරුවන් ඇතුළු අප වෙනුවෙන් වැඩ කරන සියලු දෙනාටම අදාළ වේ. එක්සත් රාජධානියේ පුරවැසියන්ට විදේශයන්හි දී සිදු කරන ලද බවට ඇති අල්ලස් චෝදනා සම්බන්ධයෙන් පවා නඩු පැවරිය හැකිය.

මට තවත් දේ සොයාගත හැක්කේ කොතැනින්ද?

- සමූහයේ නෛතික ව්‍යාපාර අවංකත්ව කණ්ඩායම හෝ දේශීය නෛතික කණ්ඩායම
- අල්ලස් විරෝධී ප්‍රතිපත්තිය
- බැදියා පිළිගැටුම් ප්‍රතිපත්තිය
- ත්‍යාග සහ විනෝදාශ්වාද ප්‍රතිපත්තිය

ඒ වෙනුවෙන් මා කළ යුත්තේ කුමක්ද?

- කෙනෙකු ඔබට පක්ෂව කටයුතු කිරීමට නම්මා ගැනීම සඳහා කිසි විටෙකත් අල්ලස්, ගෙවීම්, මුදල් වැනි තෑගි හෝ වෙනයම් ප්‍රතිලාභ ලබා නොදෙන්න.
- නව හෝ දැනට සිටින සැපයුම්කරුවකුට වෙළෙඳාමක් ලබා දීම සඳහා කිසිදා තෑගි හෝ විනෝදාශ්වාද වැනි අල්ලස් ඉල්ලීමෙන් හෝ පිළිගැනීමෙන් වළකින්න.
- අප සම්බන්ධ වන තෙවන පාර්ශවයන්, විශේෂයෙන් අප වෙනුවෙන් සේවා ඉටු කරන අය පිළිබඳව අවංකව නිසි සම්ප්‍රජන්‍යතාව සිදු කිරීමෙන් ඔවුන්ව දැන හඳුනාගන්න.
- රාජ්‍ය නිලධාරීන් සමග සම්බන්ධ වීමෙන් ඇති වන අල්ලස් අවදානම් ගැන සැලකිලිමත් වෙමින් අපගේ සම්බන්ධවීම් සැමවිටම විවෘත, අවංක හා විනිවිදභාවයෙන් යුතු බව සහතික කරගන්න.
- ඔබට සිරිත් පරිදි කෙරෙන තීරණ ගැනීම් කඩිනම් කිරීම සඳහා නීත්‍යානුකූල වේගවත් කිරීමේ ක්‍රියාදාම භාවිතා කළ හැකි නමුත් අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා කිසි විටෙකත් රාජ්‍ය නිලධාරීන්ට ඍජුවම ගෙවීම් නොකරන්න.
- අල්ලස් හා දූෂණ අවදානම් සහ ව්‍යාපාරය පුරාවට අප මුහුණ දිය හැකි ගැටළු පිළිබඳව ඔබ පූර්ණ පුහුණුවක් ලබා ඇති බවට තහවුරු කරගන්න.
- නීතිය බලාත්මක කරන ආයතන සහ විමර්ශකයින් සමග පූර්ණ සහයෝගයෙන් කටයුතු කිරීම සහ ප්‍රමාණවත් සාක්ෂි ඇතිවිට නඩු පැවරීමට හෝ විනය ක්‍රියාමාර්ගවලට සහය වීම.
- ඔබට හෝ වෙනත් කෙනෙකුට අල්ලසක් පිරිනැමුවහොත්, වහාම ඔබේ දේශීය නීති හෝ (Protector Line) කණ්ඩායම අමතන්න.

ප්‍රශ්න සහ පිළිතුරු

Q ටෙස්කෝ සමග දිගටම වැඩ කිරීමට අවශ්‍ය නම් "ඇයව රැකබලා ගත යුතු" බව ඇගේ සැපයුම්කරුවන් දන්නා බව මගේ සාමාජියා අතිශයෝක්තියෙන් කියා ඇත. එය නිවැරදි ද?

A **නැත. සැපයුම්කරුවෙකුගෙන් භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීම සඳහා විනෝදාශ්වාද හෝ වෙනත් ප්‍රතිලාභ ඉල්ලීම අපගේ ත්‍යාග ප්‍රතිපත්තිය උල්ලංඝනය කිරීමකි. එය අල්ලස් ද විය හැකිය. ඔබ වහාම ඔබේ ගැටළුව ඉදිරිපත් කළ යුතුය. ඔබේ කළමනාකරු සමග කතා කරන්න නැතහොත් ඔබේ නීති හෝ (Protector Line) කණ්ඩායම අමතන්න.**

Q මගේ වෙළඳපොල තුළ මගේ ලේඛනවලට මුද්‍රා තබාගැනීම සඳහා දේශීය නිලධාරියාට සුළු මුදලක් ගෙවීම නීති විරෝධී නොවේ. මෙය ගැටලුවක් ද?

A **ඔව්. ඇත්ත වශයෙන්ම මෙය කුඩා අල්ලසක් වන අතර එය 'පහසුකම් සැපයීමේ ගෙවීමක්' ලෙසද හැඳින්වෙන අතර, ඔබ ටෙස්කෝ සඳහා වෙනත් රටක වැඩ කළත් එක්සත් රාජධානියේ නීතිය යටතේ නීති විරෝධී වේ. සියලුම අල්ලස් මෙන්ම, පහසුකම් සැපයීමේ ගෙවීම් ප්‍රතික්ෂේප කරවාර්තා කළ යුතුය.**

Q මට ව්‍යාපාරයට අවශ්‍ය බලපත්‍ර ලබා ගන්නා උපදේශකයින් සමග මම බොහෝ විට සම්බන්ධ වෙමි. නව උපදේශකයෙකු පරිපාලන සහ පොරොත්තු කාලය අඩකින් අඩුකර දීමට ඉදිරිපත් වී ඇති නමුත් ඔවුන් මෙය කරන ආකාරය පැහැදිලි නැත. මට අවශ්‍ය දේ ලබා දීමට ඔවුන්ට හැකි නම් ඔවුන් එය කරන ආකාරය ගැන මා සැලකිලිමත් විය යුතුද?

A **ඔව්. අප වෙනුවෙන් ක්‍රියා කරන අයගේ ක්‍රියා (සම්බන්ධිත පුද්ගලයින් ලෙසද හැඳින්වේ) අපට සැලකිය යුතු අල්ලස් අවදානමක් ඇති කරයි. ඔවුන් කරන දෙය සහ ඔවුන් අප වෙනුවෙන් ක්‍රියා කරන ආකාරය පිළිබඳව අපට පැහැදිලි අවබෝධයක් තිබීම වැදගත්ය. අපගේ කීර්ති නාමය අල්ලස් ක්‍රියාවකින් හානිවීමේ අවදානමට ලක්වීම ඉතා වැදගත් වන අතර අපි ඒ ගැන නොදැන සිටියද අපි වගකිව යුතු විය හැකිය. ඔබේ දේශීය නීති කණ්ඩායමට කතා කර සියලු තෙවන පාර්ශවයන්ටෙස්කෝ වෙනුවෙන් ක්‍රියා කිරීමට පෙර ඔබ ඔවුන් පිළිබඳව නිසි අවංක සම්ප්‍රජන්‍යතාවයකින් යුතුව කටයුතු කරන බවට වග බලාගන්න.**

ත්‍යාග සහ විනෝදාශ්වාදය

එය ගැටළුවක් වන්නේ ඇයි?

ප්‍රමාණවත් තත්වයේ තයාග හෝ විනෝදාශ්වාද ලබා දීම සහ ලැබීම සැපයුම්කරුවන් සහ වෙනත් පාර්ශ්වයන් සමග සබඳතා ගොඩනගා ගැනීමේ වැදගත් කොටසකි. කෙසේ වෙතත්, මෙය කිසිදු ආකාරයකින් අපගේ ව්‍යාපාර තීරණවලට කිසිදු ආකාරයකින් බලපෑම් කිරීම - නැතහොත් බලපෑමක් වන ලෙස පෙනීම - නොවිය යුතුය. අප ක්‍රියාත්මක වන රටවල දේශීය ව්‍යාපාරික සිරිත් විරිත් කුමක් වුවත්, අපි කිසි විටෙකත් පොරොන්දු, ත්‍යාග හෝ වෙනත් ඔවීම් සඳහා හිලවු වශයෙන් කිසිදු බලපෑමක් අපේක්ෂා නොකරමු.

ලබා දී ඇති හෝ ලැබෙන ඕනෑම ත්‍යාගයක් හෝ විනෝදාශ්වාදයක් සුදුසු විය යුතුය, අපගේ ප්‍රතිපත්තියට අනුකූලව අනුමත විය යුතු අතර අවශ්‍ය අවස්ථාවල දී දේශීය ත්‍යාග ලේඛනයට ඇතුළත් විය යුතුය.

මට තවත් දේ සොයාගත හැක්කේ කොතැනින්ද?

- සමූහයේ නෛතික ව්‍යාපාර අවංකත්ව කණ්ඩායම හෝ දේශීය නෛතික කණ්ඩායම
- ත්‍යාග සහ විනෝදාස්වාද ප්‍රතිපත්තිය
- බැඳියා පිළිගැටුම් ප්‍රතිපත්තිය

ඒ වෙනුවෙන් මා කළ යුත්තේ කුමක්ද?

සෑම විටම අපගේ ත්‍යාග සහ විනෝදාශ්වාද ප්‍රතිපත්තිය අනුගමනය කරන්න. ඔබ එක්සත් රාජධානියේ සිටින අතර පවුම් 100 ට වඩා වැඩි ත්‍යාගයක් හෝ විනෝදාශ්වාදයක් පිළිගන්නේ නම්, ඔබේ කළමනාකරුගෙන් අනුමැතිය ලබාගෙන ත්‍යාග ලේඛනයේ සටහන් කරන්න. දේශීයව සකසා ඇති සීමා වෙනත් වෙළඳපලවලට අදාළ වනු ඇත වටිනාකම කුමක් වුවත්, නුසුදුසු ත්‍යාග සහ විනෝදාශ්වාද සෑම විටම ප්‍රතික්ෂේප කළ යුතුය.

මතක තබා ගන්න:

- ත්‍යාගයක් හෝ විනෝදාශ්වාදයක් භාර ගත යුතුද යන්න තීරණය කිරීමේදී ඔබේ විනිශ්චය භාවිතා කර අපගේ අගයන් සලකා බලන්න.
- කිසි විටෙකත් මුදල් හෝ මුදල් හා සමාන ත්‍යාග කාඩ්පත් හෝ වවුචර් වැනි ත්‍යාගයක් භාරගැනීමෙන් හෝ පිරිනැමීමෙන් වළකින්න.
- ඔබට පැහැදිලි ව්‍යාපාරික සාධාරණීකරණයක් නොමැති නම් සාමාන්‍යයෙන් මිල අධික ත්‍යාග හෝ විනෝදාශ්වාදයක් පිළිගැනීම සුදුසු නොවේ.
- ඔබ කිසි විටෙකත් ව්‍යාපාරය වෙනුවෙන් ඔබේ තීරණවලට බලපෑම් කළ හැකි හෝ අල්ලසක් ලෙස සැලකිය හැකි කිසිදු ත්‍යාගයක් හෝ විනෝදාශ්වාදයක් භාර නොගත යුතුය.
- රාජ්‍ය නිලධාරීන්ට ත්‍යාග කිසිවක් දීමට පෙර සැමවිටම සැලකිලිමත් වන්න සහ ඔබගේ නීති අධ්‍යක්ෂකගේ උපදෙස් ලබාගන්න.
- කිසි විටෙකත් අසභ්‍ය, කාමුක දර්ශන හෝ වෙනත් ආකාරයකින් අහිතකර විනෝදාශ්වාද ලබාදීම හෝ පිළිගැනීම නොකරන්න.
- විදේශගතවීම අවශ්‍ය වන විනෝදාශ්වාදයක් පිළිගැනීමට පෙර එය ව්‍යාපාර නායකයෙකු විසින් අනුමත කළ යුතුය.

ප්‍රශ්න සහ පිළිතුරු

Q මම පසුගිය සතියේ මගේ සැපයුම්කරු විසින් පවත්වන ලද දිනුම් ඇදීමක් දිනා ගත්තෙමි. මගේ ත්‍යාගය වූයේ අලුත් කැමරාවකි. මම ත්‍යාගය භාර ගන්නද?

A **එම ත්‍යාගයක් තයාගයක් ලෙසම සැලකෙන අතර, වටිනාකම පවුම් 100 (හෝ දේශීයව සකස් කළ සීමාව) ඉක්මවන බවට සලකා ඔබට ඔබේ කළමනාකරුගේ අනුමැතිය අවශ්‍ය වනු ඇති අතර ත්‍යාගය භාර ගැනීමට පෙර ඔබේ අධ්‍යක්ෂවරයාට දැනුම් දිය යුතුය. ඔබ එය ත්‍යාග ලේඛනයට ඇතුළත් කිරීමට ද අවශ්‍ය වේ.**

Q මම ගබඩා කළමනාකරුවෙක්මි. ඉදිරි ප්‍රවර්ධන කටයුත්තකදී ඔවුන්ගේ නිෂ්පාදන සැමවිටම ලබාගැනීමට ඇති බව මවිසින් සහතික කළහොත් සැපයුම්කරුවෙකුගේ ගබඩා කණ්ඩායමක් මට පවුම් 250 ක් වටිනා ත්‍යාග වවුචර පිරිනමනු ඇත. මම ත්‍යාගය භාර ගන්නද?

A **නැත. ත්‍යාගය මුදල් හා සමාන වන අතර මුදල් හෝ මුදල්වලට සමාන ත්‍යාග ලැබීමට ප්‍රතිපත්තිය මගින් අවසර නොදේ. නමුත් වඩා වැදගත් දෙය නම්, ගබඩාවේ ඇති අනෙකුත් සියලුම නිෂ්පාදනවලට වඩා මෙම ප්‍රවර්ධනයට සහාය වීම කෙරෙහි ඔබේ අවධානය වෙනතකට යොමු කිරීම ත්‍යාගය මගින් අපේක්ෂා කරනු ඇත. එබැවින් එය සුදුසු නොවේ. ගබඩා මට්ටමකට වඩා මධ්‍යගතව ප්‍රවර්ධනය සඳහා සහය දැක්වීමට එකඟවන බව සැපයුම්කරුවන්ට පැවසිය යුතුය.**

Q මට විම්බල්ඩන් සඳහා සත්කාරක ප්‍රවේශ පත්‍රයක් ලබා දී ඇත. ප්‍රවේශ පත්‍රයේ මුහුණත වටිනාකම පවුම් 450 ක් වන නමුත් සත්කාරක පැකේජයේ මුළු පිරිවැය පවුම් 2000 ක් බව සැපයුම්කරු පවසා ඇත. මම ත්‍යාග ලේඛනයට ඇතුළත් කිරීමට භාවිතා කරන්නේ කුමන අගය ද?

A **ඔබ සැපයුම්කරුගේ මුළු පිරිවැය වන පවුම් 2000 භාවිතා කළ යුතුය. සංචාරක හෝ රාත්‍රී නවාතැන් වැනි අමතර අයිතම සඳහා සැපයුම්කරු විසින් ගෙවා ඇත්නම්, මේවායේ පිරිවැය ද ඇතුළත් කළ යුතු මුළු මුදලට එක් කළ යුතුය.**

Q මා මීට පෙර එක්ව වැඩ කර ඇති සැපයුම්කරුවෙකු නව ව්‍යාපාර සඳහා ටෙන්ඩර් ලංසු තැබීමේ ක්‍රියාවලියකට දායක වී සිටී. කොන්ත්‍රාත්තුව ඔවුන්ට කොතරම් වටින්නේදැයි පෙන්වීමට ඔවුන් මාව රාත්‍රී භෝජන සංග්‍රහයකට කැඳවාගෙන යාමට කැමතිව සිටී. මට ඔවුන්ගේ පිරිනැමීම පිළිගත හැකිද?

A **නැත. අපගේ ත්‍යාග සහ විනෝදාශ්වාද ප්‍රතිපත්තිය ටෙන්ඩර් ක්‍රියාවලියක් අතරතුර දී සියලු සාමාජිකයන්ට ත්‍යාග හෝ විනෝදාශ්වාද කිසිවක් පිළිගැනීම හෝ පිරිනැමීම තහනම් කරයි. මෙමගින් ප්‍රතිඵල කෙරෙහි කිසිදු පෞද්ගලික බලපෑමක් නොමැතිව අපගේ තීරණ ගන්නා බව තහවුරු කෙරේ.**



බැඳියා පිළිගැටුම්

එය ගැටළුවක් වන්නේ ඇයි?

ව්‍යාපාරයේ හෝ අපගේ ගනුදෙනුකරුවන්ගේ යහපත සඳහා තීරණ ගැනීමට අපට ඇති හැකියාවට මැදිහත් වීමට හෝ බලපෑම් කිරීමට අපගේ පුද්ගලික අභිලාෂයන්ට ඉඩ දෙන සෑම අවස්ථාවකම බැඳියා පිළිගැටුමක් සිදු වේ. මෙය පවුලේ සාමාජිකයෙකු සැපයුම්කරුවෙකු බවට පත් වූ විට හෝ ව්‍යාපාරයට සේවා අලෙවි කරන විට හෝ ඔබ විසින් ඔබට සමීප පෞද්ගලික සම්බන්ධතාවයක් ඇති අයෙකු කළමනාකරණය කරන විට විය හැකිය. ගැටුම් නිසි ලෙස කළමනාකරණය කිරීමට අප අපොහොසත් වුවහොත්, ඒවා අපගේ කීර්ති නාමයට හානි කළ හැකි අතර නරක අතට හැරුණු විට වංචාව, වෙනස් කොට සැලකීම හෝ වෙනත් බරපතල ගැටළු ප්‍රතිඵලය කළ හැකිය.

ඒ වෙනුවෙන් මා කළ යුත්තේ කුමක්ද?

බැඳියා පිළිගැටුමක් ඇතිවන හෝ එය ඇතිවිය හැකි යැයි ඔබ සිතන සෑම අවස්ථාවකදීම, මේවා සඳහා පියවර ගන්න:

- **හඳුනාගන්න:** ව්‍යාපාරය වෙනුවෙන් ඔබේ තීරණ ගැනීමේදී බලපෑම් කළ හැකි පුද්ගලික බැඳියාවන් ගැන දැනුවත් වන්න. උදාහරණයක් ලෙස ඔබේ හවුල්කරු හෝ පවුලේ සාමාජිකයා ටෙස්කෝ සඳහා සැපයුම්කරුවෙකු නම්.
- **වළක්වා ගන්න:** පිළිගැටුමක ආකාරය පවතින සෑම අවස්ථාවකින්ම ඔබ ඉවත් වී පිටස්තරයෙකු එය දකිනු ඇත්තේ කෙසේදැයි ඔබගෙන්ම විමසන්න. උදාහරණයක් ලෙස, පවුලේ සාමාජිකයෙකු සමග එකම කණ්ඩායමේ වැඩ නොකිරීම වඩාත් සුදුසුය.
- **අවම කරගන්න:** ඔබට තත්වය වළක්වා ගත නොහැකි නම්, එය ඔබේ කළමනාකරු සමග සාකච්ඡා කර පිළි ගැටුම කළමනාකරණය කිරීමේ සැලසුමකට එකඟ වන්න.

ප්‍රශ්න සහ පිළිතුරු

Q අපි නව සේවා සැපයුම්කරුවෙකු සොයමින් සිටින අතර මගේ පෙම්වතා ටෙස්කෝ වෙනුවෙන් එම කටයුත්ත කළ හැකි සමාගමක් පවත්වාගෙන යයි. මට ටෙන්ඩරයේ විස්තර ඔහු සමග බෙදා ගත හැකිද?

A **නැත. ටෙන්ඩරයේ විස්තර රහසිගත වේ. ඔබ කිසි විටෙකත් හවුල්කරුවෙකුට, මිතුරෙකුට හෝ ඥාතියෙකුට වාණිජමය වාසියක් ලබා දීම සඳහා ටෙස්කෝ හි ඔබේ තනතුර භාවිතා නොකළ යුතුය. ඔබේ පෙම්වතාට ලංසුවක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය නම්, ඔබ ඔබේ කළමනාකරුට ඔබේ සම්බන්ධතාවය හෙළි කළ යුතු අතර ටෙන්ඩර් ක්‍රියාවලියට සම්බන්ධ නොවී සිටිය යුතුය.**

Q මට ඉදිරියේදී වැඩ කිරීමට සංචාරයේ යෙදීමට අවශ්‍ය වන අතර මට පක්ෂපාතීත්ව ලකුණු ලැබෙන ගුවන් සේවයකින් ප්‍රවේශපත්‍රයක් වෙන්කරවා ගැනීමට කැමැත්තෙමි. මගේ ගුවන් සේවය අනෙක් ඒවාට වඩා මිල අධික වුවත් මට එය භාවිතා කළ හැකිද?

A **නැත, ඔබ ව්‍යාපාරය සඳහා ගන්නා තීරණ වලට බලපෑම් කිරීමට කිසි විටෙකත් ඔබ ඔබේ පුද්ගලික අභිලාෂයන්ට ඉඩ නොදිය යුතුය. ලාභදායී ගුවන් ගමනක් ලදහැකි නම් සහ පිරිනමනු ලැබේ නම් එවිට ව්‍යාපාරයේ යහපත සඳහා ඔබ මෙම විකල්පය තෝරා ගත යුතුය.**

Q මගේ ලේලියට හොඳින් ගැළපේ යැයි මට සිතෙන ආකාරයේ තනතුරක් සඳහා මගේ කණ්ඩායම විසින් බඳවා ගැනීමක් සිදු කරයි. මම ඇයගේ විස්තර ඉදිරිපත් කර ඇයව තනතුර සඳහා නිර්දේශ කිරීම නිවැරදි ද?

A **ඔව්, ඔබේ ලේලියට එම තනතුර සඳහා දැනුම, කුසලතා සහ පෞරුෂයක් තිබේ නම්, ඔබ ඇයව සේවයේ යෙදවීමේ තීරණය සෘජුවම තීරණය කිරීමට හෝ ඊට බලපෑම් කිරීමට හැකි තැනක නොසිටින තාක් ඔබට ඇයව නිර්දේශ කළ හැකිය. ගැටුමක් ඉස්මතුවීම වළක්වා ගැනීම සඳහා ඔබේ සම්බන්ධතා හැකි ඉක්මනින් ප්‍රකාශ කරන්න.**

Q මම සාප්පු කළමනාකරණයේ සේවය කරන අතර මගේ ප්‍රසාද දීමනාව පදනම් වී ඇත්තේ අපගේ සාප්පුවල යම් නිශ්චිත අධික ඉලක්ක කරා යාම මත ය. මගේ ඉලක්කයට ළඟාවීම සඳහා මට වඩාත් පහළ මට්ටමේ බඳුකරුවන්ට ඒකක ලබා දිය හැකිද?

A **නැත. ඔබේ ඉලක්කයේ පරමාර්ථය වන්නේ අපගේ වෙළඳසැල්වල බඳුකරුවන්ගේ නිවැරදි මිශ්‍රණය හා ගුණාත්මකභාවය ඇති බව සහතික කිරීමයි. දුර්වල බඳුකරුවන් ඔබට නමුත් ව්‍යාපාරයට හෝ අපගේ ගනුදෙනුකරුවන්ට ප්‍රතිලාභ ලබා නොදෙනු ඇත.**

Q මගේ කළමනාකරු සිය බිරිඳ ඔහුගේ සැපයුම්කරුවන්ගෙන් අයෙක් ලෙස තබා ඇති අතර අනෙක් සැපයුම්කරුවන්ට වඩා ඇයගේ මිල අධික වෙන අතරම ඇයගේ නිෂ්පාදන ගුණාත්මක බවින් වඩා අඩු වුවද ඇයට වැඩ ලබා දෙන බව මම සිතමි. මා කළ යුත්තේ කුමක්ද?

A **මෙය බැඳියා පිළිගැයුමක් පමණක් නොව එය ටෙස්කෝ හට එරෙහි වංචාවක් ද විය හැකිය. ඔබ ඔහුගේ කළමනාකරුට ඔබේ ගැටළුව මතු කළ යුතුය, නැතහොත් ඔබේ දේශීය ආරක්ෂක හෝ නීති කණ්ඩායම ඇමතිය යුතුය.**

මට තවත් දේ සොයාගත හැක්කේ කොතැනින්ද?

- සමූහයේ නෛතික ව්‍යාපාර අවංකත්ව කණ්ඩායම හෝ දේශීය නෛතික කණ්ඩායම
- බැඳියා පිළිගැටුම් ප්‍රතිපත්තිය

පුණ්‍යාධාර

එය ගැටළුවක් වන්නේ ඇයි?

මුදල්, කාලය, නිෂ්පාදන සහ සේවා සපයමින් අපගේ ප්‍රජාවන්ට සැබෑ වෙනසක් ඇති කරන දේශීය හා ජාතික පුණ්‍යායතනවලට සහයෝගය දැක්වීමේ දීර්ඝ ඉතිහාසයක් අප සතුව ඇත. අපගේ සහය පිරිනමන විට, අප සහය දක්වන සංවිධාන සුදුසු, නීත්‍යානුකූල, සහ අපි අපේක්ෂා කරන ආකාරයට අපගේ ප්‍රජාවන්ට උපකාර කරන්නේද යන්න පරීක්ෂා කිරීම වැදගත්ය. අප විසින් කරන පරිත්‍යාග කිසිවක් අප කීර්ති නාමයට හානියක් නොකරන බවටත්, සියලු සාමාජිකයන් නීතිමය හෝ මූල්‍යමය අභියෝගවලින් ආරක්ෂා කරන බවටත් තහවුරු කිරීමට මෙය අපට උපකාරී වේ.

ඒ වෙනුවෙන් මා කළ යුත්තේ කුමක්ද?

- අපගේ සංස්ථාපිත පුණ්‍යාධාර හවුල්කරුවන්ට සහය වන්න.
- පුණ්‍යායතනය සංස්ථාපිත හවුල්කරුවෙකු නොවේ නම්, අපි සහය දැක්වීමට අදහස් කරන ඕනෑම පුණ්‍යායතනයක් සඳහා අවංක නිසි-සම්ප්‍රජන්‍යතාවක් ඇති කර ගන්න.
- සුදුසු අධිකාරියක් ඇතිව පමණක් පුණ්‍යාධාර කරන්න; පුණ්‍යාධාර ප්‍රතිපත්තියේ දක්වා ඇති අධිකාරී කාලසටහනේ අභිනියෝජනය අනුගමනය කර නිවැරදි අනුමැතිය ලබාගන්න.
- අපගේ අභ්‍යන්තර අරමුදල් රැස් කිරීමේ ක්‍රියා පටිපාටි සහ මග පෙන්වීම අනුගමනය කරන්න.
- කිසි විටෙකත් ඔබේ සැපයුම්කරුවන්ට ටෙස්කෝ සහාය දක්වන පුණ්‍යායතන සඳහා පරිත්‍යාග (මුදල්, භාණ්ඩ හෝ සේවා) ලබා දෙන ලෙස බලපෑම් නොකරන්න.
- කිසි විටෙකත් ටෙස්කෝ හි කීර්ති නාමයට හානි කළ හැකි පුණ්‍යායතන සඳහා ටෙස්කෝ අරමුදල් ලබා දීමට ඉඩ නොදෙන්න.

ප්‍රශ්න සහ පිළිතුරු

Q දේශීය තරුණ කණ්ඩායමේ නත්තල් දිනුම් ඇදීම සඳහා පවුම් 50 ක් වටිනා නිෂ්පාදන පරිත්‍යාග කරමින් සහයෝගය දැක්වීමට මගේ ගබඩාව බලාපොරොත්තු වේ. මා කළ යුත්තේ කුමක්ද?

A පරිත්‍යාගය ටෙස්කෝ වෙතින් ලැබෙන බැවින්, තරුණ කණ්ඩායම යනු සුදුසු තේරීමක් බවටත් ඔවුන් ලියාපදිංචි පුණ්‍යායතනයක් බවටත් ඔබ සහතික කරගත යුතු අතර ඔබේ දේශීය පුණ්‍යාධාර මාර්ගෝපදේශය බලන්න. පරිත්‍යාගයට එකඟ වීමට පෙර ගැළපෙන අවසරයක් ලබා ගැනීමට මතක තබා ගන්න; මෙය පවුම් 500 ට අඩු බැවින් එය ඔබේ ගබඩා කළමනාකරු වෙතින් ලබාගත යුතුවනු ඇත.

Q අපි අපගේ සැපයුම්කරු සමග දන්තාලේප සම්බන්ධව සති 3- ක ප්‍රවර්ධනයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන අතර එහිදී සෑම අලෙවියකින්ම 5% ක් පුණ්‍ය කටයුතු සඳහා පරිත්‍යාග කෙරෙනු ඇත. මා කුමන ක්‍රියාවලිය අනුගමනය කරන්නේ ද?

A මෙම සංවර්ධනය හේතු-සම්බන්ධ අලෙවිකරණය (CRM) ලෙස හැඳින්වෙන අතර එය ව්‍යාපාර ඒකක නිෂ්පාදන අධ්‍යක්ෂක විසින් අනුමත කළ යුතුය (සමූහයේ පුණ්‍යාධාර ප්‍රතිපත්තියේ දක්වා ඇති පරිදි). ඇතිවිය හැකි බදු සම්බන්ධතා සඳහන් අත්සන් කළ ගිවිසුමක් මගින් සියලුම CRM ක්‍රියාකාරකම් සඳහා සහාය විය යුතුය.

Q ජාතික පුණ්‍යාධාර හවුල්කරුවෙකු නොවන පුණ්‍යායතනයක් විසින් අපෙන් දහ දෙනෙකුට පුණ්‍යාධාර ගොල්ෆ් දිනයකට ආරාධනා කර ඇත. අපි සහභාගී වීම සඳහා පුණ්‍යායතනයට පවුම් 20,000 ක් පරිත්‍යාග කරමු. මෙය අවසර ලැබේද?

A ඔව්, කෙසේ වෙතත්, පරිත්‍යාගය ඩොලර් 10,000 කට වඩා වැඩි නිසා සහ එම මුදල් ජාතික පුණ්‍යාධාර හවුල්කරුවෙකු නොවන පුණ්‍යායතනයකට පරිත්‍යාග කරන බැවින් ඔබට ඔබේ ව්‍යාපාර ඒකකයේ විධායකගෙන් හෝ නායකත්ව කණ්ඩායමේ අනුමැතිය අවශ්‍ය වේ. පිළිගත් නිසි -මප්‍රජනාතාව ඇතුළුව පුණ්‍යායතනය පිළිබඳ අදාළ පසුබිම් පරීක්ෂාවන් සම්පූර් කෙරෙන බවට ඔබ සහතික විය යුතුය. ඔවුන් විසින් පුණ්‍යාධාර පිළිබඳ සටහනක් පවත්වා ගෙන යන බැවින් මෙම පරිත්‍යාගය පිළිබඳව ඔබේ ව්‍යාපාර ඒකකයේ සන්නිවේදන අංශ ප්‍රධානියා වෙතවාර්තා කිරීමටද ඔබ මතක තබා ගත යුතුය.

Q මගේ සැපයුම්කරු මට පුණ්‍යාධාර සම්මාන රාත්‍රී භෝජන සංග්‍රහයකට ආරාධනා කර ඇත. මට පිළිගත හැකිද?

A මෙම අවස්ථාව අපගේ ත්‍යාග සහ විනෝදාශ්වාද ප්‍රතිපත්තියෙන් ආවරණය වේ (44-45 පිටු බලන්න). ඔබ විනෝදාශ්වාදයේ මුළු වටිනාකම සොයා ගැනීමට, වටිනාකම පවුම් 100 (හෝ දේශීය සීමාව) ට වඩා වැඩි නම් කළමනාකරුගේ අනුමැතිය ලබාගෙන එය ත්‍යාග ලේඛනයට ඇතුළත් කිරීමට අවශ්‍ය වනු ඇත.

මට තවත් දේ සොයාගත හැක්කේ කොතැනින්ද?

- කණ්ඩායම් සන්නිවේදන හෝ දේශීය ආයතනික කටයුතු කණ්ඩායම
- පුණ්යාධාර ප්රතිපත්තිය
- ත්යාග සහ විනෝදාශ්වාද ප්රතිපත්තිය

අභ්‍යන්තර ගනුදෙනු සහ වෙළඳපල අයථා භාවිතය

එය ගැටළුවක් වන්නේ ඇයි?

ඔබේ රැකියාවේ කොටසක් ලෙස ටෙස්කෝ හෝ අප සමග ව්‍යාපාර කරන සමාගම් පිළිබඳ වැදගත් "අභ්‍යන්තර තොරතුරු" පිළිබඳව ඔබ දැනුවත් විය හැකිය.

ඔබේම ප්‍රතිලාභය සඳහා හෝ අන් අය වෙනුවෙන් අභ්‍යන්තර තොරතුරු භාවිතා කිරීම නීතියට පටහැනි සහ සමාගම් ප්‍රතිපත්තියට පටහැනි වේ. අභ්‍යන්තර තොරතුරු මත පදනම්ව ලැයිස්තුගත බැඳුම්කර වැනි කොටස් හෝ වෙනත් සුරැකුම්පත් විකිණීම හෝ මිලදී ගැනීම මෙයට ඇතුළත් වන අතර එය "අභ්‍යන්තර ගනුදෙනු" ලෙස හැඳින්වෙන අතර එය බරපතල සාපරාධී වරදකි. වෙනත් අයෙකු අලෙවිකරණ තීරණයක් ගැනීම සඳහා අභ්‍යන්තර තොරතුරු භාවිතා කරන්නේ නම් ඔවුන් සමග ඒවා හුවමාරු කර ගැනීම ද වරදකි.

නීතිය සහ අපගේ අභ්‍යන්තර ප්‍රතිපත්තිය දැනගෙන එයින් බැඳී සිටීමට අප සැමට වගකීමක් ඇත. ඔබ ටෙස්කෝ වෙනුවෙන් සේවය කිරීම නැවැත්වීමෙන් පසුව පවා මෙම රීති අදාළ වේ.

ඒ වෙනුවෙන් මා කළ යුත්තේ කුමක්ද?

- ඔබේ රැකියාව විසින් ඔබ අභ්‍යන්තර තොරතුරු ලඟ තබාගැනීම අපේක්ෂා කරන විට, ඔබව ටෙස්කෝ PLC. අභ්‍යන්තර ලැයිස්තුවට ඇතුළත් කර සමූහයේ සමාගම් ලේකම්ගෙන් දැනුම් දීමක් ලබනු ඇත.
- ඔබ යම් සමාගමක් පිළිබඳ අභ්‍යන්තර තොරතුරු තමා සතුව තිබියදී කිසිදු එම සමාගමේ සුරැකුම්පත් සම්බන්ධයෙන් කටයුතු නොකළ යුතුය. උදාහරණයක් ලෙස, ප්‍රසිද්ධියට පත් කළ විට ටෙස්කෝ කොටස් මිල ඉහළ හෝ පහළට යා හැකි යම් තොරතුරක් ඔබ විසින් සේවයේ යෙදී සිටියදී දැනගෙන තිබේ නම් ඔබට ටෙස්කෝ හි කොටස් මිලදී ගැනීමට හෝ විකිණීමට ඉඩ නොදේ.
- ඔබව ටෙස්කෝ PLC. අභ්‍යන්තරික ලැයිස්තුවට එක් කර ඇත්නම්, ඔබ ටෙස්කෝ PLC. කොටස් ගනුදෙනු සංග්‍රහයට අනුකූල වීම; නීති සම්පාදනයට අනුකූලව තබාගත යුතු ඇතැම් පෞද්ගලික තොරතුරු සැපයීම; කළ යුතු අතර ඔබ හෝ ඔබේ සම්බන්ධිත පුද්ගලයින්ට ටෙස්කෝ සුරැකුම්පත් සමග ගනුදෙනු කිරීමට හැකිවීමට පෙර ඔබ අවසරය ලබා ගත යුතුය.
- ප්‍රතිඵල හෝ ප්‍රධාන ගනුදෙනු වැනි සමහර සමාගම් නිවේදනවලට පෙර පනවා ඇති "සංවෘත කාල පරිච්ඡේද" තුළ ටෙස්කෝ සුරැකුම්පත් සම්බන්ධයෙන් ගනුදෙනු කිරීම ද ඔබට තහනම්ය. සංවෘත කාල පරිච්ඡේද දින සාමාජිකයන්ට කල්තියා දැනුම් දෙනු ලැබේ.
- සාවද්‍ය තොරතුරු පතුරුවා හැරීමෙන් හෝ සමාගමක සුරැකුම්පත් වල මිල හැසිරවීමට නිර්මාණය කර ඇති වෙනත් ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වීමෙන් ඔබ වෙළඳපල අයථා භාවිතයට සම්බන්ධ නොවිය යුතුය.
- යමෙකු අභ්‍යන්තර ගනුදෙනුවල නිරත වී ඇතැයි ඔබ සිතන්නේ නම් ඔබ හඬ අවදි කළ යුතුය.

මට තවත් දේ සොයාගත හැක්කේ කොතැනින්ද?

- ආයතනික ලේකම් කාර්‍යාලය
- දේශීය නීති අධ්‍යක්ෂක
- ටෙස්කෝ PLC. කොටස් ගනුදෙනු සංග්‍රහය
- ටෙස්කෝ PLC. අනාවරණ අත්පොත

ප්‍රශ්න සහ පිළිතුරු

Q "අභ්‍යන්තර තොරතුරු" යනු මොනවාද?

A **සමාගමක් පිළිබඳ ප්‍රසිද්ධියට පත් කර නොමැති, කොටස් හෝ වෙනත් සුරැකුම්පත් මිලදී ගැනීම, විකිණීම හෝ තබා ගැනීම තීරණය කිරීමේදී යම් ආයෝජකයෙකු විසින් වැදගත් යැයි සලකන සමහර තොරතුරු අභ්‍යන්තර තොරතුරු වේ.**

Q මට අභ්‍යන්තර ගනුදෙනු පිළිබඳ වැඩි විස්තර දැනගත හැක්කේ කොතැනින්ද?

A **අපගේ කොටස් ගනුදෙනු සංග්‍රහය සහ අපගේ අභ්‍යන්තර සංක්ෂිප්තකරණ සටහන බලන්න ටෙස්කෝ PLC. අනාවරණය කිරීමේ අත්පොතෙන් කළමනාකරණය සහ අභ්‍යන්තර තොරතුරු අනාවරණය කිරීම පිළිබඳ තවත් තොරතුරු ලබා ගත හැකිය.**

Q මම ටෙස්කෝ PLC. අභ්‍යන්තර ලැයිස්තුවේ සිටින අතර මම ටෙස්කෝ කොටස් කිහිපයක් මිලදී ගැනීමට කැමැත්තෙන් සිටිමි. සමාගම සංවෘත කාල පරිච්ඡේදයක නොසිටින බැවින් මට වෙන කිසිවක් නොකර වෙළඳාමේ යෙදීමට හැකිද?

A **නැත, ඔබ ටෙස්කෝ PLC. අභ්‍යන්තර ලැයිස්තුවේ සාමාජිකයකු නම් ඔබට ගනුදෙනු කිරීමට අවසර අවශ්‍ය බැවින් ඔබ (සහ ඔබේ සම්බන්ධිත පුද්ගලයින්) ටෙස්කෝ PLC. කොටස් ගනුදෙනු සංග්‍රහයේ දක්වා ඇති ක්‍රියා පිළිවෙත් අනුගමනය කළ යුතුය.**

Q ටෙස්කෝ සමාගම ප්‍රසිද්ධ අලෙවි සැපයුම් සමාගමකට විශාල කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කිරීමට සූදානම් බව මට අසන්නට ලැබේ. ගිවිසුම අත්සන් කර ප්‍රසිද්ධ කිරීමට පෙර මට සැපයුම්කරුගේ කොටස් මිලදී ගත හැකිද?

A **නැත. අභ්‍යන්තර තොරතුරු මත පදනම්ව ටෙස්කෝ හෝ වෙන යම් සමාගමක කොටස් මිලට ගැනීම හෝ විකිණීම අභ්‍යන්තර ගනුදෙනු කිරීමක් ලෙස සැලකෙන අතර එය නීති විරෝධී ය.**

Q ඒ වෙනුවට සැපයුම්කාර සමාගමේ කොටස් මිලදී ගැනීමට මට මිතුරෙකු උනන්දු කළ හැකිද?

A **නැත. මෙය "රහසිගතව උපදෙස් දීම" ලෙස හැඳින්වේ. ඔබට අභ්‍යන්තර තොරතුරු වෙනත් කෙනෙකුට ලබාදීමට හෝ එම තොරතුරු පදනම් කරගෙන ගනුදෙනු කිරීමට අන් අයව දිරිමත් කිරීමට අවසර නැත.**

Q අපි වෙළඳපල අපේක්ෂාවන් සැලකිය යුතු ලෙස ඉක්මවා යනු ඇති බව පෙන්වන දර්ශක මූල්‍ය ප්‍රතිඵල තොරතුරු මවිසින් දැක ඇත. මා කළ යුත්තේ කුමක්ද?

A **වෙළඳපොළට නිවැරදි දත්ත ලබා දීමට නොහැකිවීම බරපතල ගැටළුවකි. සමූහයට සුදුසු හා කඩිනමින් තොරතුරු අනාවරණය කිරීම අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලියක් ඇත. ඔබ වහාම ඔබේ මූල්‍ය හෝ නීති අධ්‍යක්ෂක සමග කතා කිරීමට හෝ ආරක්ෂක ඇමතිමට අවශ්‍ය වේ.**

දේශපාලන කටයුත්තක නිරත වීම

එය ගැටළුවක් වන්නේ ඇයි?

ව්‍යාපාර කටයුතුවල කොටසක් ලෙස, අපි ලොව පුරා රජයන්, නියාමකයින්, පිරිස් කළමනාකරණ අවශ්‍යතා කණ්ඩායම්, කර්මාන්ත සංගම් සහ වෙනත් සමාන ආයතන සමග සම්බන්ධ වෙමු.

අපගේ ගනුදෙනුකරුවන් සහ අපගේ සාමාජිකයන්ට බලපාන ගැටළු පිළිබඳ අපගේ ස්ථාවරය ඔවුන්ට දැනුම්දීමට අපි මෙය කරන්නෙමු. අපි සෘජුව හෝ අපගේ වෙළඳ හෝ ප්‍රතිපත්ති සංවිධානවල සාමාජිකත්ව හරහා මෙම තොරතුරු සපයන්නෙමු. ගැටළු පිළිබඳ අපගේ අවබෝධය වැඩි කිරීමට සහ අදාළ ප්‍රතිපත්ති හා නියාමන විවාදවල දී වැඩදායක ලෙස සම්බන්ධ වීමට මෙම සාමාජිකත්ව අපට උපකාරී වේ.

අපි දේශපාලනික මැදිහත්වීම පාලනය කරන සියලුම නීතිවලට අනුකූල වන බවට අපි සැමවිටම සහතික වෙමු. අපි වෙළෙඳාමක් ලෙස දේශපාලනික වශයෙන් මධ්‍යස්ථව සිටිමු. අපට කිසිදු දේශපාලන පක්ෂානුබද්ධතාවක් නොමැති අතර අපි දේශපාලනික පරිත්‍යාග නොකරමු.

ඒ වෙනුවෙන් මා කළ යුත්තේ කුමක්ද?

- රජයේ දෙපාර්තමේන්තු, දේශපාලනඥයන් හෝ දේශපාලන ක්‍රියාකාරී කණ්ඩායම් වෙතින් ඔබට ලිපි හුවමාරුවක් හෝ තොරතුරු සඳහා ඉල්ලීම් කිසිවක් ලැබෙන්නේ නම් සැම විටම ඔබේ රාජ්‍ය සම්බන්ධතා හෝ සන්නිවේදන කණ්ඩායමෙන් විමසන්න.
- දේශපාලනඥයන් හෝ දේශපාලන පක්ෂ විසින් සංවිධානය කළ ඉසව් සඳහා අනුග්‍රාහකත්වය ඇතුළුව දේශපාලනික පරිත්‍යාග සඳහා වන ඕනෑම ඉල්ලීමක් විසඳීම සඳහා ඔබේ පළාත් පාලන සබඳතා හෝ සන්නිවේදන සහ නීති කණ්ඩායම් වෙත ඉදිරිපත් කළ යුතුය.
- ඔබ රජයේ නිලධාරියෙකුට ත්‍යාගයක් දීමට හෝ විනෝදමත් කිරීමට අදහස් කරන්නේ නම් ත්‍යාග සහ විනෝදාශ්වාද ප්‍රතිපත්තිය බලා ඔබේ නීති අධ්‍යක්ෂවරයා අමතන්න.
- ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියට සම්බන්ධ වීමට ඔබට නිදහස තිබේ - එහි ජීවත් වන හා වැඩ කරන ජනතාව එය වඩා හොඳ ස්ථානයක් බවට පත්කිරීමට සම්බන්ධ වීමේදී ප්‍රජාවක් වඩා ශක්තිමත් වේ. නමුත් ඔබ ක්‍රියා කරන්නේ ඔබ වෙනුවෙන් මිස ටෙස්කෝ වෙනුවෙන් නොවන බව සැමවිටම පැහැදිලි කරගන්න.
- ඕනෑම දේශපාලන කටයුත්තක් ඔබගේ කාලය භාවිතා කරමින් සිදු කළ යුතු අතර එය ඔබගේ රාජකාරියට බලපෑමක් නොවිය යුතුය. එමෙන්ම ඔබේ දෘෂ්ටිකෝණය ඔබ පාරිභෝගිකයන්, සාමාජිකයන් හෝ වෙනත් අයෙකු කෙරෙහි කටයුතු කරන ආකාරය කෙරෙහි බලපෑමක් නොකළ යුතුය.

ප්‍රශ්න සහ පිළිතුරු

Q මට ටෙස්කෝ වෙනුවෙන් දේශපාලනික පරිත්‍යාගයක් කළ හැකිද?

A **නැත. අපි දේශපාලන පක්ෂවලට හෝ අපේක්ෂකයින්ට පරිත්‍යාග නොකරමු.**

Q ටෙස්කෝ හට අමාත්‍යවරයාගේ පුණ්‍ය කටයුතුවලට අනුග්‍රහය දැක්විය හැකිද?

A **හේතුව පුන්‍ය කටයුතු මිස දේශපාලනික නොවූවත්, ඔබ එම ඉල්ලීම් ඔබේ නීති සහ රාජ්‍ය කටයුතු හෝ සන්නිවේදන කණ්ඩායම් සමග සාකච්ඡා කළ යුතුය. ඔබ විසින් එම කටයුත්තේ අනුග්‍රාහකත්වය අල්ලස හෝ වෙනත් කීර්ති නාමය පිළිබඳ ගැටළුවලට හේතු නොවන බවත් එය පක්ෂග්‍රාහී නොවන බවත් සහතික කළයුතු වනු ඇත. ටෙස්කෝ දේශපාලනික වශයෙන් මධ්‍යස්ථ සංවිධානයක් බව මතක තබාගන්න.**

Q මම දේපළ සම්බන්ධව කටයුතු කරමි. මට ටෙස්කෝ වෙත බලපාන ගැටළුවක් පිළිබඳව සැලසුම් පිළිබඳ අමාත්‍යවරයා සමග කතා කළ හැකිද?

A **රජයේ නිලධාරීන් සම්බන්ධ කර ගැනීමට සහ ඕනෑම ගිවිසුමක් සඳහා ඒකාබද්ධව එකඟ වීමට පෙර ඔබ ඔබේ රාජ්‍ය කටයුතු හෝ සන්නිවේදන කණ්ඩායමෙන් උපදෙස් ලබා ගත යුතුය. ප්‍රශ්නයක් ගැන ටෙස්කෝ හි විශේෂඥයාගෙන් සෘජුවම දැන ගැනීමට නිලධාරීන්ට එය බෙහෙවින් උපකාරී විය හැකිය.**

මට තවත් දේ සොයාගත හැක්කේ කොතැනින්ද?

- සමූහයේ නෛතික රාජ්‍ය කටයුතු කණ්ඩායම
- සන්නිවේදන ප්‍රධානී
- දේශපාලනයේ නියුතුවීමේ පාර්ලිමේන්තු
- ත්‍යාග සහ විනෝදාස්වාද ප්‍රතිපත්තිය
- පුණ්‍යාධාර ප්‍රතිපත්තිය

Q පාර්ලිමේන්තු ආසනයක් සඳහා තරඟ වදින ප්‍රාදේශීය අපේක්ෂකයෙකුගේ මැතිවරණ ව්‍යාපාරයට සහාය වීම සඳහා මට රැකියාවෙන් බැහැරවිය හැකිද?

A **ඔබ මෙම ඉල්ලීම ඔබගේ පිරිස් කළමනාකරණ කණ්ඩායම සමග සාකච්ඡා කළ යුතු අතර ඔවුන් රැකියාවෙන් වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමේ ක්‍රියාවලිය පැහැදිලි කරනු ඇත. ප්‍රතිඵලය කුමක් වුවත්, ඔබේ දේශපාලනික විශ්වාසයන් ඔබගේ ටෙස්කෝ වෙනුවෙන් කරන රාජකාරියට බාධාවක් නොවන බවට ඔබ සහතික විය යුතුය.**

Q මෑතදී අලෙවිය පිළිබඳව ගැටළුවක් ඉදිරිපත් කිරීම සඳහා නගරාධිපතිවරයා අපගේ ගබඩා කළමනාකරු හමුවීමට ඉල්ලා තිබේ. මා කළ යුත්තේ කුමක්ද?

A **හොඳ අසල්වැසියන් වීමට නම්, අපි ප්‍රාදේශීය වශයෙන් තේරී පත් වූ නිලධාරීන්ගේ ගැටළුවලට ප්‍රතිචාර දැක්වීම වැදගත් ය. ඔබගේ රාජ්‍ය කටයුතු හෝ සන්නිවේදන කණ්ඩායම සමග ඔබ මෙම යෝජනාව සාකච්ඡා කළ යුතු අතර නගරාධිපති හමුවී ඇයගේ ගැටළුවලට සවන් දීමට හොඳම ක්‍රමයට එකඟ විය යුතුය.**

Q ප්‍රාදේශීය දේශපාලඥයෙකු ලබන සතියේ මගේ ගබඩාවට පැමිණීමට ඉඩදිය හැකිදැයි විමසා ඇත. මට මෙයට එකඟ විය හැකිද?

A **දේශපාලනඥයෙකුගේ විධිමත් සංචාරයකට එකඟ වීමට පෙර සෑම විටම රාජ්‍ය කටයුතු හෝ සන්නිවේදන සාමාජිකයන්ගේ උපදෙස් ලබාගන්න. අපි කිසියම් යෝජිත සංචාරයකට ප්‍රතිචාරයක් දැක්වීමට පෙර එහි අරමුණ සහ සන්දර්භය තේරුම් ගත යුතුය.**

Q දේශපාලන පක්ෂයක් හෝ වෘත්තීය සමිතියක් විසින් සංවිධානය කරන ලද පිළිගැනීමේ උත්සවයකට අනුග්‍රහය දැක්වීමට ටෙස්කෝ හට හැකිද?

A **ඔබ එම ඉල්ලීම් ඔබේ නීති සහ රාජ්‍ය කටයුතු හෝ සන්නිවේදන කණ්ඩායම සමග සාකච්ඡා කළ යුතුය. අනුග්‍රාහකත්වය අනුමත වුවහොත්වාර්ෂික වාර්තාව සඳහා ටෙස්කෝ හි දේශපාලනික පරිත්‍යාග පිළිබඳ ප්‍රකාශය සකස් කරන සමූහයේ රාජ්‍ය සම්බන්ධතා වෙත ඔබ දැනුම්දීමට අවශ්‍ය වනු ඇත.**

නිවැරදි ගිණුම්කරණය සහ මුදල් විශුද්ධිකරණය

එය ගැටළුවක් වන්නේ ඇයි?

කොටස් වෙළඳපොලවල් සහ කොටස් හිමියන් සඳහා වන අපගේ බැඳීම් ඉටු කිරීම සඳහා, අපගේ සියලු මූල්‍ය තොරතුරු සමාගමේ ගිණුම්වල නිවැරදිව වාර්තාගත කළ යුතුය. ආදායම සහ පිරිවැය දත්ත සෑම විටම නිවැරදිව හා නියමිත වේලාවට වාර්තාගත වන බව සහතික කිරීම මෙයින් අදහස් කෙරේ.

මුදල් එකතු කිරීමේ දී, මුදල් කාර්යාලයේ දී සහ අපගේ ප්‍රධාන කාර්යාලයේ කටයුතු වලදී, අපි මූල්‍ය සහ මූල්‍ය නොවන තොරතුරුවාර්තාගත කිරීමේ දී අවංක බව සහ අව්‍යාජව කටයුතු කරන බව සහතික කළ යුතුය. දේශීය හා ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ රීති දිනෙන් දින දැඩි වන අතර අපගේ අභ්‍යන්තර වාර්තාකරණ ප්‍රතිපත්ති සමග ඒවා පිළිපැදිය යුතුය.

එමෙන්ම ත්‍රස්තවාදයේ අයහපත්ම අවස්ථාව ඇතුළු සාපරාධී ක්‍රියාකාරකම්වලින් ලබාගත් අරමුදල් නීත්‍යානුකූල මූල්‍ය පද්ධතිවලට ගෙනයාමට අපරාධකරුවන් ටෙස්කෝ බැංකුව ඇතුළු අපගේ ව්‍යාපාරය භාවිතා කළ හැකි බවට අපි සැමවිටම විමසිලිමත්ව සිටිය යුතුය. මෙය සාමාන්‍යයෙන් මුදල් විශුද්ධිකරණය ලෙස හැඳින්වෙන අතර මුදල් විශුද්ධිකරණය හෝ වෙනත් මූල්‍ය අපරාධවලට සම්බන්ධ සමාගම් සහ පුද්ගලයින්ට දැඩි දඬුවම් තිබේ.

මට තවත් දේ සොයාගත හැක්කේ කොතැනින්ද?

- සමූහයේ මූල්‍ය කණ්ඩායම හෝ දේශීය මූල්‍ය කණ්ඩායම
- සමූහයේ මූල්‍ය සුරක්ෂිතතා, ආරක්ෂා සහ ප්‍රත්‍යාස්ථිති කණ්ඩායම හෝ දේශීය ආරක්ෂක කණ්ඩායම
- සමූහයේ නෛතික ව්‍යාපාර අනුකූලතා කණ්ඩායම හෝ දේශීය නෛතික කණ්ඩායම.
- ටෙස්කෝ සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ඒ වෙනුවෙන් මා කළ යුත්තේ කුමක්ද?

- ඔබ ආදායම හෝ පිරිවැය සටහන් කිරීමට සම්බන්ධ නම්, ඔබ අපගේ ටෙස්කෝ සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ඒවා ඔබගේ කාර්යභාරයට අදාළ වන ආකාරය පිළිබඳව දැනුවත් බව සහතික කරගන්න.
- නිවැරදි සහ නිවැරදි මූල්‍යවාර්තාකරණ කාල සීමාවට අදාළ මූල්‍ය තොරතුරු පමණක් ඉදිරිපත් කරන්න.
- සියලුම මූල්‍ය තොරතුරුවලට සහය පිණිස ඉන්වොයිසිය සහ ලදුපත් ඇතුළු සුදුසු වාර්තා පවත්වා ගන්න.
- අපගේ සංචාර සහ වියදම් ප්‍රතිපත්ති පිළිබඳව දැනුවත්ව සිටිමින් ඔබේ සමූහයේ සාමාජිකයන් ද එසේ කරන බව තහවුරු කරගන්න.
- ඔබේ දේශීය මූල්‍ය කණ්ඩායම සමග සමීපව කටයුතු කර ආදායම හෝ වියදම් වාර්තා කරන ආකාරය පිළිබඳව ඔබට අපැහැදිලි නම් මග පෙන්වීම ඉල්ලන්න.
- අපගේ අභ්‍යන්තර හා බාහිර විගණකවරුන්ට අපගේ ගිණුම් විගණනය කිරීමට අවශ්‍ය තොරතුරු සහ ලේඛන ලබා දෙමින් ඔවුන් සමග සහයෝගයෙන් කටයුතු කරන්න.
- අනෙක් සේවකයින් විසින් සාවද්‍ය හෝ ව්‍යාජනය කළ වාර්තා තබාගන්නා බවට හෝ ඔවුන් අරමුදල් අයථා ලෙස පරිහරණය කරන බවට විශ්වාස කිරීමට හේතු තිබේ නම් ඔබේ කළමනාකරු, ආරක්ෂක අධ්‍යක්ෂ, මූල්‍ය අධ්‍යක්ෂ හෝ ඔබේ දේශීය (Protector Line) වෙත වාර්තා කරන්න.
- ඔබ ගනුදෙනුකරුවන්ගේ තැන්පතු හෝ ඉහළ වටිනාකමකින් යුත් මුදල් ගනුදෙනු කටයුතුවලට සම්බන්ධ නම්, ඔබ මුදල් විශුද්ධිකරණය පිළිබඳ දැනුවත්භාවය පවත්වා ගැනීම සඳහා නිතිපතා පුහුණුව සම්පූර්ණ කරන බව තහවුරු කරගන්න.
- සැපයුම්කරුගේ විධිවිධානවල අනපේක්ෂිත වෙනස්වීම්, නිදසුනක් ලෙස, සැපයුම්කරු සිය බැංකු ගිණුම දන්නා බදු වාසස්ථානයකට ගෙන යාම,වටා ඇති අවදානම් පිළිබඳව සැලකිලිමත් වන්න. මෙය (Red Flag) විය හැකිය.

ප්‍රශ්න සහ පිළිතුරු

Q සාමාන්‍යයෙන් අපගේ ගබඩාවේ අපද්‍රව්‍ය වාර්තා කරන මගේ සාමාජියා වෙනුවෙන් මම රාජකාරි ආවරණය කරමි. මා විසින් සටහන් කර ඇති සංඛ්‍යා සාමාන්‍ය අගයට වඩා බෙහෙවින් අඩු බව මම නිරීක්ෂණය කළෙමි. මෙය ගැටලුවක්ද?

A **අපද්‍රව්‍ය අගයන් වෙනස් වීමට හේතු රාශියක් ඇත. ඔබට අපගේ ප්‍රතිපත්ති හා ක්‍රියාවලීන්ට අනුකූලව දත්ත වාර්තා නොකිරීම පිළිබඳව කිසියම් ආකාරයකින් ගැටළුවක් තිබේ නම්, පළමු අවස්ථාවේදීම ඔබේ කළමනාකරු සමග කතා කරන්න නැතහොත් (Protector Line) අමතන්න.**

Q ගනුදෙනුකරුවකුගේ ටෙස්කෝ බැංකු ගිණුමක් හරහා සාමාන්‍ය ගනුදෙනු වලට වඩා විශාල ප්‍රමාණයක් සිදුවන බව මම නිරීක්ෂණය කළෙමි. මම මෙය වාර්තා කළ යුතුද?

A **මුදල් විශුද්ධිකරණයට සම්බන්ධ බවට ඔබ විසින් සැක කරන ඕනෑම ක්‍රියාකාරකමක් වහාවාර්තා කිරීමට අවශ්‍ය වේ. මුදල් විශුද්ධිකරණ ගැටළුවාර්තා කිරීමට අසමත් වීමේ බරපතල ප්‍රතිවිපාක ඇත.**

Q මගේ නිත්‍ය ගනුදෙනුකරුවන්ගෙන් අයෙක් අසාමාන්‍ය ලෙස විශාල භාණ්ඩ ප්‍රමාණයක් සඳහා මුදල් ගෙවා ඇත. මා සැලකිලිමත් විය යුතුද?

A **ඔව්. මෙය සොයා බැලිය යුතු “Red Flags” වලින් එකකි. ඔබ ඔබේ කළමනාකරු සමග කතා කළ යුතුය.**

Q මම P8 හි ප්‍රවර්ධනයක් සිදු කරගෙන යන අතර සැපයුම්කරු පවුම් මිලියන 1 ක අරමුදල් සපයයි. ප්‍රවර්ධනය අනිවාර්යයෙන්ම සිදුවිය යුතු බැවින් මට වඩා කලින් කාලයක සිට ආදායම ගණනය කළ හැකිද?

A **සාමාන්‍ය ගිණුම්කරණ පරිචයට අනුව, ආදායම සටහන් කළ යුත්තේ ක්‍රියාකාරකම සිදුවන මූල්‍ය කාලය තුළදීය. එය P8 හි පමණක් සටහන් කළ යුතුය. තවත් තොරතුරු සඳහා ඔබේ මූල්‍ය කළමනාකරු සමග කතා කරන්න.**

Q සැපයුම්කරුවෙකු විය හැකි අයෙක් එහි හිමිකරුවන්ගේ අනන්‍යතාවය රහස්‍ය තොරතුරු යැයි කියමින් ඒවා හෙළි කිරීම ප්‍රතික්ෂේප කරයි. සියලුම පසුබිම් පරීක්ෂණ වලින් පෙනී යන්නේ ඒවා අපගෙන් බැහැර අධිකරණ බල ප්‍රදේශයක පිහිටි ආයතනයකට අයත් බවයි. මා කුමක් කරන්නේද?

A **මෙය Red Flags වන අතර ඔබ නීති කණ්ඩායමෙන් උපදෙස් හා මග පෙන්වීම ලබා ගත යුතුය. සමාගමක අග්‍රස්ථ අයිතිකරුවන්ගේ අනන්‍යතාවය සඟවන සංකීර්ණ හිමිකාරීත්ව ව්‍යුහයන් යනු අරමුදල් ප්‍රභවය සැඟවීමේ ක්‍රමයක් වන අතර එය මුදල් විශුද්ධිකරණය සඳහා භාවිතා කළ හැකිය.**



අපගේ තොරතුරු ආරක්ෂිතව තබා ගැනීම

එය ගැටළුවක් වන්නේ ඇයි?

තොරතුරු අපගේ සාර්ථකත්වයේ ප්‍රධාන දෙයක් වේ. තොරතුරු ඉක්මණින් හා ආරක්ෂිතව බෙදාගැනීමට හැකිවීම, අපට නියමිත වේලාවට ගබඩාවලට නිෂ්පාදන ලබා ගැනීමට, විකුණුම් දත්ත විශ්ලේෂණය කිරීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමට සහ ගනුදෙනුකරුවන්ව ඔවුන්ගේ බෙදා හැරීමේ තොරතුරු පිළිබඳ යාවත්කාලීනව තබා ගැනීමට අපට ඉඩ දෙයි.

ටෙස්කෝ තොරතුරු අපරාධකරුවන්ට සහ වංචාකරුවන්ට සැබෑ වටිනාකමක් සහිත වන බැවින් අපි සැලකිලිමත්ම තොරතුරු භාවිතා කිරීම සහ එය නැති කර නොගැනීම හෝ වැරදි ලෙස පරිහරණය කිරීම නොකිරීම වැදගත් වේ. පුද්ගලික උපාංග හරහා තොරතුරු වෙත පිවිසීමේදී හෝ පොදු Wi-Fi ජාලවලට සම්බන්ධ වීමේදී ඇතුළුව ටෙස්කෝ උපාංග සහ ටෙස්කෝ තොරතුරු නිවැරදිව හා ආරක්ෂිතව භාවිතා කරන ආකාරය තේරුම් ගැනීමට සියලු සාමාජිකයන්ට වගකීමක් ඇත.

ඒ වෙනුවෙන් මා කළ යුත්තේ කුමක්ද?

තොරතුරු සුරක්ෂිතව තබා ගැනීම

- සැමවිටම ශක්තිමත් මුරපද භාවිතා කරන්න. ඔබගේ මුරපදය තැනීමට ඔබට සම්බන්ධයක් නැති ශබ්දකෝෂ වචන හතරක් එකට භාවිතා කළ හැකිය. ඔබට මතක තබා ගත හැකි නමුත් අන් අයට අනුමාන කිරීමට අපහසු වචන තෝරාගන්න.
- කිසි විටෙකත් මුරපද, PIN හෝ බැංකු තොරතුරු වැනි වැදගත් තොරතුරු බෙදා නොගන්න.
- තොරතුරු සංවිධානාත්මකව, හඳුනාගත හැකි ලෙස සහ පිවිසිය හැකි ලෙස තබා ගන්න.
- තොරතුරු රඳවා තබා ගැනීම හෝ මැකීම පිළිබඳ අවශ්‍යතා කිසිවක් පිළිබඳව දැනුවත් වී ඊට ගරු කරන්න.
- රාජකාරි කටයුතු සඳහා පුද්ගලික විද්‍යුත් තැපැල් ගිණුම් භාවිතා නොකරන්න.
- ලේඛන හුවමාරු කිරීමට සාමාජිකයන්ට නම් කරන ලද පුද්ගලයින්ට ප්‍රවේශය ලබාදිය හැකි, ටෙස්කෝ අනුමත කළ ඔබේ OneDrive භාවිතා කරන්න.
- අනුමත නොකළ හෝ පොදු ගොනු හුවමාරු කිරීමේ වෙබ් අඩවි උදා. Dropbox, Google Drive භාවිතා නොකරන්න.
- සංවේදී තොරතුරු ආරක්ෂිතව තබා ගෙන ආරක්ෂාකාරීව බෙදා හැර කිරීම මගින් ඒවා සැලකිල්ලෙන් කළමනාකරණය කරන්න. තොරතුරු හෙළි කිරීම සුදුසු සහ ආරක්ෂිත නම් මිස එසේ නොකරන්න.
- තොරතුරු ආරක්ෂා දැනුවත් කිරීමේ පුහුණුව සියලු සාමාජිකයන් සඳහා අනිවාර්ය වේ. ඔබට පවරා ඇති සියලුම පුහුණු කාලීන ආකාරයකින් සම්පූර්ණ කිරීමට වග බලා ගන්න.
- දත්ත උල්ලංඝනයක් සිදුවී ඇතැයි ඔබ සැක කරන්නේ නම් වහාම හඬ අවදි කරන්න. රහස්‍යතා ද්වාරයේ ඇති මාර්ගෝපදේශය අනුගමනය කරන්න (නැතහොත් ද්වාරයක් නොමැති නම් ඔබේ දේශීය රහස්‍යතා කණ්ඩායම අමතන්න).

තොරතුරු තාක්ෂණ උපකරණ සහ පහසුකම් භාවිතා කිරීම

- වරදකාරී, වෙනස් කොට සලකන, නීති විරෝධී හෝ වෙනත් ටෙස්කෝ ප්‍රතිපත්තියක් උල්ලංඝනය කිරීමක් ලෙස සැලකිය හැකි ඕනෑම දෙයක් නිර්මාණය කිරීමට, භාවිතා කිරීමට හෝ බෙදා හැරීමට ටෙස්කෝ ලැප්ටොප්, ජංගම උපාංග, පද්ධති හෝ ජාල භාවිතා නොකරන්න.
- මන්දගාමී පරිගණක, නිරන්තර බිඳ වැටීම, උත්පතන සහ අසාමාන්‍ය හැසිරීම් ඇතුළු අනිෂ්ට මෘදුකාංගවල සලකුණු ගැන නිතරම විමසිල්ලෙන් සිටින්න.

මට තවත් දේ සොයාගත හැක්කේ කොතැනින්ද?

- තාක්ෂණ අවදානම් සහ අනුකූලතා කණ්ඩායම හෝ දේශීය තොරතුරු ආරක්ෂක කණ්ඩායම
- පිළිගත හැකි භාවිත ප්‍රතිපත්තිය

ප්‍රශ්න සහ පිළිතුරු

Q මට අනිෂ්ට මෘදුකාංගයක් අඩංගු විය හැකි යැයි මා විශ්වාස කරන සබැඳි ඇතුලත් විද්‍යුත් තැපැල් පණිවුඩයක් එවන ලදී. මම අහම්බෙන් සබැඳිය ක්ලික් කළහොත් මා කළ යුත්තේ කුමක්ද?

A ඔබ දන්නා ප්‍රභවයන්ගෙන් ලැබෙන විද්‍යුත් තැපැල් පමණක් විවෘත කළ යුතු අතර කිසිදා ඔබට නුහුරු හෝ සැක සහිත යැයි පෙනෙන සබැඳි හෝ විවෘත ඇමුණුම් මත ක්ලික් නොකළ යුතුය.

ඔබේ ටෙස්කෝ පරිගණකයට අනිෂ්ට මෘදුකාංගය ආසාදනය වී ඇති බවට ඔබ සැක කරන්නේ නම්, information.security@tesco.com වෙත විද්‍යුත් තැපෑලක් එවීමෙන් වහාම 24/7 (Protector Line) මෙහෙයුම් මධ්‍යස්ථානයට එය වාර්තා කරන්න. එය තතුබාන විද්‍යුත් තැපෑලක් බව ඔබ සලක න්නේ නම්, එය mailto:phishing@tesco.com වෙත එවීමෙන් වහාම වාර්තා කර ඉන්පසු විද්‍යුත් තැපෑල මකන්න.

Q නිවසේ සිට වැඩ කරන සාමාජිකයකු යැයි සඳහන් කළ අයෙකුගෙන් මට ඇමතුමක් ලැබුණි. සිය රාජකාරී නොවන විද්‍යුත් තැපෑලට ගොනු කිහිපයක් එවන ලෙස මගෙන් ඔවුන් ඉල්ලා සිටියේය? මට මෙය කළ හැකිද?

A නැත. පුද්ගලික විද්‍යුත් තැපැල් ලිපිනයක් ආරක්ෂිත නොවිය හැකි බැවින් ඔබ කිසි විටෙකත් එයට කිසිදු තොරතුරක් නොයැවිය යුතුය. අපගේ තොරතුරු ඉතා වටිනා අතර ඒවා සොරකම් කිරීමෙන් හෝ අනවසර පුද්ගලයින්ට අනාවරණය වීමෙන් වැළැක්වීම සඳහා ඒවා යැවීමට පෙර ඔබ සැමවිටම සැලකිලිමත් විය යුතුය. සංවේදී දත්ත යවන විට, ගොනු මුරපද වලින් ආරක්ෂා කර ඇති බව ඔබ තහවුරු කළ යුතුය.

Q ගෙදර යෑමට ඇති හදිස්සිය නිසා මම මගේ ලැප්ටොප් පරිගණකය දුම්රියේ දමා ගිය අතර එය සොයාගෙන නැත. මා කළ යුත්තේ කුමක්ද?

A ඔබ වහාම ඔබේ කළමණාකරු වෙත නැතිවීම වාර්තා කළ යුතු අතර කාර්යාල සහය මධ්‍යස්ථානයේ ටිකට් පතක් සටහන් කළ යුතුය.

Q රහස්‍ය හෝ ව්‍යාපාර සංවේදී තොරතුරු මවිසින් බැහැර කළ යුත්තේ කෙසේද?

A එය ඉරා දැමීමේ යන්ත්‍රයකට දමන්න නැතහොත් රහසිගත අපද්‍රව්‍ය බෑගයක/බඳුනක බහාලන්න.

Q මෙසේ පවසන ඇමතුමකට මා ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේද? "හෙලෝ, මේ තොරතුරු තාක්ෂණ උපකාර අංශයේ පෝල්. ඔබේ පරිගණකයට වෛරසයක් ආසාදනය වී ඇති අතර, අපි වහාම විසඳුමක් යෙදිය යුතුය. මට ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනය, පරිශීලක හැඳුනුම සහ මුරපදය තහවුරු කළ හැකිද, එවිට මට එය දුරස්ථව නිරාකරණය කළ හැකියි?"

A ඔබ ඔබේ මුරපදය කිසිවෙකු සමග, උපකාර අංශය සමග පවා හුවමාරු කර නොගත යුතුය. එමෙන්ම, යමෙකුට යම් තොරතුරක් ලබා දීමට පෙර, ඔබට එය ඉල්ලන්නේ කවුරුන්ද යන්න තහවුරු කර ගත හැකි බවට වග බලා ගන්න. සමාජ ඉංජිනේරු ප්‍රහාර ගැන සැලකිලිමත් වන්න - මේවා මිනිසුන් ලවා නොකළ යුතු තොරතුරු ලබාදෙන ලෙස ඔවුන්ව පොළඹවන ක්‍රම වේ. සමාජ ඉංජිනේරුවන් මෙය සිදු කිරීමට විවිධ ක්‍රම, එනම් දුරකථන ඇමතුම්, පුද්ගලිකව සහ විද්‍යුත් ක්‍රම (උදා: විද්‍යුත් තැපෑල/කෙටි පණිවුඩ) භාවිතා කරයි.

බාහිර සන්නිවේදන සහ සමාජ මාධ්‍ය භාවිතා කිරීම

එය වැටළුවක් වන්නේ ඇයි?

අපි අපගේ ව්‍යාපාරය සඳහා අන්තර්ජාලයෙන් ලබා දෙන බොහෝ වාසි සහ අවස්ථාවන් ජය ගනිමු. සමාජ ජාල සහ සබැඳි ප්‍රජා භාවිතා කිරීම පුද්ගලයන් වශයෙන් සහ වෙළෙඳාමක් ලෙස අප කරන්න දෙය සාමාජිකයන්, ගනුදෙනුකරුවන් හෝ වෙනත් ප්‍රධාන පාර්ශවකරුවන්ට සන්නිවේදනය කිරීම සඳහා අපට විශාල ප්‍රතිලාභ ලබා දෙයි.

ටෙස්කෝ පිළිබඳ ප්‍රවෘත්ති ඉක්මනින් ගමන් කරන අතර මාධ්‍ය සහ අපගේ තරඟකරුවන් අප ගැන තොරතුරු සෙවීමට නිරන්තරයෙන් අන්තර්ජාලය පීරති. ඕනෑම ආකාරයකින් වැරදි තොරතුරු ප්‍රසිද්ධ වුවහොත්, එය අපගේ කීර්ති නාමයට, අපගේ තරඟකාරිත්වයට හා අපගේ පාරිභෝගිකයන් අප කෙරෙහි තබා ඇති විශ්වාසයට හානි කළ හැකිය. වැරදි තොරතුරු මගින් ටෙස්කෝ සන්නාමය සහ සාමාජිකයන් නීතිමය ක්‍රියා මාර්ගවලට ලක්වීමේ අවදානමට ලක් කළ හැකිය.

ඒ වෙනුවෙන් මා කළ යුත්තේ කුමක්ද?

ටෙස්කෝ සාමාජිකයකු ලෙස ඔබ ව්‍යාපාරය නියෝජනය කරයි. ඔබ ටෙස්කෝ ගැන කතා කරන විට සෑම විටම සාමාන්‍ය බුද්ධිය භාවිතා කරන්න සහ කිසි විටෙකත් වැරදි හෝ වරදකාරී කරුණු දැක්වීම, අදහස් දැක්වීම, පින්තූර හෝ සබැඳි පළ කිරීමෙන් වළකින්න. ඔබේ රාජකාරිය සහ සාමාජිකයන් ගැන සැමවිටම ගෞරවයෙන් යුතුව හා ධනාත්මක වීමට අරමුණු කරන්න. කථාවකදී හෝ සමුළුවකදී ඔබ ප්‍රසිද්ධියේ පවසන, මාධ්‍යවේදීන්ට පවසන හෝ සමාජ මාධ්‍යවල ලියන දෙය වෙළඳ නාමයට හානි කළ හැකි අතර ඒ අනුව ඔබගේ සේවා පරිසරයට අහිතකර ලෙස බලපෑමට හැකි බව මතක තබාගන්න.

අපගේ සමාජ මාධ්‍ය ප්‍රතිපත්තිය මාර්ගගත සන්නිවේදනය සඳහා අපගේ ප්‍රවේශය දක්වා ඇති අතර එය ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් වටා ගොඩනගා ඇත:

1. සත්‍යවාදී වන්න - අපගේ ව්‍යාපාර සාරධර්ම අනුව ජීවත් වන්න සහ විශ්වාස කටයුතු වන්න. ඔබ ටෙස්කෝ සාමාජිකයකු ලෙස හඳුන්වා දී කරුණාකර ඔබේ පැතිකඩෙහි 'සියලු අදහස් මගේ ය' යනුවෙන් සඳහන් කරන්න. අන්වර්ථ නාමයක් භාවිතා කිරීමෙන් හෝ සමාගම සමග ඔබේ සම්බන්ධතාවය ගැන මිනිසුන් නොමග යැවීමෙන් වළකින්න.

2. සැලකිලිමත් වන්න – ඔබ අන්තර්ජාලයේ පළ කරන සෑම දෙයක්ම ප්‍රසිද්ධ බවත් මාධ්‍ය සහ තරඟකරුවන් ඒවා බලා සිටින බවත් මතක තබා ගන්න.

3. සිතන්න – ඔබ හුවමාරු කරගන්නා අන්තර්ගතය සම්බන්ධයෙන් වගකියන්න. ඔබගේ පළ කිරීම් නිවැරදි බවත්, නොමග යවන හෝ හානිදායක නොවන බවත් තහවුරු කරගෙන, සමාගමේ රහසිගත තොරතුරු හෙළි නොකිරීමට වගබලා ගන්න.

4. පිළිගන්න – ප්‍රකාශන අයිතියට ගරු කරන්න සහ ලැබිය යුතු තැනට ප්‍රශංසාව ලබා දෙන්න. වෙනත් අයෙකු විසින් නිර්මාණය කරන ලද , රූප හෝ වීඩියෝ ඔවුන්ට ප්‍රශංසාව ලබා නොදී පළ කිරීමෙන් වළකින්න. පළමුව පුවත්පත් කාර්යාලය හා ඔබේ ප්‍රාදේශීය රහස්‍යතා කණ්ඩායම හා සම්බන්ධ වීමෙන් තොරව මාධ්‍යවේදීන්ට CCTV හෝ කැමරා දුරකථන මගින් ලබාගත් වීඩියෝ ලබා නොදෙන්න.

මාධ්‍යවේදීන් සමග කටයුතු කිරීම

කතාව දේශීය, කලාපීය, ජාතික හෝ ජාත්‍යන්තර වුවත්, සියලු විමසීම් ටෙස්කෝ මාධ්‍ය කණ්ඩායමට යොමු කරන්න. ප්‍රතිචාර කළමනාකරණය කිරීමට, රූගත කිරීම් හෝ ගුවන් විදුලි ඉල්ලීම් සම්බන්ධීකරණය කිරීමට සහ නීත්‍යානුකූලව සිටීමට ඔබට උදව් කිරීමට ඔවුන්ට හැකිවනු ඇත. ටෙස්කෝ හරහා ස්ථාවර හා යාවත්කාලීන පණිවුඩයක් ලබා දීමට මෙය අපට උපකාරී වේ.

ප්‍රශ්න සහ පිළිතුරු

Q සාමාජිකයකු සමාජ මාධ්‍යවල නුසුදුසු ප්‍රකාශ කරන උදාහරණයක් මම දැක ඇත්තෙමි – මා කුමක් කළ යුතුද?

A **සමාජ මාධ්‍ය මාර්ගෝපදේශයන්ට එරෙහිව ඔබ දැක ඇතිදේ පරීක්ෂා කරන්න. අතථ්‍ය ලෝකයේ පළ කළ 'සැබෑ ලෝකයේ' අදහස් අපගේ අගයන් පිළිබිඹු කළ යුතුය. ඔබට තවමත් ගැටළු ඇත්නම් නම්, කරුණාකර ඔබේ කළමනාකරු සමග කතා කරන්න නැතහොත් ඔබේ දේශීය ආයතනික කටයුතු කණ්ඩායම හෝ සමූහයේ සන්නිවේදන කණ්ඩායම අමතන්න.**

Q මම ටෙස්කෝ ගැන රසවත් ලිපි, ට්විටර් ලිපි සහ ෆේස්බුක් සටහන් රැසක් දකිමි. මට මේවා බාහිරව මාර්ගගතව පළ කිරීමට හෝ මිතුරන්ට සහ පවුලේ අයට යැවීමට හැකිද?

A **පණිවුඩය ධනාත්මක නම් එසේ කළ හැකිය, නමුත් ඔබ භාවිතා කරන තොරතුරු බෙදා ගැනීමට සුදුසු ද නැතිනම් අභ්‍යන්තර භාවිතය සඳහා පමණක්දැයි සිතා බලන්න. එමෙන්ම එය "ව්‍යාජ ප්‍රවෘත්තියක්" ද යන්න ද සලකා බලන්න. සාමාන්‍ය ජනතාව සඳහා වන තොරතුරු පමණක් බෙදා ගන්න. ස්වර්ණමය රීතිය මතක තබා ගන්න: ධනාත්මකව පළ කරන්න.**

Q මම ටෙස්කෝ වෙබ් අඩවියක් සහ සමාජ මාධ්‍ය නාලිකාවක් (උදා: ටෙස්කෝ ෆේස්බුක් හෝ ට්විටර්) කළමනාකරණය කරමි. මට ටෙස්කෝ පිළිබඳ සංඛ්‍යාලේඛන හා සංඛ්‍යා ප්‍රසිද්ධ කළ හැකිද?

A **ඔව්, නමුත් සංඛ්‍යාලේඛන හෝ සංඛ්‍යා නිවැරදි බව සහ දැනටමත් Common Drive තුළ ඇති බවත් පරීක්ෂා කරන්න. ටෙස්කෝ PLC. වෙබ් අඩවියේ මූල්‍ය සහ ප්‍රජා වැඩසටහන් දත්ත ඇතුළු නවතම සාමූහික අනාවරණ ඇත. හැකි නම්, අදාළ ටෙස්කෝ PLC. පිටුවට ද සබැඳියක් (Link) සපයන්න. ටෙස්කෝ PLC. වෙබ් අඩවියේ ඇති ඒවා හැරුණු විට විකුණුම් සංඛ්‍යා පිළිබඳ දත්ත බෙදාගැනීමෙන් වළකින්න.**

Q අපගේ නව මත්පැන් බලපත්‍රයේ බලපෑම පිළිබඳ ලිපියක් පළ කිරීමට අවශ්‍ය බැවින් දේශීය පුවත්පත දැන් ඇමතුමක් දී ඇත. ඔවුන් සමග කතා කිරීම නිවැරදි ද?

A **ඔබ පළමු අවස්ථාවේ දී ඒවා ටෙස්කෝ මාධ්‍ය කාර්යාලයට යොමු කළ යුතු අතර, පසුව දේශීය පුවත්පතට කථා කළ යුත්තේ කවුරුන්ද යන්නට එකඟ විය යුතුය.**

Q ටෙස්කෝ ගැන ප්‍රසිද්ධියේ කතා කරන ලෙස මගෙන් ඉල්ලා ඇත. ආරාධනය පිළිගැනීම නිවැරදි ද?

A **කිසිදු ආරාධනයක් පිළිගැනීමට පෙර, ඔබ ඔබේ ව්‍යාපාර නායකයා සමග සාකච්ඡා කර ඉන්පසු කණ්ඩායම් සන්නිවේදන කණ්ඩායම හෝ දේශීය ආයතනික කටයුතු කණ්ඩායම ඇමතීමට අවශ්‍ය වේ. ඔබේ ප්‍රේක්ෂකයන්ට නිවැරදි පණිවුඩ සන්නිවේදනය කිරීම සහ කීර්ති නාමයට සිදුවන අවදානම් වළක්වා ගැනීම පිළිබඳව ඔබට උපදෙස් දීමට ඔවුන්ට හැකිවනු ඇත. ආරාධනා ටෙස්කෝට ප්‍රයෝජනවත් විය යුතු අතර ඉදිරිපත් කිරීම්වල නව, රහස්‍ය හෝ වාණිජමය වශයෙන් සංවේදී ප්‍රවෘත්ති කිසිවක් අඩංගු නොවිය යුතුය.**

මට තවත් දේ සොයාගත හැක්කේ කොතැනින්ද?

- සමූහයේ සන්නිවේදන කණ්ඩායම හෝ දේශීය සන්නිවේදන කණ්ඩායම
- මාධ්‍ය කණ්ඩායම
- ආයතනික කටයුතු කණ්ඩායම
- සමාජ මාධ්‍ය ප්‍රතිපත්තිය
- සීසීටීවී ප්‍රවේශය සහ අනාවරණ සඳහා වන ඉල්ලීම් පිළිබඳ මාර්ගෝපදේශය

අපේ අගයන්

අපට ගැනීමට අපහසු තීරණ ඇති විට
අපගේ අගයන් අපට මග පෙන්වයි. අපගේ
අගයන් අනුගමනය කිරීමෙන් අපට
නිවැරදි දේ කිරීමට සහතික විය හැකිය.

"අපගේ පාරිභෝගිකයන් වෙනුවෙන් අප තරම් වෙහෙසවෙන කිසිවෙකුත් නොමැත"

සෑම කුඩා උපකාරයක්ම විශාල වෙනසක් කරයි

අපි සෑම කෙනෙකුම ඔවුන් සැලකුම් ලැබීමට කැමති ආකාරයට සලකමු



අපගේ සහ නායකත්ව හැසිරීම්

නවෝත්පාදනය

නව අදහස් සඳහා විවෘතව සිටීම

- කුතුහලයෙන් සිටීම සහ නව චින්තනයට මාරුවීම.
- ඉදිරිය බලා අනාගතය සාදරයෙන් පිළිගැනීම.
- විශාල වෙනසක් ඇති කරන කුඩා පියවර ගැනීම.

සහයෝගිත්වය

එක්ව වඩා හොඳින් කටයුතු කිරීම

- බැහැරට ගොස් ජනතාව සමග සම්බන්ධතා ඇති කර ගැනීම.
- කණ්ඩායමක් ලෙස වැඩ කිරීම සහ ඒකාබද්ධ සාර්ථකත්වය බෙදාගැනීම.
- දේවල් සරලව තබා ගැනීමට අන් අය සමග හවුල්වීම.

සහකම්පනය

මිනිසුන්ට මුල් තැන දීම

- අව්‍යාජ, විශ්වාසදායක සහ ප්‍රයෝජනවත් සබඳතා ගොඩනංවා ගැනීම.
- අන් අය බැලීමට, ඇහුම්කන් දීමට සහ හඳුනා ගැනීමට කාලය ගැනීම.
- එකිනෙකාට උපකාර කිරීමේදී අපගේ විශාලතම ශක්තිය වන්නේ අපගේ වෙනස්කම් බව තේරුම් ගැනීම.

ප්‍රත්‍යාස්ථිතිය

ඔබට හැකි උපරිමය ඉටු කිරීම

- ඔබට හොඳම තත්වයෙන් සිටීමට හැකි වන පරිදි ඔබ ගැන බලා ගැනීම.
- ඔබ අවට ඇති ධනාත්මක දේ බැලීමට තේරීම සිදු කිරීම.
- කටයුතු දුෂ්කර වූ විට ප්‍රතිචාර දැක්විය යුතු ආකාරය දැන ගැනීම.

ප්‍රතිචාරාත්මක බව

සූදානම්ව සිටීම

- අනපේක්ෂිත ලෝකයක් තුළ අභියෝග පිළිගැනීම.
- නිර්භීතවීම, මැනිය හැකි අවදානමක් ගෙන එහි ප්‍රතිඵල වලින් ඉගෙනීම.
- පිළිතුර සුපැහැදිලි එකක් නොවුනත් තීරණ ගැනීම.

2018 දෙසැම්බර්. apecreative.com විසින් නිර්මාණය කරන ලදී.

අපගේ සාමාජිකයන් සහ අපගේ ව්‍යාපාරය ආරක්ෂා කිරීම.

TESCO